72 වන කාණ්ඩය
8 වන කලාපය

සඳුදා
1967 ජූලි 24

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් : [තී. 1210]
නිදහස් නීති අධ්‍යාපන හා නීති වෘත්තීය (විශෙෂ විධාන) පනත් කෙටුම්පත.
රජයේ නීති ආධාර පනත් කෙටුම්පත් : [ප්‍රින්ස් ගුණසේකර මයා.]
පළමුවන වර කියවන ලදී.

පරිපූරක මුදල [තී. 1219]

උසස් අධ්‍යාපන පනත : ආඥාව [තී. 1227]

කල් තැබීමේ යෝජනාව [තී. 1363]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 72
இல. 8

திங்கட்கிழமை
24 ஜுலை 1967

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

முதல் மதிப்பிடம் பெற்ற தனியங்கத்தினர் மசோதாக்கள் [ப. 1210] :
නිදහස් නීති අධ්‍යාපන හා නීති වෘත්තීය (විශේෂ විධාන) පනත් කෙටුම්පත
රජයේ නීති ආධාර පනත් කෙටුම්පත—[திரு. பிறின்ஸ் குணசேக்கர]

குறைநிரப்புத் தொகை [ப. 1219]

உயர் கல்விச் சட்டம் : கட்டளை [ப. 1227]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1363]

---

Volume 72
No. 8

Monday,
24th July 1967

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

PRIVATE MEMBERS' BILLS READ THE FIRST TIME [Col. 1210]:
නිදහස් නීති අධ්‍යාපන හා නීති වෘත්තීය (විශේෂ විධාන) පනත් කෙටුම්පත
රජයේ නීති ආධාර පනත් කෙටුම්පත—[Mr. Prins Gunasekera]

SUPPLEMENTARY SUPPLY [Col. 1219]

HIGHER EDUCATION ACT : Order [Col. 1227]

ADJOURNMENT MOTION [Col. 1363]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

1967 ජූලි 24 වන සඳුදා

*திங்கட்கிழமை, 24 ஜூலை 1967*

*Monday, 24th July 1967*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [සී. එස්. ෂර්ලි කොරයා මහතා] මූලාසනාරූඪ විය.**

*சபை, பி.ப. 2 மணிக்குக் கூடியது. உபசபாநாயகர் அவர்கள் [கௌரவ சீ. எஸ். ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at* 2 P.M., MR. DEPUTY SPEAKER [MR. C. S. SHIRLEY COREA] *in the Chair.*

---

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

*சபை அமர்வு*

## SITTINGS OF THE HOUSE

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*

(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

I move,

"That this House at its rising this day do adjourn until 2 P.M. on Tuesday, 25th July 1967."

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රීන්ගේ කෙටුම්පත් පණත්

## *தனி அங்கத்தவர் மசோதாக்கள்*

## PRIVATE MEMBERS' BILLS

# නිදහස් නීති අධ්‍යාපන හා නීති වෘත්තිය (විශේෂ විධාන) පනත් කෙටුම්පත

**ප්‍රින්ස් ගුණසේකර මයා. (හබරාදූව)**

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபராதுவ)*

(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෙටුම්පත් පණත් දෙකක් ඉදිරිපත් කිරීමේ අවසරය පතාසි මා නැගී සිටියේ. ඒවා ඉදිරිපත් කරන්නට පෙර එහි පරමාර්ථයන් ඔබතුමාත් මෙම ගරු සභාවත් හමුවෙහි ඉතා කෙටියෙන් වචන කීපයෙකින් ප්‍රකාශ කරන්නට මා අදහස් කරනවා. මුල් පණත හැඳින්වීම සඳහා වචන කීපයක් කථා කොට දෙවැනි පණතේ පරමාර්ථ පමණක් කෙටියෙන් සඳහන් කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

මේ, මීට අවුරුද්දකට පෙර වරක් මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව, පාර්ලිමේන්තුව කල් තැබීමේ හේතුවෙන් අහෝසි වුණු පණත් දෙකක් බව ඔබතුමාට මතක ඇති. මෙම පණත් දෙකට ඇතුළත් කරුණු රටේ නඩු කියන්නන් කෙරෙහිත් දුප්පත් නීති ශිෂ්‍යයින් කෙරෙහිත් බල පවත්වන නිසා එම කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලෙස කලින් මෙම පණත් ඉදිරිපත් කළ අවස්ථාවේදී මා ගරු අධිකරණ උප ඇමතිතුමාගෙන් විශෙෂයෙන් ඉල්ලා සිටියා. ඊට පසුව, මෙම පණත් දෙකට මොනවා වුණාදැයි ඒ උප ඇමතිතුමාගෙන් මා විමසූ අවස්ථාවකදී, පාර්ලිමේන්තුව කල් තැබීමට පෙර මෙම පණත් මන්ත්‍රී මණ්ඩලය හමුවෙහි විවාදයට පාත්‍ර කරන බවට එතුමා පොරොන්දුවක් වූ බවත් ඔබතුමාට මතක ඇති. එහෙත් පාර්ලිමේන්තුව කල් තබන්නට පෙර ඒ පොරොන්දුව ඉෂ්ට වුණේ නැහැ. ඒ නිසා අපගේ ස්ථාවර අනාඥාත් යටතේ මෙම පණත් දෙකම අහෝසි වුණා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මෙම පණත් දෙක මා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු දවසේ ඒ පිළිබඳව රටවැසියාට කිසියම් අවබෝධයක් ලබා දුන් සිංහල, දෙමළ ප්‍රවෘත්ති පත්‍රවලට මගේ කෘතඥතාව මේ අවස්ථාවේදී පළමු කොටම පිරිනැමිය යුතුයි. මෙම පණත් දෙකේ පරමාර්ථයන් මහජනයාට හඳුන්වා දී ඒවා ක්‍රියාවේ යෙදුණහොත් එයින් යහපතක් සිදු වන්නේ කාටද, දැනට උසුලන්නට සිදුවී තිබෙන බරින් මහජනතාව මුදා ගත හැක්කේ කෙසේද, නඩු කියන්නවුනට දැන් මුහුණ පාන්නට සිදුවී තිබෙන දුෂ්කරතා මඟහරවා ගන්නේ කෙසේද යනාදී වශයෙන් මේ පිළිබඳ යථා තත්ත්වය රටට අවබෝධ කර දුන් පුවත් පත් රාශියක් ඒ දිනවල මෙම පණත් ගැන විස්තර පළ කළා. ඒ හැම ප්‍රවෘත්තියක්ම මෙහිදී කියවන්නට මා අදහස් කරන්නේ නැහැ. "ලංකාදීප", "දවස", "ජනතා", "දිනමිණ", "සිළුමිණ" ආදී සෑම පත්‍රයෙකම මෙම පණත් පිළිබඳ පුවත පළ වුණා. එයින් එක් පත්‍රයකින් පමණක් කොටසක් ඉදිරිපත් කරන්නට මා අදහස් කරනවා. මෙම පණත් දෙක මහජනතාවට හඳුන්වා දෙමින්, 1966 නොවැම්බර් මස 11 වන දින "සිළුමිණ" පත්තරයේ දේශපාලන ලියුම්කරු විසින් පළ කරන ලද ලිපියෙන් කොටසක් දැන් මා කියවනවා. ඒ ලිපිය පටන්ගෙන තිබෙන්නේ "සිංහලෙන් පනත් ඉදිරිපත් කොට දැක්වූ ආදර්ශය" නමැති ශීර්ෂය පාඨය යටතේයි. එහි මේ විධියට සඳහන් වෙනවා :

"1966 නොවැම්බර් 9 වැනි බදාදා ලංකා ඉතිහාසයේ රන් අකුරින් ලියැවිය යුතු දිනයෙකි. ලංකාවේ බහුතර ජනතාවගේ සිතුම් පැතුම් ක්‍රියාත්මක වීමේ තවත් එක් පියවරක් තැබූ දිනයක් හැටියට එම දිනය අමරණීය වනු ඇත.

මැති සබයේ ඉතිහාසයේ පළමු වරට ලංකාවේ බහුතර ජනතාවගේ බස වන සිංහලයෙන් පනතක් ඉදිරිපත් වූයේ 9 වැනි බදාදා යි.

නිදහය ලබා අටලොස් අවුරුද්දක් ගෙවුණු පසුත් සිංහලය රජයේ බස වී දස අවුරුද්දක් ගෙවුණු පසුත් අධිරාජ්‍යවාදී පාලන බසින්ම නිදහස් ලංකාවේ අණපනත් ඉදිරිපත් කරන්නට සිදු වී තිබීමේ අභාග්‍යය නොවැම්බර් 9 වැනිදා බිඳ දැමීමට ඉදිරිපත් වීම ගැන ස්වාධීන සමාජවාදී මන්ත්‍රීවරයකු වන හබරාදුව මන්ත්‍රී ප්‍රින්ස් ගුණසේකර මහතා ලංකාවේ බහුතර ජනතාවගේ අප්‍රමාණ ආදරයට පාත්‍ර වනු නො අනුමානය."

තවත් විස්තර වගයක් පෞද්ගලික වශයෙන් තිබෙනවා. ඒවා මා කියවන්නට කැමති නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි අදහස මෙයයි. එදින එක්තරා ඓතිහාසික සිද්ධියක් සිදු වුණා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවෙනි වරට සිංහලෙන් කෙටුම්පත් කොට, සිංහලෙන් ඉදිරිපත් කළ පනතක් එදායි, පාර්ලිමේන්තු සභා ගර්භය ඉදිරියට පැමිණියේ. මේ සිද්ධීන් ගැන "සවස" පත්‍රය හා තවත් දිනපතා පුවත්පත් රාශියක්ම කරුණු ගෙන හැර දැක්කුවා. ඒ හැම දෙයක්ම මේ අවස්ථාවේ දී මා කියවන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. පනතේ පරමාර්ථයන් ගැන කියන්නට පෙර තමුන්නාන්සේගේ අවධානය යොමු වීම සඳහා එයින් එකක් ගැන පමණක් සඳහන් කරන්නට අදහස් කරනවා.

අපේ ස්ථාවර අණ පනත් යටතේ පෞද්ගලික මන්ත්‍රීවරයකුට කිසියම් පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට අයිතිය තිබෙනවා. එසේ ඉදිරිපත් කිරීමට පෙර කිසියම් ක්‍රියාමාර්ගයන් වගයක් අනුගමනය කරන්නට තිබෙනවා. රජයේ ගැසට් පත්‍රයේත්, රටේ පළවන අනිකුත් ප්‍රවෘත්ති පත්‍ර කිසියම් ගණනකත් දැන්වීම් පළ කර ඒ පනත පිළිබඳව මහජනයාට දැන්වීමකින් පසුව තමයි, මන්ත්‍රී මණ්ඩලය හමුවට ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නට පුළුවන් වෙන්නේ. ඒ කාරණයේදී පෞද්ගලික මන්ත්‍රීවරයාට සෑහෙන වියදමක් දරන්නට සිදු වෙනවා. මේ පනත සම්බන්ධයෙන් මට දෙවරක් වියදම් දරන්ට සිද්ධ වුණා. මම කියන්නේ ඒ වියදම් දරන්නට සිදුවීම ගැන නොවෙයි; ඊට පසු ඇති වන තත්ත්වය ගැනයි. එබඳු වියදම් දැරීමෙන් පසුව, දැන්වීම් පළ කිරීමෙන් පසුව, පනත් කෙටුම්පත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කළායින් පසුව ඒ පනත ගැන කිසිම දෙයක් කිරීමට ඒ පනත ඉදිරිපත් කළ පෞද්ගලික මන්ත්‍රීවරයාට කිසිම අයිතිවාසිකමක් නැතිව යනවා. ඒ පනත පිළිබඳ සම්පූර්ණ අයිතිය ඊළඟට පැවරෙන්නේ ඒ විෂයය භාර ඇමතිතුමාට හෝ පාර්ලිමේන්තු ලේකම් තුමාටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මං තමුන්නාන්සේගේ අවධානය යොමු කරවන්ට බලාපොරොත්තු වෙන්නේ මෙන්න මේ කාරණය ගැනයි. අපේ ස්ථාවර අණ පනත් දැනට පවත්නා විධියට කිසියම් හේතුවක් නිසා ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් නොකිරීමට අදහස් කළොත් යළිත් සිදු වෙන්නේ මේ පනතට පසුගිය වාරයේ සිදු වූ දෙයමයි. ඒ නිසා එවැනි තත්ත්වයක් පැන නොනැඟීමට අපේ ස්ථාවර අණ පනත් වෙනස් කළ යුතුයි. මේ පනත් කෙටුම්පත් ගැන වාර්තා කොට දෙවෙනි වර කියවීම සඳහා ඉදිරිපත් කිරීමට කිසියම් හේතුවක් නිසා රජය අදහස් නොකරනවා නම්, පිට පිටම දෙවරක් හෝ තුන් වරක් රජය ඒ අන් දමට ප්‍රතික්ෂේප කළායින් පසුව, ඒ පනත් කෙටුම්පත් දෙවෙනි වර කියවීම සඳහා තමන්ගේම කැමැත්තෙන් මන්ත්‍රී මණ්ඩලය ඉදිරියට ගෙනෙන්නට පෞද්ගලික මන්ත්‍රීවරුන්ට අයිතිය තිබෙන්න ඕනෑ. මේ මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කරන වෙනත් පනත් කෙටුම්පත් කෙරෙහි එවැනි කොන්දේසි බල පානවා. මුදල් පිළිබඳ පනත් කෙටුම්පත් ගැන ඔබතුමා දන්නවා ඇති. මුදල් පිළිබඳ පනත් කෙටුම්පතක් මහජන මන්ත්‍රී මණ්ඩලය සම්මත කර එය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට යැවූ පසු යම් විධියකින් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය එය සම්මත නොකර ආපසු එව්වාය කියා සිතමු. පිට පිට තුන් වරක් එය සිදු වුණොත් සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ සම්මතිය නැතිව ඒ පනත් කෙටුම්පත සම්මත කර ගන්නට නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට බලතල තිබෙනවා. ඒ විධියට පෞද්ගලික මන්ත්‍රීවරයකුටත්, මේවැනි වියදමක් දරාගෙන තමන් වැදගත්ය කියා අදහස් කර ඉදිරිපත් කරන පනත් කෙටුම්පතක් වරක් දෙවරක් හෝ තුන් වරක් ඒ විෂය පිළිබඳ වගකීම දරණ ඇමතිවරයා ඉදිරිපත් නොකරනවා නම් ඒ පෞද්ගලික මන්ත්‍රී වරයාටම තවත් ක්‍රමයකින් එය ඉදිරිපත් කර සම්මත කරවා ගන්නට අයිතියක් තිබෙන්නට ඕනෑ. අන්න ඒ කාරණය ගැන මා තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

With regard to that matter, the Standing Orders will have to be amended. Now that you are on the Standing Orders Committee you can take the matter up in the Committee.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"නොමිලේ නීති අධ්‍යාපන ලබාදීමට සහ පෙරකදෝරු අධිනීතිඥ භේදය නැති කොට එකම නීති වෘත්තියක් ඇති කිරීම සඳහා වූ පනත් කෙටුපතක්' ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

මෙම පනත් කෙටුම්පතේ පරමාර්ථයන් මා තව දුරටත් විස්තර කරන්නට අදහස් කරනවා. ඒවා මෙසේයි :

1. වෛද්‍ය වෘත්තිය, ඉංජිනේරු වෘත්තිය, කාර්මික විද්‍යා හා කලා උපාධි පුහුණුව සහ වෙනත් වෘත්තීන් පුහුණු කිරීමේ හා ඒ පිළිබඳ උසස් අධ්‍යාපනයෙහිදී මෙන් ම නීති වෘත්තිය පුහුණු කරවීමේදීද, නිදහස් ප්‍රතිපත්ති අනුව ශාස්තු අය නොකොට නොමිළයේ නීති අධ්‍යාපනයක් නීති විද්‍යාලයෙන් ලබාදීමට මං සැලසීම.

2. නීති අධ්‍යාපනයද දුප්පත් බුද්ධිමත් දරුවනට පහසුවෙන් ලද හැකි වෘත්තිය පුහුණුවක් බවට පත් කිරීම.

3. නීති විද්‍යාලයෙන් හෝ නීති අධ්‍යාපන මණ්ඩලය මගින් දැනට නීති ශිෂ්‍යයින්ගෙන් අය කරන ශාස්තු තහනම් කිරීම.

4. නීති අධ්‍යාපන කටයුතු නීති අධ්‍යාපන මණ්ඩලය කෙරෙහි තවදුරටත් පවරා නොකඩවා ගෙනයාම.

5. පෙරකදෝරුවරුන් හා අධිනීතිඥයින් අතර දැනට පවත්නා භේදය තුරන් කර දමා භේදයෙන් තොර එකම නීතිඥ වෘත්තියක් බිහි කිරීම.

6. නඩු කියන්නන් දැරිය යුතු අධික වියදම් එමගින් අඩු කිරීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බී. වයි. තුඩාවේ මයා.** (මාතර)
(திரு. பி. வை. துடாவ—மாத்தறை)
(Mr. B. Y. Tudawe—Matara)

විසින් ස්ථිර කරන ලදී.

அனுவதித்தார்.

*seconded.*

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.**

**වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම් වෙත පවරන ලදී.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையற் கட்டளை இல. 51 (4) இன்படி நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசிக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Parliamentary Secretary to the Minister of Justice for report.*

## රජයේ නීති ආධාර පනත් කෙටුම්පත

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"'නව නීති දෙපාර්තමේන්තු 3ක් පිහිටුවීම, රජයෙන් නීති ආධාර සැපයීම, නීතිඥ ගාස්තු නියම කිරීම හා නීතිඥ මණ්ඩල පිහිටුවීම සඳහා පනත් කෙටුම්පතක්' ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

මා ඉදිරිපත් කරන මේ දෙවන පනත් කෙටුම්පතේ පරමාර්ථයන් මා තව දුරටත් විස්තර කරනවා:

1. අපරාධ නඩු සඳහා (පැමිණිලි) වර්තමාන නීතිපති දෙපාර්තමේන්තුව වැනි වූ විත්ති පක්ෂය සඳහා මහජන විත්ති දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.



2. සිවිල් නඩු සඳහා සිවිල් පැමිණිලි දෙපාර්තමේන්තුවක් හා වග උත්තරකාර/සිවිල් විත්ති දෙපාර්තමේන්තුවක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

3. නඩු කියන්නන්ගේ අර්ථ පහසුව සඳහා රජයෙන් ආධාර සැපයීම.

4. වර්තමාන ක්‍රමය යටතේ හිඟමනට බසින නඩු කියන්නන් ඒ විපත්තියෙන් මුදවා ගැනීම.

5. වඩා ඉක්මනට, අඩු වියදමින් හා වඩා ප්‍රතිඵලදායි වන අයුරින් අධිකරණ සේවයක් ලබා දීම.

6. නීතිය හා අධිකරණ සංස්ථාවක් ඉදිරියේ පෙනී සිටින පුද්ගලයින් අතර දුප්පත් පොහොසත් භේදයක් නොමැතිව අධිකරණමය සමානාත්මතාවක් ආරක්ෂා කර දීම සඳහා, ගාස්තු ගෙවීමේ බැරි පුළුවන්කමකට ඉඩ නොතබා, පොදුවේ රජයේ ආධාරය ලබා දීම.

7. දුප්පත්කම නිසාම, යුක්තිය ඉටුවීමට ඇති බාධකයන් ඉවත් කිරීමට අවශ්‍ය වෙනත් පියවර ගැනීම.

8. ඒ ඒ උසාවි හා අධිකරණ සඳහා නීතිඥ මණ්ඩල පිහිටුවා, පෞද්ගලික නීතිඥයින්ට අය කළ හැකි ගාස්තු මාලාවක් නියම කිරීම හා ඒ ගාස්තු අය කරන ක්‍රමය නීතියෙන් නියම කිරීම.

මේ පරමාර්ථ සහිත සිංහල පනත් කෙටුම්පත් මා තමුන්නාන්සේට ඉදිරිපත් කරනවා. මේ පනත් කෙටුම්පත්වල දෙමළ පරිවර්තන මා ඔබතුමා ඉදිරියෙහි තැබිය යුතුව තිබෙනවා. දැන් ඒ දෙමළ පරිවර්තන දෙක ඉදිරිපත් කරමින් දෙමළ ගරු මන්ත්‍රීවරුන්ගේ—

**එම්. එම්. මුස්තාෆා මයා. (සමාජසේවා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(ஜனாப் எம். எம். முஸ்தபா—சமூகசேவை அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. M. M. Mustapha—Parliamentary Secretary to the Minister of Social Services)

Sir, I wish to rise to a point of Order with regard to this day's Order Paper. I believe the Order Paper is published for the purpose of giving notice to Members of this House about the matters coming up for discussion on a particular day.

Now, I believe the hon. Member for Habaraduwa is on Item 3 of the Order Paper. The original of the Order Paper is in Sinhalese which we cannot understand. In the Tamil

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

translation too the subject matter of the Bill is in Sinhala and, therefore, we cannot read and understand what the subject matter under discussion is. This is very important. I am not saying that thas is due to any fault on the part of my hon. Friend from Habaraduwa. If this is the practice the practice has to be changed. Otherwise, we will not be able to know what the subject matter is and we will not be able to come prepared. The subjectmatter of the Bill appears in Sinhalese both in the English and the Tamil translations.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy-Speaker)

It will not happen in the future, and I do not think we need discuss the matter any further.

**මුස්තාෆා මයා.**
*(ஜனுப் முஸ்தபா)*
(Mr. Mustapha)

We have not come prepared to discuss this matter though it is an important subject.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy-Speaker)

I do not think any preparation is necessary at this stage because the hon. Member for Habaraduwa is only introducing the Bill now. If the hon. Parliamentary Secretary had listened to the interpretation he would have understood what the Member said.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

දැන් එතුමාට තේරෙන භාෂාවෙන් කියන්නට යනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy-Speaker)

Is it necessary ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

වාක්‍ය තුන හතරකට වඩා නැහැ. දෙමළ පරිවර්තනයක් මා ඉදිරිපත් කර තිබෙනවා. ඒ දෙමළ පරිවර්තනය ඔබ තුමා හමුවේ තබමින් එහි අර්ථය වාක්‍ය තුන හතරකින් ඉදිරිපත් කරන්නට මා දැන් සූදානම්. මිනිත්තු දෙක තුනක් දෙමළ භාෂාවෙන් කථා කිරීම ගැන සමා වන්න.

*கௌரவ உப சபாநாயகர் அவர்களே, 1966 ஆம் ஆண்டு நவம்பர் மாதம் 6 ஆம் தேதி இச்சபையிலே இடம்பெற்ற சரித்திர பூர்வமான விடயத்தை மீண்டும் நான் இச் சபையில் நிறைவேற்ற விரும்புகிறேன். தற் போதைய சட்டத் துறையிலும் சட்டத் தொழில் புரிவதிலும் இந்நாட்டில் ஏழை வழக்காளிகள் இன்று எதிர்நோக்கவேண்டி யுள்ள இன்னல்களை நீக்கு முகமாக நான் இன்று இச்சபையில் இரு மசோதாக்களை சமர்ப்பிக்க முயல்கிறேன். இவ்விரு மசோ தாக்களும் அமுல் நடத்தப்பட்டால் விவே கம் நிறைந்த ஏழை மாணவர் சட்டக் கல் வியை இலகுவாகப் பெறுவதற்கும், ஏழை வழக்காளிகள் கஷ்ட நஷ்டமின்றிச் சட்டத் தீர்வுகளைப் பெறுவதற்கும் ஏதுவாக இருக் கும். எனவே, கௌரவ உப சபாநாயகர் அவர்களே இவ்விரு மசோதாக்களையும் சமர்ப் பிக்கத் தங்களின் அனுமதியைக் கோரு கிறேன். நான் சமர்ப்பிக்கும் இரு மசோதாக் களில் ஒன்று, "அரசாங்க இலவசச் சட்ட உதவி மசோதா" மற்றது, "இலவசச் சட்டக் கல்வி, சட்டத் தொழில் புரிவோர் (விசேட ஏற்பாடுகள்) மசோதா" நன்றி.*

**තුඩාවෙ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

විසින් ස්ථිර කරන ලදී.
*அனுவதித்தார்.*
*seconded.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පනත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී .

වාර්තා කිරීම සඳහා 51 (4) වන ස්ථාවර නියෝගය යටතේ කෙටුම්පත් පනත අධිකරණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වෙත පවරන ලදී.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

இதன்படி, மசோதா முதன்முறை மதிப்பிடப்பட்டு அச்சிடப்படப் பணிக்கப்பட்டது.

மசோதா, நிலையியற்கட்டளை இல. 51 (4) இன்படி நீதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசிக்கு, அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.

*Question put, and agreed to.*

*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 51 (4), to the Parliamentary Secretary to the Minister of Justice for report.*

## පරිපූරක මුදල්: ස්වදේශ කටයුතු අමාත්‍යවරයා: කාර්ය මණ්ඩල පෞද්ගලික පඩිනඩි, ආදිය

### குறை நிரப்புத் தொகை: உள்நாட்டு விவகார அமைச்சர்—ஆளுக்குரிய வேதனம் ஆதியன

### SUPPLEMENTARY SUPPLY: MINISTER OF HOME AFFAIRS: PERSONAL EMOLUMENTS, ETC.

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාල ප්‍රශ්නය [ජූලි 23]

ஜூலை 23 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப் பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

*Order read for resuming Adjourned Debate on Question*—[23rd July.]

"That a supplementary sum not exceeding Rupees Thirty-two thousand five hundred and ninety-six (Rs. 32,596) be payable out of the Consolidated Fund of Ceylon, or any other fund or moneys of, or at the disposal of, the Government of Ceylon, or from the proceeds of any loans obtained by the Government of Ceylon, for the service of the financial year beginning on 1st October 1966, and ending on 30th September 1967, and that the said sum may be expended as specified in the Schedule hereto:

*Schedule*

| | Rs. |
|---|---|
| Head 70—Minister of Home Affairs. | |
| Vote No. 1—Personnal Emoluments and other Allowances of Staff .. | 28,696 |
| Vote No. 2—Administration Charges—Recurrent Expenditure .. | 3,900 |
| | 32,596." |

—[ගරු ආචාර්ය දහනායක]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Question again proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Member for Panadura (Mr. Leslie Gonewardene), who was on his feet yesterday, may continue.

**ලෙස්ලි ගුණවර්ධන මයා.** (පානදුර)
(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)
(Mr. Leslie Goonewardene—Panadura)

I decline.

**ගරු ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති)
(கௌரவ கலாநிதி டபிள்யூ. தகநாயக்க—உள்நாட்டு விவகார அமைச்சர்)
(The Hon. Dr. W. Dahanayake—Minister of Home Affairs)

A few of the points that were raised come within the purview of this Supplementary Estimate, and I should like to answer them.

The hon. Member for Kolonnawa (Mr. Ilangaratne) raised questions in regard to a driver's salary and the Minister's travelling. I wish to point out that driver's salaries are governed by Treasury Circular No. 360/18/10/SBEP of 26th October, 1964. This circular was issued by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

hon. Member for Yatiyantota (Dr. N. M. Perera) when he was Minister of Finance. It reads as follows:

ඇමතිවරුන්ට පවරන ලද නිල මෝටර් රථ පැද වීමට ඔවුන්ගේ කැමැත්ත අනුව රියැදුරන් පත් කිරීමට තීරණය කර ඇත. මේ පත්වීම් තාවකාලික වන අතර ඔවුන් සිය තනතුරු දරන්නේ ඇමතිවරුන් එම ධුරවල සිටින තාක් කල් පමණයි. මේ රියැදුරන්ට විශ්‍රාම රහිත, සියලු දීමනා ඇතුළත් රුපියල් 250 ක මාසික දීමනාවක් ගෙවීම මැනවි. අතිකාල දීමනා හෝ ගමන් වියදම් හෝ යැපීම් දීමනා හෝ නොගෙවිය යුතුය.

It is on that circular that we are acting now.

ආචාර්ය එන්. එම්. පෙරේරා (යටියන්තොට)
(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)
(Dr. N. M. Perera—Yatiyantota)

You are getting wiser as you get older.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

That is so with all sensible people; they become wiser and wiser from day to day.

With regard to the travelling of the Minister, it is not true that Ministers use their cars, or that I have used a car, for private travelling. Travelling of Ministers is also governed by a circular of the Deputy Secretary to the Treasury. All travelling done by a Minister, including all travelling connected with his duties as Member of Parliament, must fall within the scope and terms of this circular.

The hon. Member also raised a question about the shortage of yarn. It is true that there is a shortage of yarn, and this is due to delay in shipments. However, we are doing everything possible to tide over the present difficult period. Hon Members should note that we are now getting the greater part of our yarn from the U. A. R., and that accounts for the delay in shipments.

A question was also raised about the gramasevakas. I am glad that the question was raised because it enables me to make a statement in regard to the present position. There has been much misunderstanding and much wrong information about the matter. The Government has no idea whatever of abolishing the gramasevaka system. We are retaining the gramasevaka system and taking all possible steps to improve the terms and conditions of service of gramasevakas.

We are not contemplating any change, major or otherwise. The only change that has been done in the system as it prevailed in the past, is in regard to new recruitments. New recruitments will be made to fill vacancies that arise from retirement, death, etc. In the past, new recruitments were done through an examination, but it is not satisfactory to hold examinations whenever vacancies arise because the number of applicants is very large and by the time the examination is over and the results are announced about one and a half to two years have passed from the date applications are called.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Besides, the man you want will also not get in.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

That is not the reason. An examination was held in January 1965 for filling about 130 vacancies. There were about 10,000 applicants and the final results were announced towards the end of 1966.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

Your fault. The interview was not held.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

There was a lapse of two years and we were called upon to make 135 appointments from a very large and unwieldly list of candidates—nearly 10,000 candidates. All vacancies that had arisen between January 1965 and the end of 1966 could not be filled on the results of that examination. So there were difficulties.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

This is very bad management. Are you seriously suggesting, therefore in the case of the clerical servants also it should be done on the same basis ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

In regard to clerical servants, the conditions are quite different.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Why are they different ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

Will the hon. Member please allow me to explain ? In January 1965 the previous Government called for applications from D. R. Os' divisions in which vacancies existed at that time. When the results were announced in December 1966, certain other vacancies also had arisen for which applications had not been called.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

May I explain the position ? Every department must know what is the recognized percentage of the vacancies to be filled every year. There is a wastage. The percentage is known. That can always be fixed in advance without waiting till the last moment till the vacancies occur. The department must know in advance the amount of wastage the department has.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

I must explain what my good Friend's Government did. In January 1965 they called for applications in respect of the D. R. Os' divisions in which the vancies existed. Nobody could have guessed in what other D. R. Os' divisions vacancies were going to arise unless of course you advertized for all the D. R. Os' divisions in the whole Island. However that may be, I am explaining to the hon. Members what took place in January 1965 and I am showing hon. Members that that system did not give us full results. Therefore the Government considered the whole question and decided to fill the vacancies in a different way.

From now onwards vacancies will be filled by advertisement and those eligible to apply will be those who hold a residential qualification in respect of a D. R. O's division and have four credit passes in the S. S. C. or is a retired village headman under 50 years of age provided the retired village headman's conduct and service were satisfactory.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

You are going back to the old system.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

No. They are very few in number. Those eligible to apply are those who have secured four credit passes in the S. S. C. Examination. Why are you forgetting that qualification ? You just ignore that part of it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

That is an alternative qualification.

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

Yes. The other part is also an alternative qualification. It is " Either or "—one is an alternative as much as the other also is an alternative.

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Therefore you give preference to the village headmen ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

We do not know. Let us wait for the results and you can then see in which way we give the preference.

There has been much misleading talk about the gramasevakas.

We had no intention at any time of abolishing the Gramasevaka Service. There are about 3,500 gramasevakas and the newspapers spread the report that I had dismissed 500 or so of them. This is totally false.

What are the facts ? Some of the gramasevakas, out of the total of 3,500, had not been confirmed in their posts. The various Government Agents when sending up their reports said that, from among those who had been confirmed, a total of 182, in their opinion, should be discontinued. They recommended the discontinuance of a total of 182, and not 500 as some of the newspapers tried to make out.

Then, Sir, after the Government Agents sent up those lists, the explanations of those gramasevakas were called for and the explanations were carefully scrutinized. It was decided that only 32 should be discontinued.

Now, where are the hundreds that the newspapers spoke of ? The Government Agents sent up their lists totalling 182 and it has been decided to discontinue only 32, which were the really bad cases, out of an all-island total of 3,500. Is this the reason why there is propaganda that we are trying to abolish the Gramasevaka Service ?

This is happening every day in the Public Service. Those who are on probation can be asked to quit the service if their service is unsatisfactory. This is nothing unusual. And only 32 out of a total of 3,500 have been discontinued. So, I am glad I have had this opportunity of explaining to hon. Members that we have no intention whatever of abolishing the Gramasevaka Service.

There are such questions as rent allowance and various other allowances and facilities that the gramasevakas have asked for. We are going into all those questions with a view to making the service a better service than it is today.

There was the question of the 2½ per cent. cut raised by the hon. Member for Yatiyantota. The position is that it is not always possible to estimate it with one hundred per cent accuracy. The reason why we need the present Supplementary Estimate is that there were promotions. You cannot estimate beforehand the amount of overtime that will be done. You can make a fair estimate. But if you make a cut, it may be said that the cut is also a fair one. Unfortunately, we have to come to the House because of the 2½ per cent. cut.

ලෙස්ලි ගුණවර්ධන මයා.
(திரு. லெஸ்லி குணவர்தன)
(Mr. Leslie Goonewardene)

What about registration of births in the official language ?

ගරු ආචාර්ය දහනායක
(கௌரவ கலாநிதி தகநாயக்க)
(The Hon. Dr. Dahanayake)

Yes, in regard to that, I have made a note of what the hon. Member for Panadura said. I regret it is not

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආචාර්ය දහනායක]

possible for me to get the answers now, but I will get the answers one by one and forward them to the hon. Member for Panadura.

**එස්. එම්. රාසමානික්කම් මයා. (පද්දිරිප්පු)**

*(திரு. எஸ். எம். இராசமாணிக்கம்—பட்டிருப்பு)*

(Mr. S. M. Rasamanickam—Paddiruppu)

On a point of clarification, Sir—

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

I am sorry I am unable to allow you to speak now.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## උසස් අධ්‍යාපන පනත යටතේ ආඥාව

*உயர் கல்விச் சட்டத்தின்கீழான கட்டளை*

## ORDER UNDER HIGHER EDUCATION ACT

**මතු පළවන විෂය ඊළඟට න්‍යාය පත්‍රයෙහි තිබිණ:**

அடுத்து, ஒழுங்குப்பத்திரத்தில் பின்வரும் விடயமிருந்தது:

*The following item stood next on the Order Paper:*

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති විසින් ඉදිරිපත් කිරීමට: "1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනතෙහි 34 වැනි වගන්තිය යටතේ, තමා වෙත පවරා ඇති බලතල අනුව, ජාතික උසස් අධ්‍යාපන සභාවේ නිර්දේශය පිදි, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති විසින් නිකුත් කරනු ලැබූ, 1967 ජූනි මස 9 වැනි දින අංක 14,752/1 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1967 ජූලි මස 15 වැනි දින ඉදිරිපත් කරන ලද ආඥාව අනුමත කළ යුතුය."

கல்வி, கலாசார விவகார அமைச்சர் பிரேரிப்பதற்கு: "உயர் கல்வித் தேசியப் பேரவையின் சிபார்சின் பெயரில், 1966 ஆம் ஆண்டின் 20 ஆம் இலக்க உயர் கல்விச் சட்டத்தின் 34 ஆம் பிரிவின்கீழ் அவருக்கு அளிக்கப்பட்டுள்ள அதிகாரங்களால் கல்வி, கலாசார விவகார அமைச்சரால் விடுக்கப்பட்டதும் 1967 ஆம் ஆண்டு ஜூன் மாதம் 9 ஆம் தேதிய 14,752/1 ஆம் இலக்க அரசாங்க அதிவிசேட வர்த்தமானியில் பிரசுரிக்கப்பட்டதும் 1967 ஜூலை 15 ஆம் தேதி அன்று சமர்ப்பிக்கப்பட்டதுமான கட்டளை அங்கீகரிக்கப்படுமாக."

The Minister of Education and Cultural Affairs to move:

"'That the Order issued on the recommendation of the National Council of Higher Education, by the Minister of Education and Cultural Affairs, by virtue of the powers vested in him by section 34 of the Higher Education Act, No. 20 of 1966, and published in the Ceylon Government Gazette (Extraordinary) No. 14,752/1 of June 9, 1967, which was presented on July 15, 1967, be approved."

**ගරු අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ල (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති)**

*(கௌரவ ஐ. எம். ஆர். ஏ. ஈரியகொல்ல—கல்வி, கலாசார விவகார அமைச்சர்)*

(The Hon. I. M. R. A. Iriyagolle—Minister of Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් කිසිවකු විරුඩ වෙතැයි මා කල්පනා කරන්නේ නැහැ. පේරාදෙණියේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය යටතේ පාලනය වන්නාවූත්, කාලයක පටන්ම ශිෂ්‍ය සංඛ්‍යාව විශාල ලෙස වැඩි වෙමින් පවතින්නාවූත් කොළඹ විශ්ව විද්‍යාල ශාඛාව වෙනමම ස්වාධීන විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම මැනවැයි විශ්ව විද්‍යාල පිළිබඳ සංශෝධන පනත මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමෙන් පසුව ඇති වූ සාකච්ඡාවලදීත්, විශ්ව විද්‍යාල පිළිබඳ දැනුම් තේරුම් ඇති උගතුන්ගේ කථාවලදීත් නිගමනය වුණා. ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලය මේ සම්බන්ධයෙන් කරුණු සොයා බැලීමෙන් පසුව එය එසේ කළ යුතු යයි නිර්දේශ කිරීමට හේතු වුණු කරුණු කීපයක් කියන්නට මා කැමතියි. දැනට උප කුලපති වශයෙන් සිටින නිලධරයාට පේරාදෙණියේ හා කොළඹ ඇති විශ්ව විද්‍යාල ශාඛා දෙකේම වැඩ එක සේ පරීක්ෂා කිරීම උගහටයි. ඒක එක හේතුවක්. ඔහු කොළඹත් සිටිය යුතුයි; පේරාදෙණියේත් සිටිය යුතුයි. එමෙන්ම සමහර කථිකාචාර්යවරුන් සහ මහාචාර්යවරුන් මෙම ස්ථාන දෙකෙහිම වැඩ කළ යුතුයි. සනාථන සභාවේ හෙවත් සෙනෙට් සභාවේ මහතුන් මෙම දෙපොළෙහිම රැස් වීම් තැබිය යුතුයි. තත්ත්වය මෙසේ හෙයින් මෙම නිලධරයන්ගේ කාලය වැඩි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වශයෙන් ගෙවී යන්නේ පාරටයි. මෙම තත්ත්වයෙන් ඔවුන් නිදහස් කර ගැනීම පිණිස කොළඹ ශාඛාව ස්වාධීන විශ්ව විද්‍යාලයයක් වශයෙන් ලියාපදිංචි කළ යුතු බව සාමාන්‍යයෙන් කවුරුනුත් පාහේ පිළිගන්නවා ඇති. විශ්ව විද්‍යාල පිළිබඳ විශේෂ දැනුමක් තේරුමක් ඇති යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්ය එන්. එම්. පෙරේරා) මෙන්ම මැද කොළඹ සම මන්ත්‍රීතුමාගේ (බර්නාඩ් සොයිසා මයා.) මතයත් ඒකමයි. උසස් අධ්‍යාපන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශය පිළිගෙන 1966 ජූනි මස 9 වන දින මා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයකින් මෙය වෙනම විශ්ව විද්‍යාලයක් විය යුතු බව නියම කළා. දැනට මෙම විශ්ව විද්‍යාල දෙකෙහිම වෙන් වෙන් වශයෙන් සිටින ශිෂ්‍ය සංඛ්‍යාව හුඟක් දුරට එක සමානයි. කොළඹ පමණක් කලා අංශයෙහි ශිෂ්‍යයන් 3,465 දෙනෙක්ද පෙරදිග භාෂා අංශයෙහි 243 දෙනෙක්ද, නීති අංශයෙහි 72 දෙනෙක්ද, සාමාන්‍ය විද්‍යාව ඉගෙන ගන්නා අය 446 දෙනෙක්ද, විශේෂ විද්‍යාව ඉගෙන ගන්නා අය 70 දෙනෙක්ද, වෛද්‍ය ශිෂ්‍යයන් 917 දෙනෙක්දැයි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 5,213 ක් සිටිනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
කොළඹ විතරක් ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔව්, කොළඹ විතරක් තත්ත්වය ඔකයි. ඒ නිසා කොළඹ විද්‍යායතනය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ ශාඛාවක් වශයෙන් නොව වෙනම ස්වාධීන විශ්ව විද්‍යාලයයක් වශයෙන් පවත්වාගෙන යෑම එහි ඉගෙන ගන්නා ශිෂ්‍යයනටත්, එහි උගන්වන ගුරුවරුනට මෙන්ම පාලක පක්ෂයටත් පහසුවක් බව තමුන්නාන්සේට සහ මෙම ගරු මන්ත්‍රීවරුනට පැහැදිලි වෙනවා ඇති. පේරාදෙණි විශ්ව විද්‍යාලයේ පවත්නා අංශ සියල්ලම පාහේ මේ විශ්ව විද්‍යාලයේත් පවත්වනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය සංඛ්‍යාව ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කොළඹ විශ්ව විද්‍යාලයේ තරමටම පේරාදෙනි විශ්ව විද්‍යාලයේත් ඉන්නවා. ඒ නිසා කිසිම විවාදයක් නැතිව පිළිගනීවිය යන විශ්වාසය උඩ, මේ යෝජනාව මේ ගරු සභාව ඉදිරියේ තබනවා.

ප්‍රශ්නය විභාගිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
*Question proposed.*

**ලෙස්ලි ගුණවර්ධන මයා.**
*(திரு. லெஸ்லி குணவர்தன)*
(Mr. Leslie Goonewardene)

අළුත් විශ්ව විද්‍යාලයේ නම ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කොළඹ විශ්ව විද්‍යාලය.

අ. භා. 2.40

**බර්නාඩ් සොයිසා මයා.** (දකුණු කොළඹ)
*(திரு. பெர்னட் சொய்ஸா—கொழும்பு தெற்கு)*
(Mr. Bernard Soysa—Colombo South)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගරු සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා විසින් රෙගුලාසි දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මා හිතන හැටියට ගරු ඇමතිතුමා කථා කළේ, පළමු වැනි එක ගැන පමණක් නොව දෙකම එකතු කර එයින් මතු වන කරුණු පිළිබඳ වයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අනෙක ගැනත් මා කියන්නද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
පළමු වැනි එක පේරාදෙණිය වෙන් කිරීම. තවත් එකක් කොළඹ පිහිටුවීම දෙ වැනි එක.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
එය කණිෂ්ඨ විශ්ව විද්‍යාල ගැන.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
නැහැ. න්‍යාය පත්‍රයේ අංක තුනක් තිබෙනවා. පළමු වැනි එක, පේරාදෙණි විශ්ව විද්‍යාලය වෙන් කිරීම. දෙවැනි එක, කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවීම. තුන් වැනි එක, කණිෂ්ඨ විශ්ව විද්‍යාල පිහිටු වීම.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
හරි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඒ නිසා, එකයි දෙකයි දෙකම එකතු කර අධ්‍යාපන ඇමතිතුමා කථා කළා. අධ්‍යා පන ඇමතිතුමා උසස් අධ්‍යාපනය පිළිබඳ ව පියවර ගන්නට සූදානම් වන්නේ මොකක් හෝ සිද්ධියක් ආසන්න වුණු අවස්ථාවකයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
නැහැ.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ගිය අවුරුද්දේ, සරසවි වර්ෂය කෙළවර වී අනෙක් වර්ෂය පටන් ගැනීම ආසන්න ව තිබුණු වේලාවේ උසස් අධ්‍යාපන පනත



ගෙනාවා. එය බොහොම ඉක්මනින් සම්මත කර ගන්නට උනන්දු වුණා. දැන් නැවතත් සරසවි වර්ෂයක් කෙළවර වී අළුත් වර්ෂයක් පටන් ගන්නට—

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කොයි කාලේ සිට තිබෙනවා ද ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
දැන් අවිවාදයෙන් සම්මත කර ගන්නට බොහොම ඉක්මන් වෙනවා. මෙයට අප විරුද්ධ නැහැ. නමුත් ඇති වී තිබෙන තත්ත්වය පිළිබඳව යමක් කියන්නට ඕනෑ. නමුන්නාන්සෙ මේ සම්බන්ධයෙන් කුමක් කරන්ට බලාපොරොත්තු වෙනවා ද, නමුන්නාන්සේට මේ ගැන මෙම ස්ථාන යේදී කොතෙක් දුරට කරුණු ප්‍රකාශ කරන්ට පුළුවන්කම තිබෙනවාද කියන්ට මා දන්නේ නැහැ. නමුත් මෙම අවස් ථාව ප්‍රයෝජනයට ගනිමින් සමහර ප්‍රශ්න පිළිබඳව කරුණු ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. පළමුවන ප්‍රශ්නය කුමක් ද යන්න මම පෙන්වා දෙන්නම්. මෙම ප්‍රශ්නයේදී නිසි විධියට කල්පනාව යොමු කර බලා පියවරක් ගෙන තිබෙනවා යැයි සිතන්ට අපට ටිකක් අමාරුයි. මින් මත්තට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය යන නමින් හැඳින්වෙන්නේ පේරාදෙනියේ පිහිටි විශ්ව විද්‍යාලය පමණයි. මෙතෙක් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට අයිතිව තිබුණු කොළඹ කොටස කොළඹ විශ්ව විද්‍යාලය බවට පත් වෙනවා. එම නිසා දැන් කොළඹ සිටින ශිෂ්‍යයන් විසින් අසනු ලබන ප්‍රශ් නයක් තිබෙනවා. එම ප්‍රශ්නය ඔවුන් විසින් ඇසිය යුතුයි. ඔවුන් අසන්නෙ මෙයයි: "අපි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා බැඳුනේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය ටයි. අපේ අධ්‍යාපනය බාගයක් දුර ගියාට පස්සේ ගරු ඇමතිතුමා මේ මණ්ඩලවල අනුමැතිය උඩ නියෝගයක් කරන්නෙ ඇයි, අපට කොළඹ විශ්ව විද්‍යාලයේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උපාධි ලත් අය හැටියට නියම වෙන්න වය කියා ?" පේරාදෙණියට යාමට වාස නාව තිබුණු උදවියට නම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ගරුත්වය හිමි වෙනවා. ඒ උදවියට ලැබෙන වරප්‍රසාදය කෙරෙහි ඊර්ෂ්‍යාවක් ඇතුව මා කතා කරනවා නො වෙයි. කොළඹ සිටින උදවියට කොළඹ විශ්ව විද්‍යාලයෙන් උගත් අයය කියනවා නම් ඇයි ඒ අයට පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් උගත් අයය නො කියන් නේ ? ඒකයි, අහන ප්‍රශ්නය. පේරාදෙණි යේ අය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ඉගෙ නීම ලබන අය හැටියට නම් කිරීම හොඳ දෙයක්. අන්න ඒවාගේ ගරුත්වයක් ඇති නමක් කොළඹ ඉගෙන ගන්නා අය වෙනුවෙනුත් යෙදුවාම ඇති වරද මොකද ? "කොළඹ විශ්ව විද්‍යාලය" කීවාම "අශ්ව විද්‍යාලය" ට ටිකයි එහා වෙන්නේ. ඒ නමෙන් එතරම් ඇතක් පෙනෙන්ට නැහැ. නම පිළිබඳ ප්‍රශ්නය ඉතා සුළු දෙ යක් හැටියට සලකන්ට පුළුවනි. නමුත් ඒ පිළිබඳව ශිෂ්‍යයන්ගේ හිතේ ලොකු අමාරුවක් තිබෙනවා. ඒ අය කියන් නේ මෙසේ යි : අපි බැඳුණේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ උපාධි ලබා ගන්ටයි. නමුත් අපට ලැබෙන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ උපාධියයි.

මේ සම්බන්ධයෙන් පැනනගින දෙවන ප්‍රශ්නය කුමක්ද ? මෙම විශ්ව විද්‍යාල දෙකට වුවමනා කරන අංග සම්පූර්ණ පීඨ යන් පිහිටුවීම සඳහා නිසි ප්‍රමාණයට ගුරු වරුන් සිටිනවාද ? "එක් මහාචාර්යවර යකුට කොළඹත් වැඩ කර පේරාදෙණි යෙත් වැඩ කරන්ට සිදු වෙනවාය ; එක කථිකාචාර්යවරයකුට කොළඹත් වැඩ කර පේරාදෙණියෙත් වැඩ කරන්ට සිදු වෙන වාය" යනුවෙන් ගරු ඇමතිතුමාම ප්‍රකාශ කළා. අපි උප කුලපතීන් ගැන පසෙකින් තබමු. අපි ගනිමු, ගුරු මණ්ඩලයට අයත් අය. ඒ උදවියටත් කොළඹ සහ පේරා දෙණිය කියන දෙකොටසෙහිම උගන් වන්ට සිදු වී තිබෙනවා නම් මේ අන්දමේ රෙගුලාසියක් පැනෙව්වාට පමණක් ප්‍රශ් නය විසඳෙනවාද ? මෙම වෙන් කිරීමෙන් සිදු වන්නේ, සමහරෙක් පේරාදෙණියට කැපවීමයි ; සමහරෙක් කොළඹට කැපවී මයි. ආදම්ගේ ඉල කටුව අරගෙන ඒව මැව්වා වාගේ තමයි, තමුන්නාන්සේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයට අයත් ඉල කටුව අරගෙන අළුත් විශ්ව විද්‍යාලයක් මැවීමත්. එසේ කිරීමේදී එම විශ්ව විද්‍යාල සඳහා අංග සම්පූර්ණ පීඨයන් ඇති කිරීමට තමුන්නාන්සෙට ශක්තියක් තිබෙනවාද ? මා සිතන්නේ නැහැ, තිබෙනවාය කියා. මෙම පියවර ගැනීම ගැන මා දෙස් කියනවා නොවෙයි. නමුත් අංග සම්පූර්ණ පීඨයන් පවත්වන්ට බැරි නම් මේ පියවර ගැනීමෙන් ඇති වන ප්‍රතිඵලය මොකක්ද? මේ ආකාරයට දෙකට කැඩූ විට ඉගෙනීම ලබන අයට සිදු වන්නේ කුමක්ද ? දැනට පේරාදෙණියේ සිටින මහාචාර්යතුමා කොළඹටත් කොළඹ සිටින මහාචාර්යතුමා පේරාදෙණියටත්, පේරාදෙණියේ සිටින කථිකාචාර්යවරයා කොළඹටත්, කොළඹ සිටින කථිකාචාර්යවරයා පේරාදෙණියටත් යන අන්දමට මාරු වෙමිනුයි කටයුතු කරන්නේ. නමුත් දෙකට කැඩුණායින් පසු එසේ මාරුවීමක් නැහැ. එතකොට මෙහේ සිටින අය මෙහේම උගන්වන්ට ඕනෑ. එහේ සිටින අය එහේම උගන්වන්ට ඕනෑ. එසේ නම් අංග සම්පූර්ණ පීඨයන් ඇති කිරීමට අලුතින් ගුරුවරුන් බඳවා ගන්නට සිදු වෙනවා.

**ඩී. ෂෙල්ටන් ජයසිංහ මයා. (කර්මාන්ත හා ධීවර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. டீ. ஷெல்ற்றன் ஜயசிங்ஹ—கைத் தொழில், கடற்றொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. D. Shelton Jayasinghe—Parliamentary Secretary to the Minister of Industries and Fisheries)

ඔව්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඒ කටයුත්ත සපුරාලීමට ප්‍රමාණවත්, ඒ තරමට දක්ෂතාවයක් ඇති පිරිසක් දැනට සිටිනවාද ? එවැනි පිරිසක් දැනට නැත් නම් කාලයක් යන තුරු ගුරුවරුන්ගේ අඩුවක්, නැත්නම් හිඟයක්, ඇතිවයි මේ කටයුත්ත කරන්නට සිදු වෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
එවැනි අඩු පාඩුවක් තිබෙනවා නම් පිටින් ගෙන්වා ගන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ணட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
තමුන්නාන්සේ ඔහොම කියන නාමුත් ඔය වැඩේ කරන්න තමුන්නාන්සේට බැහැ නේ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
අපේ අධ්‍යාපන ඇමතිතුමා කරාවි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ணட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එවැන්නක් කරනවා නම් ගරු ඇමතිතුමා පිළිතුරු දෙන විට ඒ ගැන කියාවි. වුවමනා කරන ප්‍රමාණය ලංකාවේ නැත් නම් පිටින් ගෙන්වා ගන්නවාද නැද්ද කියන එක හරියට දැනගන්නට අපට වුවමනා කරනවා. තමුන්නාන්සේ කර්මාන්ත ගැන කථා කරන්න. අධ්‍යාපන ඇමතිතුමාගේ හිතේ තිබෙන දේවල් තමුන්නාන්සේ දන්නේ නැහැ. ලංකාවෙන්ම බඳවා ගන්නවා නම් කොපමණ පුරප්පාඩු සංඛ්‍යාවක් ඇති වේද, එයින් පේරාදෙනියේ ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද, කොළඹ ඇති වන පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද, කියා අපි දැනගන්නට ඕනෑ. ඒ ප්‍රශ්න විසඳීමට යොදන මාර්ග මොනවාද කියන එකත් එයින්ම මතු වන ප්‍රශ්නයක්.

ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ අධ්‍යාපන පනත සකස් කළ අවස්ථාවේදී මීට පෙර අණපනත් සකස් කිරීමේදී අනුගමනය කළ ප්‍රතිපත්තියෙන් තරමක් දුරට ඈත් වී කටයුතු කළා. එනම්, මහා බ්‍රිතාන්‍යයේ විශ්ව විද්‍යාලවල තිබුණු පිළිවෙළට—විශේෂයෙන්ම "ඔක්ස්පර්ඩ්" හා "කේම්බ්‍රිජ්" විශ්ව විද්‍යාලවල තිබුණු පිළිවෙළට—නුවුවමනා, ප්‍රමාණයකට අප වහල් වී සිටිනවාය, තරමක් දුරට එයින් ඈත් වීම වරදක් නැත, වෙනත් රටවල තිබෙන ක්‍රම ගැනත් බලා ඒවායින් ප්‍රයෝජනයක් ගන්නට පුළුවන් නම් ඒවායින් පාඩමක් ගැනීමේ වරදක් නැත කියන ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට බැලුවා. ඒ අනුව ඒ පනත සකස් කිරීමට ඉදිරිපත් වූ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුන් බැලුවේ ඇමෙරිකාව දෙසයි. ඇමෙරිකාවේ තිබෙන පිළිවෙළක් තරමක් දුරට මේ පනතට ඇතුළත් කර ගත්තා. "සෙන්ට්‍රල් ඒජන්සිස්" ක්‍රමය—සියළුම විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයින් බඳවා ගැනීම එක මධ්‍යස්ථානයක් මගින් කිරීම—වැනි දේවල් මෙයට ඇතුළත් කර ගත්තා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒ ක්‍රමය එංගලන්තයෙත් තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ணட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
එංගලන්තයත් ඒ ක්‍රමය ගත්තේ පිටින්. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් අනිකුත් රටවල කටයුතු කෙරෙන්නේ කොහොමද කියා බැලුවා. ඒ අනුව මා විසින් විශේෂයෙන්ම ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ සැලකිල්ලට යොමු කළ යුතු කරුණක් තිබෙනවා. ඇමෙරිකාවේ ඇති දේශපාලනය මා කිසිසේත් අනුමත කරන්නේ නැහැ. ඇමෙරිකන් සංස්කෘතියේ ඇතැම් අංගයන් දෙස බලන විට එය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂෙප කරන්නටයි, සිදු වී තිබෙන්නේ. එහෙත් ඇමෙරිකන් විශ්ව විද්‍යාල ක්‍රමයේ එක හොඳ දෙයක් තිබෙනවා. මේ "පීඨය" හැටියට සලකන "fැකල්ටි" කියන ඒවා අංග සම්පූර්ණ කර ගන්නට බැරි නිසා ඒ අය "ස්කූල්" කියන අදහස දෙන සංවිධාන ඇති කර ගෙන තිබෙනවා. එයට සිංහලෙන් කියන්නේ මොකක්ද කියා මා දන්නේ නැහැ. මා හිතන විධියට එයට සිංහලෙන් කියන්නේ "විද්‍යායතන" කියලයි. එහෙත් ඒ ආයතන නියම විධියට නම් "පීඨයන්" වන්නට ඕනෑ. "පීඨය" කියන වචනය "fැකල්ටි" කියන අදහස දෙන්නට පාවිච්චි කරන නිසා "ස්කූල්" කියන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

අදහස දෙන්නට "විද්‍යායතන" කියන වචනය පාවිච්චි කරනවා. ඒ අනුව ලන්ඩන් විශ්ව විද්‍යාලයේත් "ස්කූල් ඔෆ් ඉකොනමික්ස්" කියා ආයතනයක් තිබෙනවා. එය අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විද්‍යායතනයක්. ඒ අනුව බලන විට විශේෂඥයින් හැටියට ශිෂ්‍යයින් පුහුණු වන්නේ පළමුවැනි උපාධියෙන් නොවෙයි. උපාධිධරයන් වීමට ප්‍රථමයෙන්ම ලබා ගන්නා උපාධියෙන් පමණක් විශේෂඥයින් වන්නේ නැහැ. විශේෂඥයින් වන්නේ ඊට පසුව ඊට ඉහළ උපාධියක් ලබා ගත්තාට පසුවයි. මේ විද්‍යායතනයන් විෂයයන් එකකට හෝ දෙකකට පමණක් සීමා වෙනවා. එක ශිෂ්‍යයාට විද්‍යායතනයන් දෙකක වුවත් සාමාජිකයන් වන්නට පුළුවන්. තමන් අඩු කොට සලකන, කණිෂ්ඨ තත්ත්වයක් දරණ විද්‍යායතනවල සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය ගැන ඒ තරම් සැලකිල්ලක් දක්වන්නේ නැහැ. එහෙත් ජ්‍යෙෂ්ඨ හැටියට සලකන, ජ්‍යෙෂ්ඨ තත්ත්වයක් තිබෙන විද්‍යායතන එකී ශිෂ්‍යයා තමන්ගේ ශිෂ්‍යයෙකු හැටියට—තමන්ගේ ආයතනයටම අයිති ශිෂ්‍යයෙකු හැටියට—සලකා කටයුතු කරනවා. ඔය අන්දමට කල්පනා කරන විට එක් විද්‍යායතනයක ජ්‍යෙෂ්ඨ තත්ත්වයකුත් අනෙක් විද්‍යායතනයේ කණිෂ්ඨ තත්ත්වයකුත් සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවකටම දරන්නට පුළුවන් බව පෙනී යනවා.

කලාව පිළිබඳව, භාෂාවන් පිළිබඳව, විද්‍යාවන් පිළිබඳව, වෙන් වෙන් වශයෙන් විද්‍යායතන පිහිටුවන්නට පුළුවනි. එත කොට එක් ශිෂ්‍යයෙකුට එක් විද්‍යායතනයක ජ්‍යෙෂ්ඨ තත්ත්වයකුත්, අනෙක් විද්‍යායතනයේ කණිෂ්ඨ තත්ත්වයකුත් දරන්නට පුළුවනි. ප්‍රථම උපාධිය සඳහා සමහර අය විශේෂඥයන් හැටියට වෙන් වෙනවා. ඉංග්‍රීසි භාෂාව, සිංහල භාෂාව, පාළි භාෂාව ආදී භාෂාවලටත්; උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, භූගෝල විද්‍යාව, රසායන විද්‍යාව ආදී විද්‍යාවලටත් ඇතැමුන් වෙන් වෙනවා. සමහර අය ප්‍රථම උපාධිය සඳහා විෂයයන් තුනක් ගන්නවා. විෂයයන් තුනක් ගන්නේ සාමාන්‍ය උපාධිය සඳහායි. සාමාන්‍ය උපාධිය සඳහා විෂයයන් තුනක් ගන්න ශිෂ්‍යයා කාටවත් අයිති නැහැ. විශේෂඥයකු හැටියට අර්ථ ශාස්ත්‍රය හදාරන ශිෂ්‍යයා තමන්ගේ ශිෂ්‍යයකු හැටියට අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විද්‍යා පීඨයේ පීඨාධිකාරී තැනත්, මහාචාර්යවරුනුත්, කථිකාචාර්යවරුනුත් කියනු ඇති. රසායන විද්‍යාව ඉගෙන ගන්න ශිෂ්‍යයා ගැනත් අනෙකුත් විද්‍යාවන් ඉගෙන ගන්න ශිෂ්‍යයා ගැනත් පවතින තත්ත්වය එයයි. ඒ අනුව එකී ශිෂ්‍යයන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනවා. නීතිය හදාරන ශිෂ්‍යයාට නීතිය පිළිබඳ පීඨාධිකාරී තැන සලකනවා. එහෙත් විෂයයන් තුනක් හතරක්—සිංහල භාෂාව, පාළි භාෂාව සහ අර්ථ ශාස්ත්‍රය වැනි විෂයයන්—ගන්න ශිෂ්‍යයා කාටවත් අයිති නැහැ. ඔය විෂයයන් තුන ගන්න ශිෂ්‍යයාට නම් කවුරුන්වත් සලකන්නේ නැහැ. මේ පීඨයන් සම්පූර්ණ කර ගැනීමට අද අපට අවශ්‍ය තරම් ගුරුවරුන් නැති නිසා මේ කියන පිළිවෙළ වඩාත් යෝග්‍ය වෙනවා. අංග සම්පූර්ණ පීඨයන් පිහිටුවන්නට පුළුවන් නම් එය වෙනම දෙයක්. එසේ කරන්නට නොහැකි නිසා මේ හැටියට විෂයයන් වෙන් කර, පුළුවන් ප්‍රමාණයට—හැකි ප්‍රමාණයට—විශේෂඥයන් ඇති කරන්නට යන්නේ නැහැ. උගන්වන්නට බැරි විෂයයන් පිළිබඳව, වෙන් කර විද්‍යායතන ඇති කළාම, එක් ශිෂ්‍යයෙකුට එක් විද්‍යායතනයක ජ්‍යෙෂ්ඨ තත්ත්වයක් දරණ අතර අනෙක් විද්‍යායතනයේ කණිෂ්ඨ තත්ත්වයකුත් දරන්නට පුළුවන් වෙනවා. එවිට ඒ විද්‍යායතනයේ ප්‍රධානයා ඔහු ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්නේ ඔහු තමන්ගේ ආයතනයට අයත් කෙනෙකු හැටියට සැලකීමෙනුයි. ඒ අනුව බලන විට, සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අද විශේෂඥයන් වීමට යන අයට පමණක් ලැබෙන සැලකිල්ල ලබා ගන්නට පුළුවනි. ඒ නිසා මගේ කල්පනාවේ හැටියට මේ පිළිබඳව උපදෙස් දීමට ලංකාවට විශේෂ අමුත්තෙකු හැටියට පැමිණ සිටින තිස්ල්ත්වෙයිට් මහත්මයාත් මේ අදහස අනුමත කරනවා. ඒ බව මට ආරංචියි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ යෝජනාව ගැන සලකා බලන්නට බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)

මේ ප්‍රශ්නය ගැන ගරු ඇමතිතුමා බොහොම ඉක්මන් වෙලා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ප්‍රමාද වුණා වැඩියි.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னட் சொய்சா)
(Mr. Bernard Soysa)

ඒ නිසා සිදු වන දෙයක් ගැන කල්පනා කර බලන්න. 1967 ජූනි මාසේ 9 වැනිදා ගැසට් පත්‍රයේ මේ පිළිබඳව රෙගුලාසි තුනක් පළ කර තිබුණා. එයින් එකක් ක්‍රියාත්මක කිරීමට මෙහාට එන්නට වුවමනාවක් නැහැ. පණතේ 103 වන වගන්තිය යටතේ ඇති කරන රෙගුලාසි අනුව, ඊට අපගේ අනුමැතිය අවශ්‍ය නැහැ. අනෙක් දෙකට අපගේ අනුමැතිය අවශ්‍යයි. දැන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ කොළඹ අංශය හැටියට හැඳින්වෙන කොටස අහෝසි කොට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයය පේරාදෙණියට පමණක් සීමා කරන්නට රෙගුලාසියක් දමා තිබෙනවා. ඒ සමගම තව විශේෂ රෙගුලාසියක් ඇති කර තිබෙනවා. එය අපගේ සාකච්ඡාවට භාජන නොවන එකක් නමුත් ගැසට් පත්‍රයෙහි තිබෙන නිසා ඒ ගැන කථා කරන්නට අපට අයිතියක් තිබෙනවා. එයින් කියැවෙන්නේ ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ කොළඹ අංශය වෙනම මඩමක් හෙවත් "කැම්පස්" එකක් වශයෙන් පිහිටුවන බවයි. එක් රෙගුලාසියකින් අහෝසි කරන්නට යන කොළඹ අංශය, එදාම අත් සන් කරන තවත් රෙගුලාසියකින් වෙනම මඩමක් බවට පත් කරනවා. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ කොළඹ අංශය අහෝසි කිරීමටත් ඒ සමගම එය වෙනම මඩමක් වශයෙන් පිහිටුවීමටත් එකම ගැසට් පත්‍රයෙන් රෙගුලාසි ඉදිරිපත් කරන විට, එයින් පෙනෙන්නේ—ගරු ඇමතිතුමා නොව—මේවා සකස් කොට ඉදිරිපත් කරන අය මේ පිළිබඳව හරියාකාර කල්පනා කර නැති බවයි. මෙයින් විශාල පැටලිල්ලක් ඇති වන්නේ නැහැ. වෙනම විශ්ව විද්‍යාලයයක් පිහිටුවීමට ගෙනා රෙගුලාසි අනුමත කළාට පසුවයි අනෙක ක්‍රියාත්මක වන්නේ. එහෙත්, තවත් කොළඹ අංශයක් පවත්වා ගෙන යන්නට අදහස් කරන බවක් මෙයින් සමහර කෙනකුට පෙනෙන්නට පුළුවනි.

විශ්ව විද්‍යාලයයේ අංශයක් තුරග තරග පිටියෙහි පවත්වන්නට කටයුතු කිරීම මේ ගරු සභාවේදී කාගේත් විහිළුවට ලක්වුණා. එහෙත් මේ රටේ එවැනි මාර්ගයෙකින්වත් උසස් අධ්‍යාපනයක් සැපයීම, කොහෙත්ම නොසපයනවාට වඩා හොඳ බව අප පිළිගන්නට ඕනෑ. ඒ ගැන අප සතුටු වන්නට ඕනෑ. එහි අඩුපාඩු රාශියක් තිබෙනවා. එහෙත් උසස් අධ්‍යාපනයේ දොර සම්පූර්ණයෙන්ම නොවසා මේ තත්ත්වයෙන්වත් එය ලැබිය යුතු අයට දීමට කටයුතු කිරීම ගැන අප සතුටු වන්නට ඕනෑ. උසස් අධ්‍යාපන පණත ක්‍රියාත්මක වුණු දවසේ සිට අද දක්වා සිදුවී තිබෙන්නේ කුමක්ද? විශ්ව විද්‍යාලයවලට ඇතුළත් කරනු ලබන ශිෂ්‍යයින් ප්‍රමාණය සීමා කිරීම පමණයි. ගිය අවුරුද්දේ මෙම පණත සම්මත වුණාට පසු විශ්ව විද්‍යාලය ප්‍රවේශ විභාගය ගත් ශිෂ්‍යයින්ගෙන් තෝරා ගනු ලැබුවේ කීදෙනාද? "ලකුණු මෙපමණ ගත් උදවිය" යනුවෙන් සීමාවක් ඇති කොට ඒ සීමාව අනුව ලකුණු ලබගාත් අය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයට බඳවා ගත්තා. "අපගේ කැමැත්ත අසුවල් පීඨයටය" යි යනුවෙන් ප්‍රකාශ කළ අය ඒ අනුව බඳවා ගනු ලැබුවා. උතුරු නැගෙනහිර පෙදෙස්වලින් ආ අයට ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයෙහි විශේෂ තැනක් ලැබුණා, වෙනත් මාධ්‍යයෙකින් උගැන්වීමට අනෙක් විශ්ව විද්‍යාලයවල පහසුකම් නැති නිසා. විද්‍යාලංකාර විද්‍යෝදය විශ්ව විද්‍යාලයවලට ශිෂ්‍යයින් බඳවා ගත්තේත් ඉහත කී අන්දමේ ලකුණු සීමාවක් අනුවයි. ඊට පෙර අවුරුදුවලත් මේ තත්ත්වය පැවැතුණා. ඒ ගැනත් අප මෙහිදී දොස් කියා තිබෙනවා. අප ආණ්ඩු ගැන කථා කරනවා නොවෙයි. ප්‍රවේශ විභාගයෙන් සමත් වුණත් විශ්ව විද්‍යාලයවලට ඇතුළත් වනන්ට පුළුවන් වුණේ අර සීමාව අනුව ලකුණු ගත් අයට පමණයි. විශ්ව විද්‍යාලය ප්‍රවේශය ඒ අයට පමණක් සීමා වුණා. එසේ සීමා කරන ලකුණු ගණන වරක් තෝරා ගත්තේ පේරාදෙනියේ නේවාසික ශිෂ්‍යයන් වෙනුවෙන් ඇති කර තිබෙන ඉඩ ප්‍රමාණය දෙස බලලයි. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුව අනුගමනය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ ඊට දෙවෙනි නොවන ප්‍රතිපත්තියක්. "විශ්ව විද්‍යාලවලට ඇතුළත් කර ගන්න ශිෂ්‍ය සංඛ්‍යාව සීමා කරන්න අපි බලාපොරොත්තු වෙනවා" යයි තමුන්නාන්සේලා කියනවා. ඒ වගේම එසේ සීමාවෙලා තිබෙනවා. මේ උසස් අධ්‍යාපන පනත ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී කෙලින්ම ප්‍රකාශ කළා, විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම සීමා කරන්ට අපි බලාපොරොත්තු වෙනවා කියා. එහෙම බලාපොරොත්තුවක් තිබෙන බව ප්‍රකාශ කළා. එහෙත් ඒ සමගම ප්‍රකාශයක් කර තිබෙනවා, "මේ තත්ත්වය හොඳ නැහැ අපි ඒක වෙනස් කරන්නට ඕනෑ" කියා ගරු ඇමතිතුමාගෙන් මම අහනව, මේ තත්ත්වය වෙනස් කරන්ට කොයිතරම් දුරට පියවර ගෙන තිබෙනවාද කියා. අළුත් ඉඩමක් අරගෙන විශාල මුදලක් වියදම් කරල ගොඩනැගිලි හදල කොළඹ කොහේ හරි අළුතෙන් විශ්ව විද්‍යාලයක් පිහිටුවන්න කියල අපි කියන්නෙ නැහැ. ඒක එක අවුරුද්දකින් කරන්ට යයි මම කියන්නෙ නැහැ. එහෙත් දැනට ඒ ශිෂ්‍යයන්ට මුහුණපාන්නට සිදුවී තිබෙන දුෂ්කරතාවන්ගෙන් ඔවුන් ඈත් කර ගැනීමට පියවර කීයක් ගෙන තිබෙනවාද කියායි මා අහන්නේ. මොනවද කරල තිබෙන්නෙ? මේ සම්බන්ධයෙන් හැම කෙනෙකුම කළ කථා මා කියවන්නට අදහස් කරන්නේ නැහැ. රාජ්‍ය ඇමතිතුමා මෙන්න මෙහෙම කියා තිබෙනවා:

"In this country too we must have some system. You cannot have universities behaving like madmen and rushing on to unbridled expansion. They do not care about the money given to them. Does any Member of this House approve of the accommodation available to students around Peradeniya?"

"We do not want lectures to be delivered over loudspeakers with the grandstand used as a lecture hall and where students are subject to the ills and temptations of a great city. That is not the way in which we want university education to be imparted. You may be satisfied with education being imparted over loudspeakers. We are not satisfied."

He was addressing us.

"We want that changed; we want to improve the position. That is why we have placed this document before you to change and to improve the position."—[OFFICIAL REPORT, 27th July 1966; Vol. 67, cs. 1425 and 1426].

ශබ්ද විකාශන යන්ත්‍ර මාර්ගයෙන් දෙන ඒ ඉගැන්වීම් තත්ත්වයට සරිලන්නේ නැහැ කිව්ව.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

හොඳ මදි—

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

හොඳ මදි නොවෙයි; බොහොම නරකයි කියලයි කිව්වෙ. "තමුන්නාන්සේලා මේ ගැන තෘප්තියට පත්වන්නට පුළුවන්; අපි තෘප්තියට පත්වන්නේ නැහැ. "කියලයි රාජ්‍ය ඇමතිතුමා එදා කිව්වෙ. එහෙත් තවමත් තමුන්නාන්සේලා ඒ ගැන තෘප්තියට පත්වෙලයි සිටින්නෙ. ඒ තත්ත්වය වෙනස් කරන්ට අරගෙන තිබෙන පියවර මොනවාද? කිසි වෙනසක් නොකර "රේස් කෝර්ස් විශ්ව විද්‍යාලය" වෙනම කොළඹ විශ්ව විද්‍යාලය කියා නම් කරන්ටයි යන්නෙ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

ඒක පළමුවෙනි පියවර

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

කොළඹ රේස්පිටියේ පවත්වාගෙන යන ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ අංශය වෙනම සංවිධානයක් හැටියට සලකල ඊට විශ්ව විද්‍යාල තත්ත්වයක් හෙවත් සරසවි තත්ත්වයක් දෙන්නටයි, යන්නෙ. එහෙත් කොපමණ දුරට මේව වෙනස් කරන්ට ඕනෑද? ඒ වෙනස් කිරීම සඳහා මේ පනත ගෙනාවාය කිව්වොත්, ඒ කලින් කරන ලද ප්‍රකාශය අනුව කොයි තරම් දුරට තමුන්නාන්සේලා ක්‍රියා කර තිබෙනවාද? [බාධාකිරීමක්] මොනවද කර තිබෙන වෙනස?

ඉඩමක් අරගෙන එකවරම නව ගොඩනැගිලි හදල විශ්ව විද්‍යාලය පටන් ගන්න යයි අපි ඉල්ලන්නෙ නැහැ. අපි අහන්නේ මේ වෙනස් කිරීම්වල සැලැස්මක් තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

වද කියායි. කවදාද මේ වෙනස්වීම් සිදු වෙන්නෙ? ඒ පියවර ගන්නෙ කවදාද? යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කිව්වෙ ඒකයි, මේ පනත ඉදිරිපත් කරන්ට කලින් ඒ පිළිබඳව අංග සම්පූර්ණ කථාවක් කරන්න කියල. මේ කරුණුත් අපට කියන්ට ඕනෑ. "ග්‍රෑන්ඩ් ස්ටෑන්ඩ්" එක විශ්ව විද්‍යාලය කියා නම් කරන්ට යන කොට අපි දැන ගන්න ඕනෑ, හැමදාම මේ අඩුපාඩු මේ විධියට තිබෙන්නට ඉඩ හරිනවාද කියා. වෙනසක් කරන්නට යනවා නම් කවදා ද ඒ වෙනස කරන්නට බලාපොරොත්තු වෙන්නෙ?

ඊළඟට, ඉගැන්වීමේ මාධ්‍යය පිළිබඳ ප්‍රශ්නය තිබෙනවා. මේ අවස්ථාවේදී රජයේ භාෂා ප්‍රතිපත්තිය ගැනත් රජයේ භාෂාව කොයි භාෂාව විය යුතුද යන ප්‍රශ්නය ගැනත් ඇති වී තිබෙන විවාද නැවත වරක් මතු කොට ඒ ප්‍රශ්න සාකච්ඡාවට භාජන කරවීමට මා තුළ අදහසක් නැහැ. එහෙත් අවුරුදු ගණනාවක් තිස්සේ භාෂා මාධ්‍යය පිළිබඳව අරගෙන තිබෙන පියවරවල් ගැන සලකා ඒ අනුව වෙනසක් කරන්නට තමුන්නාන්සේට යුතුකමක් තිබුණා. මේ අවස්ථාවේදී මා ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේ තිබෙන වැදගත්කම ගැන ඇමතිතුමා සමග විවාදයක් කරන්නට සූදානම් නැහැ. එවැනි විවාදයකට බසින්නට වුවමනාවකුත් නැහැ. ඉංග්‍රීසි භාෂාව දැනගත් තරමට හොඳ බව මා පිළිගන්නවා. ඉංග්‍රීසි භාෂාව පමණක් නොවෙයි, ඕනෑම ලෝක භාෂාවක්, රුසියානු භාෂාව, ජර්මන් භාෂාව ආදී ඕනෑම ලෝක භාෂාවක් ඉගෙන ගත් තරමට හොඳයි. වැඩිපුර භාෂා ඉගෙන ගත් තරමට හොඳයි. ඒ ගැන මගේ තර්කයක් නැහැ. හැබැයි, මේ අවස්ථාවේදී මතක් කළයුතු තවත් කාරණයක් තිබෙනවා. සමහර තැන්වල තමුන්නාන්සේලා උගන්වන්නෙ ඉංග්‍රීසි භාෂාව නොවෙයි ලුණු මිරිස්! තමුන්නාන්සේලාගේ නීති සම්පාදක මණ්ඩලය මගින් මේ ගරු සභාවට ඉදිරිපත් කළ ඉංග්‍රීසි පනත් කෙටුම්පතක් මා එදා කියෙව්වා. සිංහල වැරදි නම් මේ මහත්වරු තවම සිංහල ඉගෙන ගත්තේ නැත කියන්නට පුළුවනි. නමුත් ඉංග්‍රීසි භාෂාවෙන් ඉදිරිපත් කළ පනත් කෙටුම්පතකුයි මා එදා කියෙව්වෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේලාගේ මිත්‍රයන් කළ දේවල් නොවැ ඔය අපේ කර පිට දමන්නෙ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේලා යටතේ වැඩ කරන උදවිය ගැනයි මා කියන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අප බලයට පත් වී තවම දැවුරුද්දයි නොවැ ගත වුණේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේලා බලයේ සිටි කාලයේ දී නොවෙයි, ඊටත් පෙර කාලයේ සිට අපේ රටේ තිබෙන මහා පාඨශාලාවල ඉංග්‍රීසි භාෂාවෙන් ඉහළම පෙළේ අධ්‍යාපනයක් ලත් උදවියයි මේවායේ සිටින්නෙ. නමුත් ඒ මහත්වරුන්ටත් දැන් තමන් ඉගෙන ගත් ඉංග්‍රීසි අමතක වී තිබෙනවා. එම නිසා මේ අවස්ථාවේදී, ඉංග්‍රීසි නොදන්න මිනිසා ම්ලේච්ඡයකුය, යන ආදී කථාවල් ගැන ගරු ඇමතිතුමා මා සමග විවාදයකට නොබසීවිය කියා මා බලාපොරොත්තු වෙනවා. ඒක නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. උසස් අධ්‍යාපනය ලබා දෙන්නට යන්නේ කුමන භාෂා මාධ්‍යයෙන් ද යන්නයි මෙතැන තිබෙන ප්‍රශ්නය. අපේ ජාතික භාෂා මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබා දිය යුතුය යන්න පිළිගෙන තිබෙනවා. විශේෂයෙන්ම සිංහල භාෂාවෙන් උසස් අධ්‍යාපනය දෙන්නට උත්සාහයක් දැරිය යුතුය යන්න පිළිගෙන තිබෙනවා. ළමයකු ප්‍රාථමික අධ්‍යාපනය සහ ද්විතීය අධ්‍යාපනය ලබා ගත්තේ කුමන භාෂාවෙන්ද, ඒ භාෂාවෙන්ම ඔහුට උසස් අධ්‍යාපනයක් ලබා දිය යුතුය යන ප්‍රතිපත්තිය අනුවයි මෙතෙක් වැඩ කර තිබෙන්නෙ. ඒ අනුව දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමාගේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආණ්ඩුව තිබුණු කාලයේදීත්, ඊට පසු දැනට විරුද්ධ පක්ෂයේ නායිකාව වශයෙන් සිටින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව තිබුණු කාලයේදීත්, ඊට පසු කාලයේදීත් යම් ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නය කියා මේ විශ්ව විද්‍යාලවලින් ඉල්ලීමක් කර තිබෙනවා. එය කුමක්ද? ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් හැකි තරම් ඉක්මණින් ඉංග්‍රිසි භාෂාව අත්හරින්නය යන්නයි. එහෙත් පොත් පත් සඟරා බැලීමට, සාකච්ඡාවලට සහභාගි වීමට, පිටරටවල විශ්ව විද්‍යාල සමග සාකච්ඡා ඇති කිරීමට ඉංග්‍රිසි මාධ්‍යය පාවිච්චි කිරීමට කිසිම තහනමක් ඇති කළේ නැහැ. ඒ ඒ පීඨයන්හි ඉගැන්වීමේ භාෂා මාධ්‍යය වශයෙන් සිංහල දරුවාට සිංහල භාෂාවත් දෙමළ දරුවාට දෙමළ භාෂාවත් පාවිච්චි කිරීම සම්බන්ධව නියෝගයක් කර තිබුණා.

**ටී. බී. තෙන්නකෝන් මයා.** (දඹුල්ල)
*(திரு. ரீ. பி. தென்னகோன்—தம்புள்ள)*
(Mr. T. B. Tennekoon—Dambulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණින් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை எண்ணப்பட்டு நிறைவெண் இல்லாததால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

නියෝජ්‍ය කථානායකතුමනි, "ඉංග්‍රිසිය අත්හැර සිංහල භාෂාවටත්, අවශ්‍ය තැන්වල ද්‍රවිඩ භාෂාවටත් මාරු විය යුතුය" යන්නයි මේ ප්‍රතිපත්තිය. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ඇතැම් බලගතු උදවිය තුළ මේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට අකමැත්තක් තිබුණා. ඒ නිසා 1965 අවුරුද්දේ අගමැතිතුමා සමග ඒ අය සාකච්ඡාවක් පැවැත්වූවා. අපි ගරු අගමැතිතුමාගේ ආණ්ඩුව කෙරෙහි කිසිම ආදරයක් දක්වන්නේ නැහැ. ඒ ආණ්ඩුව හැකි තාක් ඉක්මණින් මේ රටින් තුරන් කිරීමයි, අපේ බලාපොරොත්තුව. අපි අගමැතිතුමාගේ දේශපාලන මත අනුමත කරන්නේ නැහැ. නමුත් 1965 අවුරුද්දේ එතුමා හමුවීමට ගිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ගුරු පිරිසකට එතුමා කළ නියෝගය ගැන අප විශේෂයෙන් එතුමාට ස්තුතිවන්ත වෙනවා, ගෞරවය දක්වනවා. "එදා ඇති කළ ප්‍රතිපත්තිය වෙනස් කරන්නට මා ඉදිරිපත් වන්නේ නැහැ" කියා එතුමා ඒ පිරිසට කියා තිබෙනවා. එතුමා ඒ පිරිසට කෙළින්ම කිව්වා, "ඉංග්‍රිසිය අත්හැරීම, සිංහල භාෂාවට සහ අවශ්‍ය තැන්වල ද්‍රවිඩ භාෂාවටත් වෙනස් කිරීම 1968 දී සම්පූර්ණ කළ යුතුයි" කියා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ ප්‍රතිපත්තිය එහෙමමයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

දැන් එහෙම නොවෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(Th Hon. Iriyagolle)

එහෙමමයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

1968 දී ඒ පරිවර්තනය සම්පූර්ණ කළ යුතුය කියා එතුමා නියෝග කළා. මා කලිනුත් කිව්වා, අප මේ ආණ්ඩුව කෙරෙහි කිසිම ආදරයක් දක්වන්නේවත්, අගමැතිතුමාගේ දේශපාලන ප්‍රතිපත්ති අනුමත කරන්නේවත් නැති බව, නමුත් ඒ නියෝගය ගැන අප කවුරුත් එතුමාට ස්තුතිවන්ත විය යුතුයි, ගෞරවය දැක්විය යුතුයි, ප්‍රසංශා කළ යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

කොහොමද, ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වී තිබෙන්නේ කියා මා එකින් එකට පෙන්වා දෙන්නම්. එදා සංක්‍රමණීය ප්‍රශ්න මතු වෙනවාය කිව්වා. සංක්‍රමණීය තත්ත්වයක් තිබෙනවා. ඉංග්‍රීසියෙන් ඉගැන්වූ කාලයේ සිට සිංහල භාෂාවෙන්—සවභාෂාවෙන්—උගන්වන්නට යන කාලය දක්වා සංක්‍රමණය වීමේ කාලයයි. මේ සංක්‍රාන්තිය නිසා නොයෙක් ගැටළු, නොයෙක් ප්‍රශ්න මතු වෙනවාය කියා ඒ අය කරුණු ඉදිරිපත් කළා. අගමැතිතුමා පිළිගත්තා, මේ සංක්‍රාන්තියේදී නොයෙක් විධියේ ගැටළු, ප්‍රශ්න මතු වන නමුත් ඒවා විසඳිය යුතු බව. ඒ නිසා, නොයෙක් ගැටළු මතු වුණත් 1968 වන විට මේ පරිවර්තනය සම්පූර්ණ විය යුතුයි කියා එතුමා කිව්වා. නමුත් මොකක්ද, සිදු වී තිබෙන්නේ ?

ශිෂ්‍යයන්ට තමන් කැමති භාෂාවකින් අධ්‍යාපනය ලබන්නට පුළුවන්ය කියා ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සනාතන සභාව තීන්දුවක් දුන්නා. කැමැති මාධ්‍යය කින් අධ්‍යාපනය ලබන්නට පුළුවන්ය කියන කරුණ නිසා තවම ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ගුරු මණ්ඩලය කෙරෙහි විශේෂ සැලකිල්ලක්, ගෞරවයක් තිබෙනවා. ඒ අය දක්ෂ උදවිය, ශ්‍රෙෂ්ඨ කටයුත්තක යෙදී ඉන්නා උදවිය හැටියට අප සලකනවා. ඒ නිසා ඔවුන්ගෙන් වැරදි සිදු වන්නේ නැහැ කියා මා කියන්නේ නැහැ. එසේ කැමති මාධ්‍යයකින් අධ්‍යාපනය ලබන්නට පුළුවන්ය කීවත්, අධ්‍යාපන මාධ්‍යය වශයෙන් ඉංග්‍රීසි භාෂාව තෝරා ගැනීමට බලපෑමක් කෙරෙනවා. මම් දන්නා නිසයි, ඒ බව කියන්නේ. මට ලැබී තිබෙන ආරංචිවල හැටියට; ශිෂ්‍ය යන්ට කියනවා—බල කිරීමක්, දඬුවමක් කිරීමක් කරන්නේ නැහැ—“ තමුසෙ සිංහලෙන් නැත්නම් දෙමළෙන් ඉගෙන ගන්නට ගියොත් මට උගන්වන්නට බැහැ, මට ඒ තරම් සිංහල/දෙමළ දැනීමක් නැහැ, ඉංග්‍රීසියෙන් නම් උගන්වන්නට පුළුවන් ” කියා. යම්කිසි පීඨයක මහාචාර්යවරයෙක් කියනවා නම්, “ මම සිංහල දන්නේ නැහැ, ඉංග්‍රීසි විතරයි දන්නේ, තමුසෙ සිංහලෙන් ඉගෙන ගන්නවා නම් වෙනත් කථිකාචාර්යවරයෙක් ළඟට යවන්නට පුළුවන් ” කියා එතැන බලපෑමක් නැද්ද ? ඉංග්‍රීසි තෝරා ගැනීම සඳහා අනියම් මාර්ගයෙන් වුවද බලපෑමක් තිබෙනවා. [බාධා කිරීමක්] කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම් තුමා පේරාදෙණියේ විශ්ව විද්‍යාලයෙහි සිදු වන දේ ගැන සොයා බැලුව හොත් මා මේ කියන කාරණා පිළිගනීවි. ඉහත සඳහන් කරන ලද බලපෑම නිසා විශ්ව විද්‍යාලයට ඇතුළත් වුණු, එහෙත් ඉංග්‍රීසි නො දන්නා ශිෂ්‍යයන් තිදෙනකු තම අධ්‍යයන මාධ්‍යය වශයෙන් ඉංග්‍රීසි භාෂාව තෝරාගෙන සිටිනවා. ඉංග්‍රීසියෙන් කරන කථා මොනවා දැයි නොදන්නා නමුත් තම අධ්‍යයන මාධ්‍යය වශයෙන් ඉංග්‍රීසි භාෂාව තෝරාගෙන සිටිනවා. “ ඉංග්‍රීසියෙන් ඉගෙන ගතහොත් මහාචාර්යතුමා ළඟට යන්නට පුළුවනි. එසේ නැතහොත් ඊට වඩා පහළ සිටින කෙනකු ළඟටයි, යන්නට සිදු වන්නේ ” යනුවෙන් කල්පනා කළ ඒ තිදෙනම ඉංග්‍රීසි මාධ්‍යය තෝරා ගත් බව නිසැකයි.

මෙම තත්ත්වය උඩ මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයයේ කථිකාචාර්ය ධුරයක් දරණ ඒ. වී. ඒ. ද සූසා සෙනෙට් මන්ත්‍රීතුමා විසින් පහත සඳහන් වන ප්‍රශ්නය අසා තිබෙනවා. මා මේ කියවන්නේ 1967 ජූනි මස 18 වැනිදා සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ හැන්සාඩ් වාර්තාවෙනුයි. මම ඉංග්‍රීසි සහ සිංහල යන භාෂා දෙකෙන්ම ඒ ප්‍රශ්නය කියවන්නම් :

“Will he state—(*a*) whether or not all students in all the Faculties of the University of Ceylon are receiving University instruction in the medium in which they sat the G. C. E. (A) Examination ? (*b*) *if not*, in which Faculties and in which subjects students are *obliged* to receive instruction in a medium different from that in which they sat the G. C. E. (A) Examination ? (*c*) in which Faculties and in which subjects students are permitted to receive instruction in a medium different from that in which they sat the G. C. E. (A) Examination ? ”

**ෂෙල්ටන් ජයසිංහ මයා.**

*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*

(Mr. Shelton Jayasinghe)

එයා තමයි, සිංහල නැති කෙළේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

තමුන්නාන්සේට වඩා හොඳින් එයා සිංහල දන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

පාර්ලිමේන්තු ලේකම්තුමාට මා දුන් ඒ ප්‍රශ්නය සිංහල භාෂාවෙනුත් කියවන් නම්.

"(අ) ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සියළුම පීඨවල සියළුම ශිෂ්‍යයන්ට ඔවුන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය ගත් මාධ්‍යයෙන් විශ්ව විද්‍යාල උගෙනුම ලැබේ ද නොලැබේ ද යනු එතුමා දන්වන්නේ ද? (ආ) නොලැබේ නම් අ.පො.ස. (උසස් පෙළ) විභාගය ගත් මාධ්‍යයට වෙනස් මාධ්‍යයකින් උගෙනුම ලැබීමට ඔවුන්ට සිදු වී ඇති පීඨ හා විෂයයන් කවරේද? (ඇ) අ.පො.ස. (උසස් පෙළ) විභාගය ගත් මාධ්‍යයට වෙනස් මාධ්‍යයකින් උගෙනුම ලැබීම සඳහා ශිෂ්‍යයන්ට ඉඩ දී ඇති පීඨ හා විෂයයන් කවරේ ද?"

ඒ ප්‍රශ්නවලට ලැබී ඇති පිළිතුරු මෙසේ යි:

"(අ) සමහර ශිෂ්‍යයින්ගේ මාධ්‍යය වෙනස් ව ඇත."

ඔන්න, වෙනස් වුණේ නැතැයි කිවා නොවැ.

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

වෙනස් කළාට මොකද කරන්නෙ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

වෙනස් කිරීමට බලපෑමක් තිබෙන බව මා කිවා.

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක නැති කරන්නෙ කොහොමද? අපේ ප්‍රතිපත්ති අප කියා තිබෙනවා. ශිෂ්‍යයන් හා ගුරුවරුන් කථා කරගෙන මොනවා කරනවාදැයි අප දන්නේ නැහැ. නොයෙකුත් බලපෑම් තිබෙන්නට පුළුවනි. ඒක නේන්නම් මුලදී බලය ඉල්ලුවේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

මාර්ග දේශකත්වය වෙනත් අතකට යන කොට මොකද කරන්නෙ?

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

"ඔටෝනොමි" එක ඕනෑ යයි එදා කිව්වේ?

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்சா)*
(Mr. Bernard Soysa)

වරදක් පෙන්වා දුන් පමණට එම වරදට දඬුවම් දීම සඳහා හිට්ලර්ගේ බලය අධ්‍යාපන ඇමතිතුමාට දෙන්ට මා කැමති වන්නේ නැහැ. මං මෙම වැරදි පෙන්වන්නේ මේවා හරිගස්සන්නට මාගී තිබෙන නිසායි. අධ්‍යාපනය පිළිබඳව ආඥාදායකත්වයක් පිහිටුවන්නට ඕනෑය කියා හැමදාම එතුමා කියනවා. මා ඒ කතාව පිළිගන්නේ නැහැ. අපේ රටේ අපරාධ සිදු වෙනවාය කියා ආඥාදායකත්වයක් පිහිටුවන්ටය කියනවාද? එහි (ආ) (i) දරණ පිළිතුර මෙසේ යි:

කලා පීඨයේ නීති දෙපාර්තමේන්තුවේ ශිෂ්‍යයන් 15 දෙනෙක් ඔවුන්ගේ පාඨමාලාවෙහි සියලුම විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගනිති.

එහි (ii) වන කොටසට දී තිබෙන පිළිතුර මෙසේ යි:

විද්‍යා පීඨයෙහි ශිෂ්‍යයින් තිදෙනෙක් භෞතික රසායන, උද්භිද හා සත්ව විද්‍යා අතුරෙන් තුනක් බැගින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගනිති.

දැන් ඒ තිදෙනාට සිදු වන්නේ මොකක් ද? ඒ තිදෙනාට ඉංග්‍රීසි භාෂාව තේරෙන්නේ නැහැ. ඒ අය අමාරුවේ වැටෙනවා; අතරමං වෙනවා.

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

පිළිගත්තේ ඇයි?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)

තෝරාගන්ට බලය තිබුණු නිසා වෙච්ච වරදනේ, එය. මා අනික් හරියට එන්නම්. තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය කුමක්ද කියා එතකොට තේරේවි. එහි (iii) වන කොටස මෙසේ යි:

> ඉංජිනේරු විද්‍යා පීඨයෙහි ශිෂ්‍යයින් 6 දෙනෙක් ඔවුන්ගේ ප්‍රථම වර්ෂයෙහි සියලුම විෂයයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදාරති.

ඇයි එසේ වන්ට හේතුව? ඉංජිනේරු අංශය කියා තිබෙනවා, අපට සිංහලෙන් උගන්වන්ට බැරිය කියා. පළමුවන වර්ෂයේ භාෂා දෙකේ ප්‍රතිපත්තියක්—bilingualism—තිබෙනවා. ඒකෙන් මොනවා කරනවාද මා දන්නේ නැහැ. [බාධා කිරීමක්] ද්විභාෂා ක්‍රමයක් තිබෙනවාය කියනවා. පළමුවන වර්ෂය ඉවර වුණාට පසු නියෝග කර තිබෙන්නේ ඉංග්‍රීසියෙන් පමණය කියායි. ඔන්න තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අපේ ප්‍රතිපත්තිය නොවෙයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

තමුන්නාන්සේගේ ප්‍රතිපත්තිය මෙයයි: ඊයාධිකාරීන්ගෙන් පටන් ගෙන සියළු දෙනාම තීරණය කර තිබෙන්නේ ගරු අගමැතිතුමා පොරොන්දු වුණු පිළිවෙළට ක්‍රියා කරන්ට නොවෙයි. ඒ අනුව 1968 දී නොවෙයි, අවුරුදු 10 කෙළෙවරේදී වෙනස් කරන්නයි ඒ අය කියන්නේ. අද බාලාංශයේ සිට සිංහලෙන් හෝ දෙමළෙන් ඉගෙන ගන්නා අය උසස් අධ්‍යාපනය ලබා ගන්නා තැනට එන්නේ තව අවුරුදු 10 ක් ගියාට පසුවයි. එම දස වර්ෂයම ගෙනයන්ටය කියන එකයි කියන්නේ. එවිට 1968 දී මේ කියන වෙනස ඇතිවන්නේ නැහැ. ඒක තමුන්නාන්සේ පිළිගන්නවාද? ඉංජිනේරු පීඨයේ පළමුවන වර්ෂයේදී ද්විභාෂා ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා. දෙවන වර්ෂයේ පටන් ඉංග්‍රීසිය නැතිනම් බැරිය කියනවා. දැන් අළුත් තීන්දුවක් අරගෙන තිබෙනවා. අළුතින් බන්දවා ගන්නා අය අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ පහළ පෙලේ විභාගය අනිවාර්යයෙන්ම ඉංග්‍රීසියෙන් ගත යුතුයි. මේවා ගරු ඇමතිතුමා දන්නේ නැහැ. ගරු ඇමතිතුමාට මේවා ගැන කිසිවකු කියන්නේත් නැහැ. මේවා සම්බන්ධයෙන් මෙම ස්ථානයේ ලොකු වග කීමක් දරණ අය එතුමාට මේවා ගැන දැන ගතයුතු යම් යම් කරුණු නොකියන නිසායි මා දොස් කියන්නේ. උසස් අධ්‍යාපන මණ්ඩලය මේවා දනගෙනයි සිටින්නේ. නමුත් තමුන්නාන්සේට ඇත්ත කියන්නේ නැහැ. එම මණ්ඩලයේ සිටින මහත්වරුන් පිළිබඳව විශේෂ ගරුත්වයක් මා තුළ තිබෙනවා. නමුත් එහි සිටින වැඩි දෙනාගේ සිත්වල තියෙන්නේ ඉංග්‍රීසිය ආරක්ෂා කළ යුතුය යන හැඟීමයි.

**ටී. බී තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B.. Tennekoon)

ඇමතිතුමාත් තවම ඉංග්‍රීසියමයි බදාගෙන ඉන්නේ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னட் சொய்சா)*
(Mr. Bernard Soysa)

එම නිසායි එතුමාට මෙම කරුණු ගැන දන්වා නැත්තේ. ඉංජිනේරු අංශයේ සිටිනවා, ශිෂ්‍යයන් තිදෙනෙක්. ඒ අය ඉංග්‍රීසි ඕනෑය කියා තෝරා ගත්තේ නැහැ. සිංහල භාෂාවෙන්, සිංහල මාධ්‍යයෙන් තමයි, උසස් පෙළ විභාගය ගත්තේ. ඒ මාර්ගයෙනුයි, ඇතුළත් වුණේ. ඒ අය අධ්‍යාපනය ලබා ගන්ට බලාපොරොත්තු වූණේ සිංහලෙනුයි. ඒ අයට ද්විභාෂා ප්‍රතිපත්තියට අනුව ඉගෙන ගන්නටයි දැන් නියම කර තිබෙන්නේ. නමුත් ඇත්තටම ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙනීම ලබා ගන්ටයි සිදු වී තිබෙන්නේ. එම නිසා මේ තිදෙනාට සිදු වන්නේ කුමක්ද? පළමුවන අවුරුද්ද අවසානයේදී පරීක්ෂණයක් පවත්වනවා. පළමුවන අවුරුද්දේ පවත්වන එම පරීක්ෂණයෙන් අසමත් වුවහොත් ඒ අයට සිදු වන්නේ කුමක්ද? ඒ පරීක්ෂණයෙන් අසමත් වූ විට ඉංජිනේරු විෂයය ඉගෙන ගැනීමට දක්ෂ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කමක් නැතැයි කියා වෙනත් අංශයකට මාරු වී යන ලෙස කරන නියමයට යටත් වන්නටයි සිදු වන්නේ. භෞතික විද්‍යාවත් කියා අංශයක් තිබෙනවා. ඒ අංශයේ මොනවා උගන්වන්නට බලාපොරොත්තු වෙනවාද කියා මා දන්නේ නැහැ. එතන උගන්වන්නේ ඉංජිනේරු කටයුතු නොවෙයි. පළමු වැනි පරීක්ෂණයෙන් අස මත් වූ විට ඉංජිනේරු විෂයයන්ගෙන් තොරව පැවැත්වෙන භෞතික විද්‍යා අංශ යට මාරුවන ලෙස නියම කරනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔය කියන්නේ තවම නොවූ දෙයක්.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
මා සඳහන් කළ තුන්දෙනා ඉගෙන ගන්නේ කොහොමද කියා මා ගරු අධ්‍යා පන ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
අනේ මා දන්නේ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
දැනට නම් තුන් හතර දෙනයි. ඉදිරි යේදී තව වැඩි වෙනවා. මා අද මේ ප්‍රශ් නය මතු කරන්නේ මෙය තවත් උග්‍ර වන ප්‍රශ්නයක් නිසයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
උග්‍ර වෙන්න දෙන්නේ නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
එහෙත් එහෙම දෙයක් නැත කියලයි, ගරු ඇමතිතුමා කියන්නෙ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
අපේ එවැනි නියමයක් නැහැ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
නියමක් නැහැ තමයි. හිතේ තිබෙන් නේ එක දෙයක්; කෙරෙන්නේ වෙන දෙයක්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඒ "ඔටොනමි" එක පිකක් වෙනස් කරන්නට ඕනෑ.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
මේ සාකච්ඡා කරන්නේ ඒ "ඔටෝනමි" ප්‍රශ්නය නොවෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මම කියන්නම්කො අපේ තත්ත්වය.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்ஞட் சொய்சா)*
(Mr. Bernard Soysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කළු කඩකාරයින් විසින් ජාතික පොළේ ඔවුන් ගේ ව්‍යාපාරය ගෙන යනවා යයි කී විට හිට්ලර්ගේ බලය තමන්ටත් දෙන්නය, එසේ නොදෙන්නේ නම් මොකවත් කරන්න බැරිය කියල ඒ ගැන වගකීමක් ඇති ගරු සෞඛ්‍ය ඇමතිතුමා කියනවා නම්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජීප් රථ මඟුල් ගෙවලටයි අනිකුත් කටයුතුවල ටයි පාවිච්චි කරනවා මිස කෘෂිකර්මය පිළි බඳ කටයුතු කෙරෙන්නේ නැත, සමුපකාර යේ දූෂණ තිබෙනවාය කියා පෙන් වූ විට "හදිසි නීති යටතේ මා බලය අරගෙන තිබෙන්නේ ඒ නිසයි" කියා ගරු කෘෂි කර්ම ඇමතිතුමා කියනවා නම්, මොකක් හරි වරදක් පෙන්වූ විට ගරු ඇමතිතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

ඒකාධිපතියකු වන්නට හදනවා නම් තත්වය මොකක්ද? අපේ රටේ වී වගා කරන්නට කෘෂිකර්ම ඇමතිතුමා ඒකාධිපතියකු වන්නට හදනවා. සංචාරකයින් මේ රටට ගෙන්වා ගැනීමට රාජ්‍ය ඇමතිතුමා ඒකාධිපති බලය ගන්නට බලනවා. විශ්ව විද්‍යාල වල තිබෙන වැරදි අස් කරන්නට ගරු අධ්‍යාපන ඇමතිතුමා ඒකාධිපති තත්ත්වයක් ලබන්නට බලනවා. මේ ප්‍රශ්න දෙක එකට කලවම් කරගෙන කථා කරන්නට ඕනෑ නැහැ. මෙතන "ඔටොනමි" ප්‍රශ්නයක් නැහැ. මේ කථා කරන්නේ වෙන දෙයක් ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊටත් වඩා අමාරුවකට පත් වන්නේ වෛද්‍ය අංශයට ගියාමයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

"ප්‍රැක්ටිකල්ස්" වලට ගියාම හොඳටම අමාරුයි.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ප්‍රතිපත්තිය කණපිට පෙරලෙන්නේ වෛද්‍ය අංශයට ගියාමයි. දැනටමත් පෙර ලීලා. මේ අංශයේ ඉතා දක්ෂ වෛද්‍යවරුන් සිටිනවාය කියා අපි පිළිගන්නට ඕනෑ. එහෙත් ඉංගිරිසි භාෂාවෙන් ඇත්ව කටයුතු කරන්නට එයින් සමහරෙකුගේ සූදානමක් නැහැ. ඔවුන් කියන්නේ "අපට මේ රෝහල්වල විශේෂඥ නිල ලැබී තිබෙන්නේ සිංහල භාෂාව පිළිබඳව දෙවැනි ප්‍රමාණයේ දැනීම අනුවයි; ඒ නිසා සිංහලෙන් උගන්වන්නය කියා අපට බල කරන්නට බැරිය" කියලයි. මේ තත්ත්වය උඩ වෛද්‍ය අංශයේ ඉංගිරිසි නැතිව බැරිය කියන තත්ත්වයයි ඇති වී තිබෙන්නේ. දෙවැනි වර්ෂය පටන් ගත්විට ඉංගිරිසි අවශ්‍යමයි. පළමු වැනි වර්ෂයේ නම් ඉගිරිසි නැතිව පුළුවන්. එයට හේතුව මේකයි: උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, රසායන විද්‍යාව භෞතික විද්‍යාව විශ්ව විද්‍යාලයේ උගන්වනවා. ඒ විෂයයන් හතර සිංහලෙන් උගන්වන්නට පුළුවන්. එහෙත් පළමු වැනි වර්ෂය අවසානයේ දී විශේෂඥයින් කියනවා ඔවුන්ට සිංහලෙන් ඉගැන්වීම කරන්න බැරිය කියලා. ඒ නිසා දෙවැනි වර්ෂයේ සිට ඉංගිරිසියෙන් උගන්වන්නේ. "1968 සිට අපි සිංහල භාෂාවට බහිනවාය, දෙමළ භාෂාවට බහිනවාය" කියා තමුන්නාන්සේලා කොපමණ කිව්වත් මෙහි වෛද්‍ය අංශය පිළිබඳව පිළිගෙන තිබෙන ප්‍රතිපත්තිය නම් ඉංගිරිසි නැතිව බැරිය කියන ප්‍රතිපත්තියයි. මෙතැනදී වැරදි හැඟීමක් ඇති කර ගන්නට වුවමනාවක් නැහැ. පොතපත කියවා දැනුම වැඩි කර ගැනීම සඳහා ඉංග්‍රිසි භාෂාව ප්‍රයෝජනවත්ය යන්න ගැන ප්‍රශ්නයක් නැහැ. එහෙත් පන්තිවල ඉගැන්වීමේදී, උගන්වන භාෂා මාධ්‍යය වශයෙන් ඉංග්‍රිසිය අවශ්‍ය නැහැ. මම අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියන්නම් එක් වැදගත් කාරණයක්. සිංහලෙනුත් දෙමළෙනුත් උගන්වන්නට බැරිය කියන විශේෂඥයන් අපේ රටේ සිටිනවා. එහෙත් ඒ භාෂාවලින් උගන්වන්නට සූදානමක් ඇති උදවියත් මේ රටේ සිටින බව ආඩම්බරයෙන් ගරු ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. සිංහලෙන් උගන්වන්නට සූදානමක් ඇති අය වෛද්‍ය අංශයෙත් ඉන්නවා. අපේ තීන්දුව මෙසේය යනුවෙන් පැහැදිලිව ප්‍රකාශ කර, 1968 සිට සිංහල භාෂාවෙන් උගන්වන්නට කටයුතු කළ යුතුය යනුවෙන් කිව්වොත් ඒ සඳහා වුවමනා කරන පිරිස ලැබෙනු ඇති. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නටයි තිබෙන්නේ. එසේ නොකළොත් ඒ අය ලැබෙන්නේ නැහැ.

**ටී. බී. ඉලංගරත්න මයා.** (කොලොන්නාව)
*(திரு. ரீ. பி. இலங்கரத்ன—கொலொன்னுவ)*
(Mr. T. B. Ilangaratne—Kolonnawa)

ගන්නවාද?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ඒ සඳහා නීති වෙනස් කරන්නට සිදු වේවි. රෝහල්වල ප්‍රතිකාර ලබන ලෙඩුන් පිළිබඳ විස්තර ලියන්නට සිදුවී තිබෙන්නේ දැනට බල පාන නීතිවල හැටියට ඉංග්‍රීසියෙන් විය හැකියි. එය එසේ නම් ඒ ගැන ක්‍රියා කළ යුතුව තිබෙනවා. නීතිය වෙනස් කරන්නට බලාපොරොත්තුවක් තිබෙනවා නම් වහාම ක්‍රියා කරන්න.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඒ නීතිය වෙනස් කරන්නට අමාරුයි.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
වුවමනා නම් පැය 24න් ඒ කාර්යය ඉෂ්ට කළ හැකියි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කියන විට එසේ වුවත්, මේ කාර්යය සඳහා පවා කොපමණ කාලයක් ගත වී තිබෙනවාද ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
ලෙඩුන්ගේ ඇඳන්වල සවි කර තිබෙන ඇඳ ඉහ වාර්තාවේ විස්තර ආදිය ලියා තැබිය යුතු භාෂාව සම්බන්ධ නීතිය වෙනස් කරන්නට බලාපොරොත්තුවක් තිබෙනවා නම් එය පැය 24 න් අනුමත කරන්නට විරුද්ධ පාර්ශ්වය ලෑස්තියි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)
පැයෙන්.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
අවිවාදයෙන්.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
දනුත් ඉංග්‍රීසියෙන් ලියන බවක් ප්‍රකාශ කරතත් ඇත්ත වශයෙන්ම ලියන්නේ ලතින් භාෂාවෙනුයි. ඉංග්‍රීසි අකුරු පමණයි පාවිච්චි කරන්නේ. රෝග විස්තර ලියන්නේත් ඉංග්‍රීසියෙන් නොවෙයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
එයින් තේරෙන්නේ ඉංග්‍රීසියෙන් කරන්නටත් බැරි බව නොවෙයිද ?

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்ஸா)
(Mr. Bernard Soysa)
මේ ප්‍රශ්නය නොවිසඳිය හැක්කක් නොවෙයි. 1965 දී ගරු අගමැතිතුමා සමග කළ සාකච්ඡාවේදී ගත් තීරණ ක්‍රියාත්මක නොවීම පමණක් නොවෙයි දැන් සිදු වන්නේ. ඒවා ක්‍රියාත්මක වීම වළක්වන්නට පුළුවන්ය කියා කල්පනා කරගෙන තමයි දැන් අවුරුදු දහයකුත් පරිවර්තනය කරන්නට කල් මදිය යන මතය උඩ පියවර අරන් තිබෙන්නේ. මේ අනුව අද සිට මෙය අවුරුදු දහයකට කල් දමනවා. අද විද්‍යා අංශයේ සිංහල මාධ්‍යයෙන් උගැනුම ලත් ශිෂ්‍යයින් තුන් දෙනෙක් සිටිතොත්, තමනට කැමති භාෂා මාධ්‍යය තෝරා ගන්නැයි ඒ තුන් දෙනාට කීවොත්, තමන් නොදන්නා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගෙනීම ලබන්නට ඒ අයට පුළුවන් වේවිද ? සිංහලෙන් ඉංජිනේරු අංශයේ ඉගෙනීම ලබන්නට කැමැත්තක් ඇතිව බැඳුණු අයට ඒ මාධ්‍යයෙන් ඉගෙනීමට පහසුකම් නොලැබුණොත් පාඨමාලාව කෙළවර වන විට පවත්වනු ලබන විභාගයේදී අසමත් වී පිට වී යන්නට සිදු විය හැකියි. එවැන්නක් සිදු වුවොත් ඉවරයි නේද ? වෛද්‍ය අංශය ගැන බලමු. දෙවැනි වර්ෂයේ සිට අනිවාර්ය වශයෙන් ඉංග්‍රීසියෙන් ඉගෙනීම ලබන්නට සිදු වෙතොත්, ඉංග්‍රීසි භාෂාව අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේ දී අනිවාර්ය විෂයයක් හැටියට සමත්විය යුතුයයි නියෝගයකුත් තිබෙනවා නම් ඒ මොන ප්‍රතිපත්තියක්දැයි මා අහනවා. මෙහි තිබෙන භයානකකම මෙයයි : 1965

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බර්නාඩ් සොයිසා මයා.]

දක්වා විශ්ව විද්‍යාලයෙන් මේ ප්‍රශ්නය විසඳීමට යම් පියවරක් ගෙන තිබෙනවා නම් ඒ පියවර පවා මකා දැමීමේ ප්‍රතිපත්තියක් තමයි දැන් අනුගමනය කර තිබෙන්නේ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් අයෙමත් ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

ඊළඟට කොළඹ අලුතෙන් පිහිටුවන්නට යන විශ්ව විද්‍යාලයයේ නීති අංශය ගැන බලමු. එහි වැඩ කරන්නට යන්නේ තනිකරම ඉංග්‍රීසියෙන්. මේ විධියට 1968 දී භාෂා වෙනස කරන්නේ කොහොමද? සිංහල භාෂාවේ සාධාරණ පාවිච්චියටවත් මේ නීති අංශයේ ඉඩක් නැහැ. දෙමළ භාෂාවට කොහෙත්ම නැහැ. මීට හේතු වන කරුණු තුනක් තිබෙනව. ඉංග්‍රීසියෙන් තොරව, සිංහලයෙන්, දෙමළයෙන්—ස්ව භාෂාවන්ගෙන්—උගන්වන්නට නම් පළමුකොටම නීතිය සංග්‍රහගත කළ යුතුයි. "කෝඩිෆයිඩ්" යන වචනය සඳහා සිංහලයෙන් "සංග්‍රහගත කිරීම" යන්න හරිදැයි මා දන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හරි හරි.



**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

සිවිල් නීති සංග්‍රහය, අපරාධ නීති සංග්‍රහය ආදී වශයෙන් නීති සංග්‍රහයන් තිබෙනවා. ඒ විධියට සිංහලයෙනුත් නීතිය සංග්‍රහගත කළ යුතුයි. ඊළඟට එය පිරිසිදු කොට නැවත ප්‍රකාශ කළ යුතුයි. තුන්වැනිව පරිවර්තනය කළ යුතුයි. මේ අංශ තුන— Restate the law; codify the law; translate the law. සංග්‍රහගත කිරීම, යළිත් ප්‍රකාශ කිරීම, පරිවර්තනය කිරීම— සම්පූර්ණ වනතුරු සිංහලයෙන් උගැන්වීමක් කරන්නට බැරිලු. මෙය අපට පිළිගන්නට බැහැ. ඒ කටයුතු දැන්මම පටන් නොගත්තොත් කවදාවත් ඒවා කෙරෙන්නේ නැහැ. අපගේ භාෂාවෙන් කියන්නට බැරි නීතියක් තිබෙනවා නම් ඒ නීතිය අපට වුවමනා නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒක හරි. මාත් එය පිළිගන්නවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பேர்னாட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

අපි ඒ අතින් මුල පුරා කටයුතු කරමු. එසේ කරතොත් දැන් තිබෙන අමාරුකම් ගැටළු විසඳා ගැනීමට කිසිම අමාරුවක් නැහැ. එහෙත් කටයුතු සිදුවන්නේ ඒ ක්‍රියා මාර්ගයේ ආරම්භය පවා කල් යන ආකාරයටයි. ආරම්භ කිරීම පවා කල් දමනවා. මෙහි තිබෙන නරකම ස්වභාවය එයයි. පටන් ගැනීමක්වත් නැහැ. ස්වභාෂාවන්ගෙන් මේ කටයුතු කිරීම දැන් දැන්ම පටන් නොගත්තොත් අප බලාපොරොත්තු වන ජාතික ස්වතන්ත්‍රය සම්පූර්ණ කර ගන්නට අපට කවදාවත් පුළුවන් වේයයි බලාපොරොත්තු වන්නට එපා. අප වාල් භාවයෙන් ගැළවේයයි හිතන්නට එපා. අප වාල් භාවයෙන් ගැළවේයයි හිතන්නට එපා. අපගේ සංස්කෘතික හා අධ්‍යාපනික ආයතනවල ඉහළම අංශ මේ ප්‍රතිපත්තියෙන් මේ දර්ශනයෙන් තොරව කටයුතු කරන්නට සූදානම් නොවනවා නම් වාල් බැම්මෙන් ගැළවෙන්නට අපට පුළුවන් වේයයි හිතන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එපා. දේශපාලන වශයෙන් අප වාල් බැම්වලින් ගැළවී සිටිනවායයි කියනවා, ආර්ථික වශයෙනුත් එයින් ගැළවීම පතනවායයි කියනවා. එහෙත් මානසික වශයෙන් එයින් ගැළවෙන්නට බලාපොරොත්තුවක් නැහැ. උසස් අධ්‍යාපනය පිළිබඳ විශෙෂඥයින් හැටියට අපගේ ගෞරවයට ලක්වී සිටින ගුරු මහත්වරුන් මේ විධියට කට යුතු කරන්නේ ඒ නිසායි. ඒ මාර්ගයෙන් ඉවත් වන්නට දැන් අවස්ථාවයි. මේ කරුණු මා විශෙෂයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය සඳහා ඉදිරිපත් කරනවා.

තුරඟ තරඟ පිටියෙහි පවත්වාගෙන යන විශ්ව විද්‍යාලයයේ බොහෝ අඩුපාඩුකම් තිබෙනවා. එහි ශබ්දවාහිනී යන්ත්‍රයෙන් කෙරෙන කථා සමහරුනට ඇහෙන්නේ නැහැ. කියන්නේ මොනවදැයි තෝරා ගන්නටත් බැහැ ; වචන පැහැදිලිත් නැහැ. මේ විධියේ අමාරුකම් රාශියක් මධ්‍යයේ දුප්පත් ගැමි ජනතාවගේත්, නගරයේ සිටින දුප්පතුන්ගේත් දරුවන් ඔය ස්ථානයට ගොස් සිටින්නේ උසස් අධ්‍යාපනයක් ලබා ගැනීමටයි. ඒ අයට එතැනවත් උසස් අධ්‍යාපනය සමග යම් තරමක සම්බන්ධකමක් ඇති කර ගැනීමට මාර්ග සැලසීම ගැන අපි සතුටුවන අතරම මේ මාර්ගයෙන් ඔවුන් රටවන්ට ඉදිරිපත් වීම ගැන නම් අපට කිසිම විධියකින් සතුටුවන්ට බැරි බව කිය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙ කරුණු ස්වල්පය තමයි, ගරු ඇමතිතුමාගෙ සැලකිල්ලට මම භාජන කරන්නෙ. විශ්ව විද්‍යාල ප්‍රතිසංවිධානය කිරීමේදී "පීඨයන්" වෙනුවෙන් "විද්‍යා ආයතනයන්" පිහිටුවීමේ අදහස—"Faculty" වෙනුවට "schools" පිහිටුවීමේ අදහස—පිළිගෙන මේ තිබෙන දුෂ්කරතාවන්ගෙන් තොරව මේ දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමට මාර්ග සලසනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා. ඒ සමගම ස්වභාෂාවට කර තිබෙන මේ අවමානයෙන් අධ්‍යාපනය ගලවා ගැනීමට දැන්වත් පියවර ගන්නා ලෙස ඉල්ලමින් මගේ කථාව මෙයින් සමාප්ත කරනවා.

අ. භා. 3.45

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1966 උසස් අධ්‍යාපන පනත සම්මත කළායින් පසුව එම පනතේ නීති යටතේ මේ ගරු අධ්‍යාපන ඇමතිතුමා මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කොට විවාදයට භාජනය වන පළමුවෙනි රෙගුලාසි මාලාව ගැනයි අද අප සාකච්ඡා කරන්නේ. මේ පනත යටතේ මීට ඉස්සරවෙලා එක්තරා රෙගුලාසි විශයක් මන්ත්‍රී මණ්ඩලය හමුවට ඉදිරිපත් කළ බව මට මතකයි. ඒ රෙගුලාසිවල තිබෙන වැරදි පෙන්වා දෙන්න පටන් ගත් හැටියේම අධ්‍යාපන ඇමතිතුමා ඒවා ඉල්ලා අස් කරගෙන විවාදය වළක්වා ගත්තා. එය සිදු වුණේ මීට මාස කීපයකට ඉස්සරවෙලයි. උසස් අධ්‍යාපන පනත යටතේ—මේ ගරු ඇමතිතුමා විසින්ම සම්පාදනය කොට, එතුමා විසින්ම නීති ගත කරන ලදුව, එතුමා විසින්ම පාලනය වන, එතුමා විසින්ම ක්‍රියාවට නංවනු ලබන උසස් අධ්‍යාපන පනත යටතේ—මේ ගරු සභාවට ඉදිරිපත් වී විවාදයට භාජනය වන පළමුවෙනි රෙගුලාසි මාලාවයි මේ.

"පුදන කොටම කාපි යකා" කියන්නා වගේ ඉස්සරවෙලාම මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ එකකට එකක් නොගැලපෙන, එකකට එකක් උඩින් පැනල පැරණි තත්ත්වයටම ආපසු යන රෙගුලාසි මාලාවකුයි. මේ විවාදයට මීට කලින් සහභාගි වුණු දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) පෙන්නුම් කර දුන්නා, මේ රෙගුලාසි එකකට එකක් ගැලපෙන්නෙ නැති හැටි. ඒකට කමක් නැතැයි එතුමා කී නමුත් මම ඊට ටිකක් එහාට ගිහිල්ල කියනව, ඒකට කමක් නැතිවා නොවෙයි, ප්‍රශ්නය ගැන හරි අවබෝධයක් නැතුව, කල්පනා නොකර රෙගුලාසි පනවන්න ගිය නිසා මේ රෙගුලාසිවලින් සම්පූර්ණයෙන් නීති විරෝධී වැඩක් කෙරී තිබෙනවා කියා.

උසස් අධ්‍යාපන පනතේ 103 වෙනි ඡේදය යටතේ ගරු අධ්‍යාපන ඇමතිතුමා පනවන නියෝගයක් මන්ත්‍රී මණ්ඩලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

ඉදිරියේ විවාද නොවී නීතිගත වෙනවා. එහෙත් උසස් අධ්‍යාපන පනතේ 34 වෙනි සහ 36 වෙනි වගන්ති යටතේ තමයි, මෙතෙක් පැවති ලංකා විශ්ව විද්‍යාලය දෙකට කපල—ඒ ලංකා විශ්ව විද්‍යාලය නමැති ශරීරය දෙකට කපල—එකක් ලංකා විශ්ව විද්‍යාලය කියාත්, අනික කොළඹ විශ්ව විද්‍යාලය කියාත් අධ්‍යාපන ඇමතිතුමා විසින් නම් කරන්ට යන්නෙ. එතුමාගේ ඒ අදහස ක්‍රියාත්මක වන්නේ නීතිගත වන්නේ, ගැසට් නිවේදනයක් මගින් එය පළ කර එය මහජන මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කර අනුමත කළදා සිටයි. උසස් අධ්‍යාපන පනතේ 34 හා 36 වන වගන්ති යටතේ මෙතෙක් පැවති ලංකා විශ්ව විද්‍යාලය දෙකට කැඩුවත් නැවතත් ලංකා විශ්ව විද්‍යාලයක් ඉතිරි වී තිබෙනවා. අධ්‍යාපන ඇමතිතුමා මේ රෙගුලාසි ගැන සඳහන් කිරීම ආරම්භ කළ අවස්ථාවේදී විශ්ව විද්‍යාලය හැඳින් වූයේ ලංකා විශ්ව විද්‍යාලය කියා නොවෙයි. එක් අතකින් එතුමා හරි. මෙය හැඳින්විය යුත්තේ ලංකා විශ්ව විද්‍යාලය කියා නොවෙයි, පේරාදෙණියේ විශ්ව විද්‍යාලය හා කොළඹ විශ්ව විද්‍යාලය කියායි. ගරු අධ්‍යාපන ඇමතිතුමා මේ රෙගුලාසි ඉදිරිපත් කරන ගමන් ඒ විධියට කිව්වා. නමුත් මේ රෙගුලාසිවල සඳහන්ව තිබෙන්නෙ එහෙම නොවෙයි.

අධ්‍යාපන ඇමතිතුමා මේ ගැසට් නිවේදනය ගැන විස්තර කරමින් මෙය මන්ත්‍රී මණ්ඩලය හමුවේ තබන අවස්ථාවේදී මා එතුමාගේ කථාවට කල්පනාවෙන් ඇහුම් කන් දීගෙන සිටියා. එතුමා ඉදිරිපත් කරන්නට යන්නේ මේ ගැසට් නිවේදනයේ තිබෙන කරුණුද නැත්නම් සාධාරණ මනුෂ්‍යයකු හැටියට මේ සම්බන්ධව එතුමාගේ හිතේ තිබෙන අදහස්ද කියා මා අසාගෙන සිටියා. මෙතෙක් ලංකා විශ්ව විද්‍යාලයට අයිතිව තිබුණු කොළඹ විශ්ව විද්‍යාල ශාඛාව පේරාදෙනියෙන් වෙන් කර කොළඹ විශ්ව විද්‍යාලයය කියා පටන් ගන්නවායයි එතුමා ප්‍රකාශ කළා. ඒ අදහස බොහොම හරි. පේරාදෙණියෙන් වෙන් කළාය කියා අදහස් කරන්නේ ඒ පේරාදෙණියේ පිහිටුවා තිබෙන ලංකා විශ්ව විද්‍යාලයේ අංශය පේරාදෙණිය නමින් හැඳින්වීම වෙන්නට ඕනෑ. නමුත් රෙගුලාසියේ එහෙම එකක් නැහැ. 36 වන ඡේදය යටතේ පනවා තිබෙන රෙගුලාසියෙන් ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණි ශාඛාවක් ගැන සඳහන් කරනවා. එතකොට ලංකා විශ්ව විද්‍යාලය කියා එකක් නොවෙයි තිබෙන්නෙ. නීතිය හමුවෙහි තිබෙන්නෙ ලංකා විශ්ව විද්‍යාලය කියා එකක් නොවෙයි. ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණි ශාඛාව කියා එකක් තිබෙන්නෙ. මේ රෙගුලාසි නීතිගත වූවාට පසු කොළඹ විශ්ව විද්‍යාලය කියා එකක් පටන් ගන්නවා. 103 වන ඡේදය යටතේ අනික් රෙගුලාසිය දැන් පනවා තිබෙන නිසා ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාවය කියා අනිත් එකත් තිබෙනවා. එතකොට විශ්ව විද්‍යාල හතරයි. ලංකා විශ්ව විද්‍යාලය, ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණි ශාඛාව, කොළඹ විශ්ව විද්‍යාලය, ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව කියා විශ්ව විද්‍යාල හතරයි. ඒ අනුව නීතිය ඉදිරියෙහි විශ්ව විද්‍යාල හතරක් තිබෙනවා. නමුත් ඇත්ත වශයෙන්ම අපට තිබෙන්නෙ පේරාදෙණියේ විශ්ව විද්‍යාලයත් අර පරණ රේස් පිටියෙ තිබෙන අශ්ව විද්‍යාලයත් පමණයි. ඇමතිතුමාම අටවා ගත් මේ රෙගුලාසි අනුව නීතිය ඉදිරියට විශ්ව විද්‍යාල හතරක් දමා තිබෙනවා. එමනිසා මෙවැනි වැදගත් කරුණු පිළිබඳව ගරු ඇමතිතුමාට උපදෙස් දෙන නිලධාරීන් මීට වඩා ප්‍රවේසමින් ක්‍රියා කළ යුතුව තිබෙනවා.

දැන් ඇමතිතුමා නැගිට ඉංග්‍රීසි රෙගුලාසිවලින් එවැනි දෙයක් අදහස් වෙන්නේ නැත කියා ප්‍රකාශ කරයිද කියා මා දන්නෙ නැහැ. නමුත් ඉංග්‍රීසි රෙගුලාසි දෙස බලන්නට මට වුවමනාවක් නැහැ. මේ මන්ත්‍රී මණ්ඩලයේ ඕනෑම විවාදයකට සහභාගි වන විට මේ මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කරන ඉංග්‍රීසි ලියවිලි දෙස බලන්නට මා කොහෙත්ම සූදානම් නැහැ. මගේ තර්ක ඉදිරිපත් කරන්නට මේ මන්ත්‍රී මණ්ඩලය හමුවෙහි තබන සිංහල ලියවිලිවල තිබෙන අදහස් උදහස් මට සම්පූර්ණයෙන්ම ප්‍රමාණවත් වෙනවා. දැන් මේ විග්‍රහය මා ඉදිරිපත් කරන්නේ මා හමුවට පත් කර තිබෙන සිංහල රෙගුලාසි අනුවයි. ඇයි මෙවැනි අවුලක් ඇති කරන්නේ? මේ විෂමතාවය පෙන්වා දෙන ගමන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එයින් එතරම් වරදක් නොවෙනවාය කියා දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා කිව්වා. එහෙත් මෙයින් වැරදි රාශියක් මතු වන බව පෙන්වා දෙන්නට මට අවසර දෙන්න. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා එය කියා සිටියේ අධ්‍යාපන ඇමතිතුමාට උපදෙස් දෙන අය නොසැලකිල්ලෙන් ක්‍රියා කරන බව පෙන්වීමට පමණයි. මේ නොසැලකිලි මත්කම නිසා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් රාශියකට නීත්‍යානුකූලව ලැබිය යුතු අයිතිවාසිකම් රාශියක් නැතිව යන්නට පුළුවන්. 103 වන ඡේදය යටතේ පනවා තිබෙන ඒ රෙගුලාසිය අනුව අළුතින් පිහිටුවන "කොළඹ විශ්ව විද්‍යාලය" හැඳින්වෙන්නේ "ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව" යනුවෙනුයි. ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව විද්‍යාල මණ්ඩපයක් වශයෙන් සැලකිය යුතුයි. අද වැඩ කටයුතු අවසානයේදී මේ ගරු සභාව මේ අංක 1 සහ 2 අනුමත කරනවා. එසේ අනුමත කිරීමෙන් පසුව ඇති වන නීත්‍යානුකූල තත්ත්වය "ලංකා විශ්ව විද්‍යාලය" සහ "කොළඹ විශ්ව විද්‍යාලය" යනුවෙන් විශ්ව විද්‍යාල දෙකක් පිහිටුවීමයි. නමුත් 1967 ජූනි 8 වැනි දා සිට බලපවත්වන නවත් නීතියක් තිබෙනවා. මේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අත්සනින්ම නිකුත් කරන ලද ඒ රෙගුලාසිය මොකක්ද? ඒ රෙගුලාසිය අනුව උසස් අධ්‍යාපන පනතේ 59 සිට 62 දක්වා වූ වගන්තිවල අවශ්‍යතාවයන් සඳහා—ඒ අවශ්‍යතාවයන් මොනවාද කියා නව මොහොතකින් මා තෝරා දෙන්නම්—ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව විද්‍යාල මණ්ඩපයක් වශයෙන් සැලකිය යුතුයි. අද සවස මේවා සම්මත වීමෙන් පසුව "ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාව" තිබෙන්නේ කොහේද?

ගරු ඉරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

ඒක තමයි කියන්නේ, අද සවසෙන් පස්සේ නැහැ කියල.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

එතකොට කොහාටද, මේ රෙගුලාසිය බලපවත්වන්නේ? ගුවනටද, හඳටද, මේවා බලපවත්වන්නේ? ඇමතිතුමා කියන්නේ, මේ යෝජනාවලින් වැරද්දක් වන්නේ නැති බවද? වරද අතටම අහුවුණාමවත් අඩු ගණනේ පිළිගන්න. පිළිගෙන, ඒ වැරදි හරිගස්සා ගන්න. "මේ යෝජනා විවාදයක් නැතිව සම්මත කරන්න" කියා අපට කියනවා. මේවා පෙන්නා නොදුන්නොත් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් සිය දහස් ගණනකට බරපතල අමාරුකම්වලට මුහුණ පාන්නට සිද්ධ වෙනවා. මේ කියන රෙගුලාසිය යටතේ උසස් අධ්‍යාපන පනතේ 59 සිට 62 දක්වා වගන්ති අදාළ වන්නේ ශිෂ්‍ය සංගම්වලටයි. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනික කාල සීමාව තුළ, අධ්‍යාපනයෙන් බැහැරව කෙරෙන අනෙකුත් කටයුතු රාශියක් සම්බන්ධයෙන් සංගම් රාශියක් තිබෙනවා. මෙයින් කියැවෙන්නේ, ඒ සංගම්වල සාමාජිකයන් කෙරෙහි බලපාන්නේ කවුද කියායි. උසස් අධ්‍යාපන පනතේ 10 වන කොටස අනුව —Student Unions and student councils of a University—විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංගම් ආදිය පාලනය කරන්නේ කවුද? මේවායේ බලතල මොනවාද? මේවා යටත් විය යුත්තේ කාගේ පාලනයකටද? මේවාට මුදල් හදල් ලබෙන්නේ කාගෙන්ද ආදී වශයෙන් විස්තර රාශියක් මේ ඡේද 4 ට අතුළත් වී තිබෙනවා. මුල් පනතේ 60 වන ඡේදයේ 2 (බී) කොටස යටතේ මේ ශිෂ්‍ය සංගම්වල සාමාජිකයන් පාලනය වන්නේ උප කුලපතිවරයා යටතේයි. ශිෂ්‍ය සංගම්වල නිලධාරීන් හා සෙසු සාමාජිකයන් තම ආයතනයේ උප කුලපතිවරයාගේ පාලනයට යටත් විය යුතුයි. එහෙම නම්, ඇමතිතුමා නීතිගත කර තිබෙන මේ රෙගුලාසි යටතේ උප කුලපතිවරයා කවුද? ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාවේ උප කුලපතිවරයා කවුද? කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා කියා අළුත් කෙනෙක් ඉන්නවා. නමුත් ලංකා විශ්ව විද්‍යාලයේ කොළඹ ශාඛාවේ උප කුලපතිවරයාගේ පාලනයට මේ ශිෂ්‍ය සංගම් හැම එකක්ම යටත් විය යුතුයි. මහ අවුලක් පැන නඟිනවා. තම විශ්ව විද්‍යාලයේ සිටින උප කුලපතිතුමාට විශ්ව විද්‍යාලය පාලනය කරන්නට බලයක් නැතැයි කියන්නට ශිෂ්‍ය සංගම් ඉදිරිපත් විය හැකියි. එසේ හෙයින් වහාම අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කළ යුතුයි. මුල් පනත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
සාකච්ඡා කරද්දී විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනකු විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන ඒ වූ පරිද්දෙන්ම පිළිගත්තා නම් විශේෂයෙන්ම මේ හතර වන ගැසට් නිවේදනය මේ විධියට ඉදිරිපත් කරන්නට ගරු අධ්‍යාපන ඇමතිතුමාට සිදු වන්නේ නැහැ. එපමණක් නොව එසේ කළා නම් මෙම විවාදයේදී අප විසින් නගනු ලබන චෝදනා එසේ නගන්නට වුවමනාවක් වන්නේත් නැහැ. මුල් පනත සාකච්ඡා කරද්දී විරුද්ධ පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන පිළිගත්තා නම් වැඩේ හුඟක් දුරට සතුටුදායක වෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Sitting is suspended for 30 minutes. On resumption, the Hon. Deputy Chairman of Committees will take the Chair.

**රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමාගේ [ශ්‍රීමත් රසික් ෆරීඩ්, ඕ. බී. ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.**

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. குழுக்களின் உப அக்கிராசனர் [ஸ்ரீமான் ருசிக் பரீத், ஓ.பி.ஈ.] தலைமைதாங்கினார்.

*Sitting accordingly suspended till 4.30* P.M. *and then resumed,* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [SIR RAZIK FAREED, O.B.E.], *in the Chair.*

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම විවාදය තාවකාලිකව නවතා තේ පානය සඳහා විසිර යන අවස්ථාවේදී මා කියමින් සිටියේ, මුල් පනත සාකච්ඡා කරන අවස්ථාවේදී විරුද්ධ පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සංශෝධන පිළිගත්තා නම්, අද ගරු ඇමතිතුමා මෙම රෙගුලාසි ඉදිරිපත් කරන ගමන් කියා සිටියා වගේ අපට විවාදයක් නැතිවම මෙම රෙගුලාසි අනුමත කරන්නට ඉඩ ලැබෙන බවයි. මුල් පනතේ තිබෙන අඩුපාඩුකම් නිසා විශ්ව විද්‍යාලයේ ඇතැම් කටයුතු හරියට නොකෙරෙන බව මෙම අවස්ථාවේදීවත් ගරු ඇමතිතුමාට පෙන්වා දිය යුතු නිසයි, අද විවාදයක් අවශ්‍යව තිබෙන්නේ. ඔව්, විවාදයට තුඩු දී තිබෙන්නේ ඒ කාරණයයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරන්නේ එක කාරණයක් ගැන පමණයි. විශ්ව විද්‍යාලයේ භාෂා මාධ්‍යය ගැන පමණයි. විශ්ව විද්‍යාලයේ උසස් අධ්‍යාපන කටයුතු සියල්ලක්ම මාතෘ භාෂාවෙන් කළ යුතු යයි දැක්වෙන වගන්තියක් මුල් පනතට ඇතුළත් කළ යුතු බව එදා විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් කියා සිටියදී ගරු අධ්‍යාපන ඇමතිතුමා ඊට පිළිතුරු වශ වශයෙන් කීවේ, “ ඒක මේකෙ අමුතුවෙන් සඳහන් කරන්නට ඕනෑ නැහැ, ඒක වෙන නීතිවලින් පිළිගෙන තිබෙනවා, ඒ නිසා ඒක ඉබේටම ක්‍රියාවේ යෙදවෙනවා ” යනුවෙන් බව එතුමාට මතක ඇතැයි මා කල්පනා කරනවා. එහෙත් දැන් සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? රාජ්‍ය භාෂාව එකක්. ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය දෙන්නේ එක භාෂාවකින්. විශ්ව විද්‍යාලයෙහි උසස් අධ්‍යාපනය දෙන්නේ තවත් භාෂාවකින්. එදා උසස් අධ්‍යාපන පනතෙහිම ඒ නීතිය ඇතුළත් කළා නම්, භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ නීතිය ඇතුළත් කළා නම්, සිංහලයට විරුද්ධ හා ඉංග්‍රීසියට ගැතිකම් කරන සමහර මහාචාර්යවරුන්ට තම තමන් කැමති භාෂාවලින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය දෙන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. දැන් ඔබතුමාට අවබෝධ වෙනව ඇති, මුල් පනතේ තිබෙන අඩුපාඩුකම්. විශ්ව විද්‍යාලයේ පාලනය හා නිදහස ගැන කතා කරන හැම අවස්ථාවකදීම ගරු අධ්‍යාපන ඇමතිතුමා ඉංග්‍රීසියෙන් සිංහලට හරිගස්සා ගත් වචනයක් පාවිච්චි කරමින් කතා කරනවා. “ ඔටොනොමිය ” හොඳ නැත; එනිසායි, මේ හැම ඇබැද්දියක්ම මේ හැම විපත්තියක්ම මේ හැම අබග්ගයක්ම උසස් අධ්‍යාපනයෙහිලා සිදුවී තිබෙන්නේ ” යන්නයි, එතුමා කියන්නේ. එම නිසා එතුමා විශ්ව විද්‍යාලයේ සිටින උදවියගේ “ ඔටොනොමිය ” ටිකක් කපා දමා තමන්ට සෑහෙන විධියක ඔටොනොමියක් ඇති කර ගත්තා. පසු ගිය අවුරුදු එක හමාරක් පමණ කාලයක් තුළදී තමුන්නාන්සේගේ ඔටොනොමිය භරියාකාර පාවිච්චි කළාද කියන ප්‍රශ්නය මා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමාගෙන් අහනවා. තමුන්නාන්සේට මෙම පනතින් ලැබී තිබෙන ඔටොනොමිය හරියාකාර ක්‍රියාවේ යෙදුවා නම් අද ඔය විශ්ව විද්‍යාලයන්හි පැනනැගී තිබෙන තත්ත්වය ඇති වන්නේ නැහැ.

තමුන්නාන්සේ රාජ්‍ය භාෂා ව්‍යාපාරය සඳහා හොඳට දහඩිය හෙලූ කෙනෙක්ය කියා මෙම අවස්ථාවේදී මා ගරු අධ්‍යාපන ඇමතිතුමාට කියා සිටිනවා. 1956 ට පෙර රාජ්‍ය භාෂා ව්‍යාපාරය සඳහා තමුන්නාන්සේ කොතෙක් දුරට මහන්සි ගත්තාද යන්න අපි දන්නවා. එදා තමුන්නාන්සේත්, රටත් පිළිගත්තා ලද එම ප්‍රතිපත්තිය, නවත් විධියකින් කියනවා නම් මෙම මන්ත්‍රී මණ්ඩලය නීතිගත කළ එම ප්‍රතිපත්තිය අද විශ්ව විද්‍යාලවල ක්‍රියාවෙහි යෙදෙනවාද ? රාජ්‍ය භාෂාවය යනුවෙන් පිළිගත්තා ලද එක්තරා භාෂාවක් තිබෙනවා. එය පසෙකින් තිබියදී විශ්ව විද්‍යාලවල උසස් අධ්‍යාපනය සිදුවන්නේ කුමන භාෂාවකින්දැයි ටිකක් සොයා බලන්න. පේරාදෙණියේ කඳු නගින එක අමාරු නම් ඊට වඩා කිට්ටුව කොළඹ පිහිටි විශ්ව විද්‍යාලයට ගිහින් බලන්න. එහෙම නැතිනම් පෑලියගොඩට හෝ ගංගොඩවිලට ගිහින් බලන්න. ගංගොඩවිල සමහර විද්‍යාවන් තනිකර සිංහල මාධ්‍යයෙන් කරන්ට පුළුවනැයි එම විද්‍යා පීඨයන් භාර කථිකාචාර්යවරුන් කියා සිටියදීත් තමුන්නාන්සේගේ අනු දැනුම ඇතුව පත් කරන ලද උසස් අධ්‍යාපන මණ්ඩලය ඊට හරස් කපන බව තමුන්නාන්සේ දන්නවා ද ?

මෙම අවස්ථාවේදී මා ටිකක් තොරතුරු දන්නා කාරණයක් සඳහන් කරන්ට කැමතියි. අද තිබෙන විශ්ව විද්‍යාල අතුරින් සිංහල මාධ්‍යයෙන් නීතිය ඉගැන්වීමට පටන් ගත් එකම නීති විද්‍යාපීඨය තිබෙන්නේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේයි. නීති අධ්‍යාපනය තමුන්නාන්සේගේ නිදහස් අධ්‍යාපනයට ඇතුළත් වෙච්ච එකක් නොවෙයි. ඒක බොහෝම පහත් අධ්‍යාපනයක් හැටියටයි, තමුන්නාන්සේ සලකා ඇත්තේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
බොහොම වැදගත්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
මා කියන්නේ වැදගත්කමක් ගැන නොවෙයි. උසස් අධ්‍යාපන ආයතනවලින් නීති උපාධි ලබා ගත්තත් ඒ උපාධි යටතේ නීති වෘත්තියට ඇතුළත් වෙන්ට ලැබෙන්නේ නැහැ. ඒ සඳහා අළුත්කඩේ කන්ද නැගලා එතන පිහිටි ස්කෝලෙටම යන්ට ඕනෑ. ගාස්තු ගෙවාගෙන එතැනින්ම විභාගය පාස් නොකළොත් අළුත්කඩේ උසාවියට කළුකෝට් දාගෙන යන්ට ලැබෙන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
අවුරුද්දක්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
එතෙන්ට අවුරුද්දක් හෝ යන්ට ඕනෑ. අවුරුද්දක් ගියාට මොකද අවුරුදු තුනක ගාස්තු ගෙවන්ට ඕනෑ. කොහොමද සාධාරණත්වය ? පන්තියට යන්නේ එක් අවුරුද්දයි. අවුරුදු තුනකට ගෙවන්න ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
ඔටොනොමිය.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)
ඒ ඔටොනොමිය කපන්න. ඒක උදුරා විසි කරන්න. විශ්ව විද්‍යාල උපාධියක් ඒ සඳහා ප්‍රමාණවත් යයි සිතන්න. ඒක උසස් අධ්‍යාපනයට අයත් අංගයක් නොවෙයිද ? මිනිසුන්ගේ ජීවිත පිළිබඳ සම්පූර්ණ වගකීම භාරදෙන වෛද්‍යවරයා පුහුණු කරන්නේ විශ්ව විද්‍යාලයයි. නමුත් ඉඩම් අක්කර කාලක් පිළිබඳ අයිතියක් විසඳීමට විශ්ව විද්‍යාලයකින් උපාධිලත් නීතිඥයෙකුට බැහැ. ඒක බපරතල වරදක්. තමුන්නාන්සේලාගේ රජය යටතේ පමණක් නොවෙයි, ගිය ආණ්ඩුව යටතේත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]
දොස්තරවරුන් ඉංජිනේරුවන් විද්‍යා උපාධිධාරීන් කලා උපාධිධාරීන් සහ වෘත්තිය පුහුණුව ලබන අනිකුත් හැම කෙනෙක්ම නිදහස් අධ්‍යාපනය යටතේ මොකක් හෝ විශ්ව විද්‍යාලයකින් නොමිලයේ අධ්‍යාපනයක් ලබනවා. මේ නීති වෘත්තිය පමණක් උසස් අධ්‍යාපනයෙන් ඈත් කර තිබෙන්නේ ඇයි? නීති වෘත්තියට ඇතුළත් වීමට පමණක් ගාස්තු අය කිරීමට ඉඩකඩ සලසා තිබෙනවා.

**එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.** (මීගමුව)
*(திரு. என். டென்சில் பெர்னாண்டோ—நீர்கொழும்பு)*
(Mr. N. Denzil Fernando—Negombo)

උපාධියක් ලබාගෙන නීතිඥ මහත්මයෙක් වන්නට පුළුවන්කමක් වෙන රටවල තිබෙනවාද?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

වෙන රටවල නැත්නම් මේ රටෙන් වත් පටන් ගන්නකො.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்னாண்டோ)*
(Mr. Denzil Fernando)

අවුරුදු 9 ක් තිස්සේ පටන් නොගත්තේ ඇයි?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නීතිඥ වෘත්තියේ මහත්මයෙක් මා කියන අදහසට දක්වන විරුද්ධත්වයයි ඒ. මා අද ඉදිරිපත් කළ පනත් දෙකට බලවත්ම විරුද්ධත්වය ලැබෙන්නේ මාත් කොටස්කාරයකු වන තමුන්නාන්සේලාගේ නීතිඥ වෘත්තියෙනුයි. මේකට ඇතුළත් වන්නට ගාස්තු අයකරනවා. ඇතුළත් වුණාට පසුව කරන්නේ මහජනයා සූරාකෑමයි. මේ තත්ත්වය නැති කිරීමේ මාර්ගයක් තමුන්නාන්සේලාට ලැබී තිබෙනවා. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න. එසේ කළොත් තමුන්නාන්සේටත් මිනිස්සු පිං දේවි. මේ අවස්ථාව ප්‍රයෝජනයට ගෙන අහිංසක මිනිසුන්ට මුහුණපෑමට සිදුවී ඇති විපතින් ඔවුන් බේරා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා සඳහන් කරමින් සිටියේ විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ නීති අංශය ගැනයි. එය භාරව කටයුතු කරන විද්‍යාර්ථීන් කියා සිටිනවා අපි මේ දක්වා නීති විෂයය සිය බසින් නැත්නම් සිංහලෙන් උගන්වා තිබෙනවා, අපට සිංහලෙන් උගන්වන්නට පුළුවන් කියලා. උපාධි තත්ත්වයට යන තෙක් එය සිංහලෙන් කරන්නට පුළුවන් යයි ඔවුන් කියනවා. එහෙත් ගරු ඇමතිතුමාගේ උසස් අධ්‍යාපන මණ්ඩලයේ සිටින පණ්ඩිතයින් එයට ඉඩ දෙන්නේ නැහැ. ටිකක් සොයා බලන්න. සිංහල මාධ්‍යයෙන් නීති විෂය ඉගැන්වීමේ සිරිත අත්හැර දමා නැවතත් ඉංගිරිසියෙන් උගන්වන ලෙස ඒ කථිකාචාර්යවරුන්ට උසස් අධ්‍යාපන මණ්ඩලය බල කරනවා. එය නීති විරෝධිද? එය නීති විරෝධි වන්නේ උසස් අධ්‍යාපන පනතට භාෂා මාධ්‍යය ඇතුළත් කර තිබුණා නම් පමණයි. දැන් මෙය රීති විරෝධි දෙයක් පමණයි. බලකිරීමක් උඩ ඉංගිරිසියට ගැතිකම් කරන උසස් අධ්‍යාපන මණ්ඩලයේ සිටින මේ උසස් පුද්ගලයින් නිසා අමාරුවෙන් හෝ කැමැත්තකින් හා ආදරයකින් ස්වභාෂා මාධ්‍යයෙන් නීති විෂයය ඉගැන්වූ කථිකාචාර්යවරුන්ට තවදුරටත් එය කරගෙන යෑමට අවස්ථාවක් නැතිව ගොස් තිබෙනවා. ඔවුන් කරගෙන ගිය ඒ ජාතික සේවය ඉටු කිරීමට ඔවුන්ට අවස්ථාව නැති වී ගොස් තිබෙනවා. උසස් අධ්‍යාපන මණ්ඩලයේ සමහර උදවිය තරුණ කාලයේදී ඉංගිරිසියෙන් බොහොම ආශ්වාදයක් ලැබූ අයයි. ඔවුන් පසුගිය කාලයේදී සිංහල දෙස ටිකක් බලා, සිංහල හා අත්වැල් බැඳගෙන සිටි එක ඇත්ත. දැන් මහළු වයසට ගොස් නැවත වරක් ඉංගිරිසිය දෙස බලාගෙන කෙළ හලන බවයි පෙනෙන්නේ. තරුණ වියේදී ඉංගිරිසිය සඳහා ඔවුන් දක්වූ ඒ කුළුපිකම වයසට යන විට නැවත ඇති වී තිබෙනවා. රජය පිළිගත් ප්‍රතිපත්තිය, රට අනුමත කළ ප්‍රතිපත්තිය, අයින් කර දමා මේ උසස් අධ්‍යාපන මණ්ඩලයේ සිටින ඉංගිරිසියට කැදර සමහරුන්ගේ ඒ කැදරකම් අනුව විශ්ව විද්‍යාලයවල භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ගරු ඇමතිතුමා ඉඩ දෙනවාද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රූස්වීමක වාර්තාවක් පසුගිය දවසක පත්තරයේ තිබෙනවා මා දැක්ක. මේ උසස් අධ්‍යාපන මණ්ඩලයේ ගරු සභාපති මහත්මයා මූලාසනයේ තබාගෙන ලංකාවේ උසස් බෞද්ධ අධ්‍යාපන ආයතනය වශයෙන් හඳුන්වන ආනන්ද මහා විද්‍යාලයේ ත්‍යාග ප්‍රදානෝත්සවයකදී එහි විද්‍යාලයාධිපතිවරයා කළ කථාවක් ඒ වාර්තාවට අඩංගු වී තිබුණා. ඒ කථාවෙන් දී තිබුණු අදහස ඒ විද්‍යාලයාධිපතිතුමාට පමණක් සීමා වී තිබෙන එකක් නොවෙයි. උසස් අධ්‍යාපන මණ්ඩලයේ සභාපති මහත්මයාත් අනිකුත් සාමාජික මහත්වරුත් ඒ අදහසට හවුල්කාරයෝ. ඉංගිරිසිය නැතිව අපට කවදාවත් ඔළුව උස්සන්නට බැහැ කියනවා. ඉංගිරිසිය නැත්නම් අපට ජීවත් වන්නට සිදු වන්නේ සදහටම අඳුරේ යයි කියන්නත් ඉන්නවා. ඉංගිරිසිය නැත්නම් කවදාවත් මේ රට දියුණු නොවන බවකුත් ඒ උදවිය කියනවා. මෙවැනි පටු, දීන අදහස් ඇති උදවිය උසස් ස්ථානවලදී උසස්යයි සැලකෙන පුද්ගලයන් හමුවේ ජනතාවට ඇසෙන ආකාරයට මෙවැනි අදහස් පළ කරන්නට ඉඩ ලබා ගැනීමට හැකි තත්ත්වයක සිටීම කොයි තරම් ජාතික අභාග්‍යයක්දැයි කල්පනා කරන්න. අප ජීවත් වන මේ යුගයට අනුව නිදහස් ජාතියකැයි රටට ප්‍රකාශ කරමින් මේ උදවිය ගැතිකම් දක්වන්නේ එදත් අප පාලනය කළ අධිරාජ්‍යවාදීන්ගේ භාෂාවටයි. මේ දීනකම්, ගැතිකම්, මේ ආකාරයෙන් පවතිද්දී කවදාවත් අපට ලෝකයා ඉදිරියේ නිදහස් නිවහල් ජාතියකට අයත් වූවන් හැටියට හිස ඔසවා සිටින්නට පුළුවන්ද? මෙවැන්නත් කොයි තරම් විළිලජ්ජා විය යුතුද? මෙවැනි මිනිසුන් අපේ රටේ ප්‍රභූන් හැටියට සමාජයේ උසස් තැන්වල පෙනී සිටිමින්, මහ තැන්වල අසුන් අරාගෙන සිටීම ගැන අප කනගාටු විය යුතුයි. එය වඩාත් බරපතළ වන්නේ උසස් අධ්‍යාපන මණ්ඩලය වැනි ආයතනයක—මේ රටේ මිනිසුන්ගේ අනාගතය හැඩගස්සන, සකස් කරන ආයතනයක—වැඩ කටයුතු පිළිබඳ වගකීම පැවරී ඒ තරම් වැදගත් ආයතනයක සාමාජිකත්වය දරණ පුද්ගලයන් මීට වඩා තේජාන්විත උසස් අදහස් දරන්නන් වෙන්නට ඕනෑ නිසයි. අපේ ජාතියට ආවේණික වූ භාෂාවක් ඇතත් එය හදාරා අපට කවදාවත් හරි යන්නේ නැතැයි කියන තත්ත්වයට අප වැටී සිටිතොත්, තව දුරටත් අපට ලෝකයේ ශීලාචාර ජාතියක් හැටියට නැඟී සිටින්නට පුළුවන්ද? මෙය මොන විළිලජ්ජා නැතිකමක්ද? එය මොන පව්කාරකමක්ද? අධිරාජ්‍යවාදීන්ගේ භාෂාවක් නිසා අපේ ඇතැමුන් කොයි තරම් දුරට පිරිහී ගොස් සිටිත්දැයි සිතා බලන්න. තමන්ගේ ජාතික භාෂාව ගැන ආඩම්බර වන්නට තරම් චරිත ශක්තියක් නැතිකම නිසා, වුවමනා කරන විෂයයන් ඒ භාෂාවෙන් හදාරන්නට බැරි බවක් ලෝකයාට ඇසෙන්නට කියන්නට තරම් මේ අය දුර්වලව සිටීමත් පුදුමයට කාරණයක් නොවෙයිද? බෞද්ධ ධර්මය වැනි ඉතාමත් ගැඹුරු විෂයයන් පවා සිංහල භාෂාවෙන් ඉගෙනීමට පුළුවන් නම්—මේ වාගේ ලෞකික විෂයයන් නොව බෞද්ධ දර්ශනවාදය වැනි ලෝකය ඉක්මවා යන විෂයයන් පවා සිංහල භාෂාවෙන් ඉගෙනීමට පුළුවන්කමක් තිබුණා නම්—විද්‍යාව වැනි විෂයයන් ඉගෙනීමට බැරිකමක් නොතිබිය යුතු බව ඔබතුමා දන්නවා ඇති. අපේ එදිනෙදා ජීවිතයේ ඇති වන ප්‍රශ්න සම්බන්ධයෙන් යම්කිසි දෙයක් අපේ භාෂාවෙන් අපේ මිනිසුන්ට උගන්වන්නට පුළුවන් කමක් අපට නැද්ද?

මේ දීනකමට, ගැතිකමට, නිවට නියාලුකමට හේතු මොනවාද? පසුගිය අවුරුදු කිහිපය තුළ අපට ලැබුණු අධ්‍යාපනයේ වරද මෙයට හේතුවක් බව පිළිගන්න ඕනෑ. මේ උදවිය ඒ කාලයේ දී ලත් අධ්‍යාපනයේ වරදින්ම මේ අය මේ ආකාරයට කල්පනා කරනවා වෙන්නට පුළුවනි. එවැන්නත් අපේ අනාගත පරම්පරාව හදන්නේ කොහොමද? අපේ භාෂාව කෙරෙහි, අපේ ජාතිය කෙරෙහි, අපේ රට කෙරෙහි සැලකිල්ලක් නැති උදවියගෙන් අපට බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද? ඈත පිටිසර ඉස්කෝලයක සිංහල භාෂාවෙන් "අ" යන්න "ආ" යන්න ආදි වශයෙන් උගත් ළමයින්, අපේ උසස් අධ්‍යාපන ආයතනයේ සභාපතිතුමා අපේ රටේ උසස්ම අධ්‍යාපන ආයතනයක් වන බෞද්ධ ආයතනයේ ලොකු මහත්මයා ඉදිරියේදී කළ කථාවකින් ඉංගිරිසිය නැත්නම් අපට හිඟා කන්නට


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

වෙනවාය කී බව දැන ගත්තාම මොකක්ද සිදු වන්නේ ? පිටිසර ගොවියාගේ ළමයා ඒ ගැන මොනවා හිතාවිද ? ඒ ළමයා තුළ මේ රට කෙරෙහි, ජාතිය කෙරෙහි, භාෂාව කෙරෙහි ළැදිකමක් ඇති විය හැකිද ? සිංහල භාෂාව ඉගෙනීමට උනන්දුවක් ඔහු තුළ ඇති වේවිද ? මේ කුණුකන්දල් සිංහලය අත් හැර දමා මිනිසුන් මින් ඉදිරියට ඉංගිරිසියම ඉගෙන ගත යුතුය යන හැඟීමක් ඒ අහිංසක ගැමි දරුවන් තුළ ඇති වුණොත් එයින් ඇති වන ප්‍රතිඵලය කුමක් විය හැකිද ? අපේ ජාතිය මෙවැනි විපත්තියකට භාජන වෙතියි කල්පනා කළ නිසාම තමයි, හැමදාම මෙවැනි ප්‍රශ්නයක් ඉදිරිපත් වූ හැම අවස්ථාවකම එක්තරා ප්‍රමාණයක වගකීමක් ඇතිව මා ඉදිරිපත් වන්නේ. අපගේ භාෂාව ගැන විශ්වාසයක් අප තුළ නැත්නම්, අපගේ භාෂාව ගැන ආඩම්බරයක් අප තුළ නැත්නම්, අපගේ රට කෙරෙහි ආදරයක් අප තුළ නැත්නම් අපට කවදාවත් නිර්භය අභීත අදීන එඩිතර ජාතියක් වශයෙන් ලෝකයෙහි හිස ඔසවා සිටින්නට පුළුවන් වන්නේ නැහැ. වෙනත් භාෂාවක් මඟින් ඒවා ඇති කරන්නට බැහැ.

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේගේ නෑදෑයින් වැඩි දෙනා ජීවත් වන මැද පෙරදිග ප්‍රදේශයේ මුස්ලිම් රාජ්‍යයක් සමග ඊශ්‍රායල් හමුදා කළ යුද්ධය පිළිබඳ විස්තර වාර්තාවක් පසුගිය දවසක මට කියවන්නට ලැබුණා. මිනිසුන් දහස් ගණනක් මරා, අරාබි ජාතීන් කීපයකගේ සම්පූර්ණ යුද්ධ ශක්තිය එහෙමපිටින් විනාශ කර දමා ලෝක ඉතිහාසයේ කිසිම යුද්ධයකදී නොවූ පරිදි විශාල ජයග්‍රහණයක් අත්පත් කරගත් ඊශ්‍රායල් සේනා ජෙරුසලමට ඇතුළු වී එය අත්පත් කර ගැනීමෙන් යුද්ධය කෙළවර වුණු පසු, එම සොල්දාදුවන්ගේ නායකයකු වූත් හිටපු අගමැති කෙනකුවූත් බෙන්ගුරියන් ඊශ්‍රායල් හමුදා සමග වැළපෙන තාප්පය ළඟට ගොස් කළා යයි කියැවෙන්නේ කුමක් ද ? තම ආගමේ සංකේතයක් හැටියට සැලකෙන වැළපෙන තාප්පය හැඳින්වීම සඳහා අරාබි හා ඉංග්‍රීසි භාෂාවලින් සවිකර තිබුණු දැන්වීම් පුවරුව වහාම ඉවත් කොට හැකි පමණ ඉක්මණින් යුදෙව් භාෂාවෙන් එම දැන්වීම් පුවරුව සවි කිරීමට නියෝග කිරීමයි, ඔහු කෙළේ. හිබෲ භාෂාවෙන් එම දැන්වීම් පුවරුව වහාම යොදන ලෙස නියෝග කළා. යුදෙව් ජාතිකයින්ගේ යුද්ධ ක්‍රියා මාර්ගය මා අනුමත කරන්නේ නැහැ. මෙම යුද්ධයේදී යුදෙව් ජාතිකයින් ආක්‍රමණිකයින් වශයෙන් හඳුන්වන්නට එක්සත් ජාතීන්ගේ සංවිධානයට බැරි වුණත්, යුදෙව් ජාතිකයින් කළ වැඩේ වැරදි බව නිදහස් අදහස් ඇති පුද්ගලයකු වශයෙන් මා කෙලින්ම ප්‍රකාශ කරනවා. මා මෙකී දැන්වීම් පුවරුව පිළිබඳ සිද්ධිය සඳහන් කෙළේ යුදෙව්වන්ගේ යුද්ධ ආධිපත්‍යය උහා දැක්වීමට නොව, හැම ජාතිකයකුම ඔහුගේ භාෂාව කෙරෙහි දක්වන ආදරයත්, භාෂාව ගැන ඔහු තුළ ඇති ආඩම්බරයත් විදහා දැක්වීමටයි. හිස ඔසවා නිර්භයව ජීවත් වන්නට කැමති හැම ජාතිකයකුම ඔහුගේ භාෂාවට මොන තරම් ආදරයක් ගෞරවයක් දක්වනවා ද යන්න මෙයින් පැහැදිලි වෙනවා. මාතෘ භාෂාවට ලැදිකමක්, ආදරයක් නොදැක්වීමේ දිනකම තිබෙන්නේ අපට පමණයි. අවුරුදු සිය ගණනක් අධිරාජ්‍ය වාදීන්ගෙ ඉංග්‍රීසි සපත්තුවට යට වී සිටි අපට තවමත් ඒ සපත්තු පහරින් හිස ඔසවන්නට බැරි වී තිබෙනවා. හැම දෙයකදීම එකපාරටම හිතන්නේ ඉංග්‍රීසියෙන්. මෙම මණ්ඩලයේ පවා කටයුතු සියයට 98 ක් කෙරෙන්නේ ඒ පර භාෂාවෙන්මයි. රාජ්‍ය භාෂාවෙන් කරනවා යයි ස්ථාවර අණපනත් වල තිබෙන බව හැබැයි. එහෙත් සිදු වෙන්නෙ කුමක් ද ? මෙතැන මේ සභාවේ වැඩ කටයුතු බලන්නට පැමිණෙන පුද්ගලයන්ට දකින්නට ලැබෙන්නේ මොන විධියේ දර්ශනයක් ද ? මේ රටේ ප්‍රබලතම විශිෂ්ට තම සම්භාවනීය මන්ත්‍රී මණ්ඩලයේ මුල් තැනක් තමන්ගේ භාෂාවට ලැබී තිබෙනවා කියා ඔවුන්ට සැනසිල්ලේ ආපසු යන්ට පුළුවන් ද ? කවදාවත් බැහැ. මෙතැන ආව හැටියෙ පෙනෙන්නෙ ඉංග්‍රීසි සම්ප්‍රදායට ඉංග්‍රීසි භාෂාවෙන් ඉංග්‍රීසි ක්‍රමානුකූලව සිදු කෙරෙන වැඩකටයුතුයි. ස්වාභාවිකව සිංහලයින් තුළ මේ ජාතික ඇල්ම, භාෂා ප්‍රසාදය, භාෂා ආදරය ඇති වේගන ආවත්. පාර්ලිමේන්තුවට ඇවිත් ගියායින් පසු ඒ ආදරය නැතිව යනව. අපේ උසස් තැන්වල වැජඹෙන ලොකු ලොක්කන්ගේ කථා ඇසුණායින් පසු ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආදරය නැති වී යනව. ඔවුන්ගේ හැසිරීම්, ඔවුන් ජීවත් වන ක්‍රමය දැක්කාම ස්වභාවෙන්ම මිනිසුන් තුළ ඇති වන ජාතික ආදරය ඉබේම නැති වෙලා යනව. මේක ජාතික විපතක් නේ ද? ජාතික අධ්‍යාපනය ගැන වග කියයුතු ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නය මේ දෘෂ්ටිකෝණයෙන් බලනවා ඇතැයි මා විශ්වාස කරනව. මෙය කෙලින් ම අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. එහෙත් ජාතියක් හරිහැටි ගොඩ නගන්නට බැරි නම් උසස් අධ්‍යාපනයෙන් ඇති වැඩේ මොකක් ද? අභිමානවත් ජාතියක්, තමන්ගේ රට දැය සමය ගැන ආදරයක් ඇති ජාතියක්, ගොඩ නගන්ට බැරි උසස් අධ්‍යාපනයකින් ඇති ඵලය කුමක් ද?

ගරු සභාපතිතුමනි, කොළඹ පිහිටුවන්ට යන, මේ අළුත් නමකින් හඳුන්වන්ට යන විශ්ව විද්‍යාලය දැනට පවත්නා අනික් විශ්ව විද්‍යාලවලින් මොන විධියෙන් වෙනස් වෙනවාදැයි අපි දැනගන්ට කැමතියි. මේ මුල් උසස් අධ්‍යාපන පනත ගෙනා වෙලාවේ ගරු අධ්‍යාපන ඇමතිතුමා විද්‍යෝදය විද්‍යාලංකාර විශ්ව විද්‍යාල පනත විවේචනය කරමින් ලොකුම දෝෂාරෝපණය වශයෙන් සඳහන් කළේ පේරාදෙණි විශ්ව විද්‍යාලයේ කැඩපතක් වැනි පනතක් ඉදිරිපත් කර ඒ අනුව ගොස් තවත් විශ්ව විද්‍යාල දෙකක් ගොඩ නැගුවා කියන එකයි. ඒ අන්ධානුකරණය ගැන නැඟූ චෝදනාව අපි සියයට සියයකින්ම හරි බව අනුමත කරනව. ලංකා විශ්ව විද්‍යාලය යනුවෙන් එවකට හැඳින්වූයේ මේ රටේ දියුණුවට, මේ රටේ යහපතට, මේ රටේ සංවර්ධනයට අදාළ වන විධියට සකස් වුණු අධ්‍යාපනයක් ලබා දෙන සංස්ථාවක් නොවෙයි; අධිරාජ්‍යවාදී යුගයේ අධිරාජ්‍යවාදී නියෝජිතයකු විසින් අධිරාජ්‍යවාදී පාලනය ගෙන යාම සඳහා නිලදරුවන් දෙතුන් සියයක් පුහුණු කර ගැනීමට සකස් කර ගත් විද්‍යායතනයක් පමණයි. ඒ විද්‍යායතනයේ පාලන තන්ත්‍රය ඒ විධියට පිටපත් කර ජාතික නම් දෙකක් ඇතිව විද්‍යෝදය, විද්‍යාලංකාර, කියා විශ්ව විද්‍යාල දෙකක් පටන් ගැනීමෙන් වුණේ මොකක් ද? ජෙනිංස් යුගයේ තිබුණු විධියේම තවත් විශ්ව විද්‍යාල දෙකක් බිහි වීම පමණයි.

මේ අළුත් පනත නීතිගත වුණු පමණින් ලංකා විශ්ව විද්‍යාලයේ ස්වරූපය හෝ ලංකා විශ්ව විද්‍යාලය අනුව ගිය විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්ව විද්‍යාල දෙකේ ස්වරූපය වෙනස් වුණු බවක් අපට පෙනෙන්ට නැහැ. මේ පිහිටුවන්ට යන කොළඹ අළුත් විශ්ව විද්‍යාලයත් ඒ අනුවම යනවාදැයි අපි දැන ගන්ට කැමතියි. නැත්නම් මේ රටේ පැරණි සංස්කෘතිය අගය කරන මේ රටේ පැරණි ඉතිහාසය අගය කරන, මේ රටේ අනාගත අවශ්‍යතාවන්ට අනුකූලව මේ රටට ගැළපෙන උසස් අධ්‍යාපනයක් දෙන ආයතනයක් බිහි කරන්නට යනවා ද? මේක නිකම් නම වෙනස් කිරීමක් පමණක් ද? පාලනයේ පහසුව තකා නැත්නම් ඒ ඒ විෂයයන් උගන්වන දේශකයන්ගේ පහසුව, ඒ ඒ පීඨයන් භාර විද්‍යාඥයින්ගේ හෝ මහාචාර්යවරුන්ගේ පහසුව තකා ආයතන දෙකක් බිහි කරනවා පමණක් ද? එහෙම නැත්නම් ඇත්ත වශයෙන් ම ජාතියේ අනාගතය ගැන කල්පනා කර, ජාතියේ ඕනෑ එපාකම් පිරිමසා ගැනීමට බිහි කරන ආයතනයක් ද යන්න අප ගරු ඇමතිතුමාගෙන් දැන ගන්නට සතුටුයි.

කොළඹ විශ්ව විද්‍යාලයය කියා අළුත් ආයතනයක් පිහිටෙව්වාට මේකටත් අනෙකුත් විශ්ව විද්‍යාලවලට වාගේම උප කුලපතිවරයකු අවශ්‍ය වෙනවා. දැන් තමුන්නාන්සේ විසින් පත් කරන ලද උසස් අධ්‍යාපන මණ්ඩලය කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති පදවියට කවුද පත් කරන්නට යන්නෙ? මෙම තනතුරට පිටරටින් මිනිසකු ගෙන්වන්නට යනවාය කියා දැනටමත් ආරංචියක් පැතිර ගොස් තිබෙනව. පිටරටින් ගෙන්වන මිනිසකු මේ තනතුරට පත් කරන්නට එපාය කියා මා ජාතියේ නාමයෙන් ඉල්ලීමක් කරනවා. පිටරටින් උපාධිධරයින්, විද්‍යාධරයින්, උපදේශකවරුන්, මහාචාර්යවරුන් ගෙන්වන්න. නමුත් අපේ ජාතික ආයතනයක උසස්ම පදවියට විදේශිකයකු පත් කරන්නට එපා. මේ ප්‍රධාන පදවිය විදේශිකයකුට දුන්නොත් ඒ ආයතනයේ ප්‍රතිපත්ති මාලාව සම්පූර්ණයෙන්ම නොමග යවන්නට ඉඩ තිබෙනවා. එම නිසා ජාතියේ අනාගතය ගැන කල්පනා කර බලා මේ උසස් පදවිය විදේශිකයකුට දෙන්නට එපා. ජාතියේ අනාගතයට බලපාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

මෙවැනි උසස් ආයතනයක මුල් ස්ථානය විදේශිකයකුට පවරා දීම මේ රටේ වගකිව යුතු කිසිවකු විසින් නොකළ යුතු දෙයක්. අපේ අනාගතය අප විසින්ම සකස් කර ගත යුතුයි. ඒ සඳහා වෙන අයගෙන් උපදෙස් ගන්න එක වෙනම කාරණයක්.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අප තුළ එවැනි බලාපොරොත්තුවක් නැහැ.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

එහෙම නම් මේ රටේ සිදුවෙමින් පවත්නා සංස්කෘතික වෙනස්වීම් උහුලා ගන්නට බැරිව මේ රටින් පැන ගිය මිනිසකු යළිත් ලංකාවට කැඳවා ඔහුට මේ පදවිය භාර දෙන්නට තමුන්නාන්සේලා තුළ බලාපොරොත්තුවක් තිබෙනවාද? පසුගිය අවුරුදු දහය තුළ මේ රටේ කිසියම් සංස්කෘතික විප්ලවයක් ඇති වුණා. එම සංස්කෘතික විප්ලවය තවදුරටත් සිදුවෙමින් පවතිනවා. මේ සංස්කෘතික විප්ලවය, ජාතික වෙනස්වීම උහුලා ගන්නට බැරිව ලංකාවෙන් පැන ගිය ලොක්කන්ය කියා ගන්නා, පණ්ඩිතයන්ය කියා ගන්නා පිරිසක් සිටිනවා. ඉංග්‍රීසි උගත්කමක් නැති මේ රටේ සාමාන්‍ය මිනිසුන් ඔළුව උස්සා ගෙන ඉදිරියට පැමිණීම උහුලා ගන්නට බැරිව ඊර්ෂ්‍යාවෙන් පැන ගිය මිනිසුන් කොටසක් සිටිනවා. මේ කුණු කන්දල් සිංහලයින් ලංකාවේ රජ වෙන්නට යනවාය, අපට මේ රටේ ඉන්නට බැරි වෙනවාය, එම නිසා අපි ඉංග්‍රීසි තිබෙන වෙන රටක් සොයා ගෙන යනවාය කියා ලංකාවෙන් පැන ගිය මිනිසුන් කොටසක් සිටිනවා. එසේ පැන ගිය පුද්ගලයකු යළිත් ලංකාවට ගෙන්වා අපේ රටේ අනාගතයට බලපාන මෙවැනි ආයතනයක මූලස්ථානය ඔහුට පවරන්නට තමුන්නාන්සේලා තුළ අදහසක් තිබෙනවාද කියා මා ප්‍රශ්න කරනවා. මා කලින් ඇසූ ප්‍රශ්නයට කෙළින්ම පිළිතුරු දුන්නාක් මෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා කරුණාකර මේ ප්‍රශ්නයටත් පිළිතුරක් දෙන්න. මේ රටට ආදරයක් තිබෙනවා නම් කිසි කලෙක මේ මිනිසුන් ලංකාවෙන් පිටව යන්නෙ නැහැ. මේ රටට ආදරයක් තිබෙනවා නම් මේ රට සංවර්ධනය කළ යුතුය කියා හැඟීමක් තිබෙනවා නම් රාජ්‍ය භාෂාව පිළිබඳව නීතියක් හෝ වෙන කිසියම් නීතියක් හෝ පැනවූ පලියට මේ අය රටින් පිටව යන්නෙ නැහැ. ඉංග්‍රීසි පුවත්පත් මේක හඳුන්වන්නෙ "brain drain" කියායි. මේ සිංහල භාෂා ප්‍රශ්නය, රාජ්‍ය භාෂා ප්‍රශ්නය හැම තැනම මතු වෙනවාය, රෙදි අඳින මිනිසුන් දැන් රටේ ලොක්කන් වෙන්නට යනවාය, අපට නොතේරෙන සිංහල භාෂාව රාජ්‍ය භාෂාව වී ඒ භාෂාවෙන් නීතිරීති සම්පාදනය වෙන්නට යනවාය, අපට නොතේරෙන මේ කුණු කන්දල් සිංහල භාෂාවෙන් විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, නීතිය පවා උගන්වන්නට යනවාය, සිංහල භාෂාවෙන් උසස් අධ්‍යාපනය දෙන්නට යනවාය එහෙත් අපට පුරුදු ඉංග්‍රීසි පමණයි, එම නිසා සිංහලයින් ඔළුව උස්සන මේ රටේ අප තවදුරටත් ඉන්න වුවමනාවක් නැත කියා ලංකාවෙන් පැන ගිය විශාල පිරිසක් සිටිනවා. උද්ධච්ච, අහංකාර, ඉංග්‍රීසි උගත් පුද්ගලයන් සිය ගණන් පසුගිය අවුරුදු 10 තුළ මේ රටින් පැන ගියා. එය රටට සිදු වුණු මහා විපත්තියක්, අලාභයක්, උසුලන්නට බැරි පාඩුවක් කියමින් සමහර ඉංග්‍රීසි පත්‍ර කඳුළු හළනවා. "උගත්, දියුණු මොළයක් තිබෙන මේ මිනිසුන් රට අත්හැර යනවා, එය නැවැත් වූයේ නැත්නම් මේ රටේ බුද්ධිමය පරිහානියක් වෙනවාය" කියනවා. එවැනි උද්ධච්ච මිනිසුන් රට අත්හැර යෑමෙන් මේ රටට පාඩුවක් වන්නේ නැහැ. කිසියම් කටයුත්තකට තාවකාලිකව සුළු හානියක් සිදු වන්නට පුළුවන්. නමුත් ඉතිහාසය දෙස බලා, ජාතික වශයෙන් මේ ප්‍රශ්නය තේරුම් ගත්තොත්, ඔවුන් රට හැර යෑමෙන් ජාතියට පාඩුවක් වේය කියා මා හිතන්නේ නැහැ. එවැනි අහංකාර පුද්ගලයන් එවැනි තැන්වල වැජඹීම, බලතල හා නිලතල දරා සිටීම, ජාතියේ ඉදිරි ගමනට ලොකු හානියක්. එවැනි උද්ධච්ච පුද්ගලයන් සෑම කෙනෙක්ම රට හැර යෑම ජාතියට ලොකු ආශීර්වාදයක් වෙනවා. එසේ රට හැර පැන ගිය පුද්ගලයන් යළිත් වරක් ගෙන්වාගෙන වගකිව යුතු තැන් ඔවුන්ට භාර නොදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Is not the hon. Member repeating the same thing more than once?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

නියෝජ්‍ය සභාපතිතුමනි, මට ඔබතුමාගේ මවු භාෂාවෙන් මේ ප්‍රශ්නය ගැන එතරම් ගැඹුරු ලෙස අදහස් ප්‍රකාශ කරන්නට පුළුවන්කමක් නැහැ. එවැනි පුළුවන්කමක් මට තිබෙනවා නම්, ඒ භාෂාවට එක වරටම බසිනවා. එසේ ඔබතුමාගේ මවු බසින් මා කථා කළොත් ඔබතුමා කියන එකක් නැහැ, මා එකම කරුණ යළි යළිත් කියනවාය කියා. මා සඳහන් කරමින් සිටියේ, අවධාරණයෙන් පැහැදිලි කරමින් සිටියේ—

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

You cannot say that because I have been listening to your speech very closely as I am as interested as you are in Sinhala.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

ඒ ගැන මා බොහොම සන්තෝෂ වෙනවා. සිංහලයකු නොවන ගරු නියෝජ්‍ය සභාපතිතුමා අපේ සිංහල භාෂාවට දක්වන ආදරය ගැන මා එතුමාට කෘතඥතාවය පළ කරනවා. සිංහල නොවන අනෙක් අයත් අපේ සිංහල භාෂාවට ඔය ආදරය නැත් නම් සැලකිල්ලවත් දක්වනවා නම් එය අපට ලොකු සැනසීමක්.

කොළඹ විශ්ව විද්‍යාලයේ අනාගත ස්වරූපය කෙසේ වේදැයි මා අධ්‍යාපන ඇමතිතුමාගෙන් දැන ගන්නට කැමතියි. අප ඉදිරියේ තබා ඇති මේ රෙගුලාසිවලින් ඒ පිළිබඳව යම්තම් ඉඟියක්වත් කර නැහැ. නම් වෙනස් කිරීමක් පමණයි, එයින් කර තිබෙන්නේ. මට මතකයි, පසුගිය මැතිවරණයට කලින් මගේ පළාතේ පාඨශාලාවල මෙවැනි නම් වෙනස් කිරීම් සිදු වුණා. හරකුන් ළඟින හරක් ගාල් වැනි පාසල් ගොඩනැගිලි 10 ක් 12 ක් තෝරාගෙන හිටි හැටියේ, මේ විධියට නම් වෙනස් කර බෝඩ් ගැසුවා. කිසිම සුදුසුකමක් නැතිව "මහා විද්‍යාල" නමින් බෝඩ් ගැසුවා. විද්‍යාගාරයක් [බාධා කිරීම්] ගරු අධ්‍යාපන ඇමතිතුමාත් එවැනි නම් වෙනස් කිරීමකින් "කොළඹ විශ්ව විද්‍යාලය" පිහිටුවන්නට යනවා. වෙනත් විශ්ව විද්‍යාලවලට ලබා ගත හැකි පහසුකම් නැතිව—විද්‍යාගාර පහසුකම්, පුස්තකාල පහසුකම්, ක්‍රීඩා භූමි පහසුකම්, නේවාසික පහසුකම් ආදි කිසිදු පහසුකමක් නැතිව—[බාධා කිරීම්]

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එය අයවැය කථාවෙන් බලන්නට පුළුවන්.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

කොහොමද බලන්නේ? අඩු ගණනේ මේ රෙගුලාසිය ඉදිරිපත් කරමින් කියන්නට තිබුණා, "මෙය නම් වෙනස් කිරීමක් පමණක් නොව මෙවැනි වෙනස්කම් රාශියක් අප ඉදිරිපත් කර තිබෙනවා" කියා. විශ්ව විද්‍යාලයක් පිහිටුවීම සඳහා අපෙන් අනුමැතිය ඉල්ලනවා. එහෙත් ඒ විශ්ව විද්‍යාලයෙහි ඇති කරන්නට යන පහසුකම් මොනවාදැයි අපට කියන්නේ නැහැ. එසේ හෙයින් දෙන පහසුකම් මොනවාදැයි අසන්නට අපට අයිතියක් තිබෙනවා. තමන්ට ඉගෙන ගන්නට සිදු වී තිබෙන්නේ පහසුකම් නැති අශ්ව ගාලක යයි පසුගියදා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ගෙන් චෝදනාවක් එල්ල වුණු බව ගරු ඇමතිතුමාට මතක ඇති. ඉතින් දැන් ගරු අධ්‍යාපන ඇමතිතුමා අපෙන් අනුමැතිය ඉල්ලන්නේ විශ්ව විද්‍යාලයක් හැටියට පහසුකම් නැති ස්ථානයක් විශ්ව විද්‍යාලයක් බව පෙන්වීම සඳහා "බෝඩ්" එකක් ගැසීමටද? ශිෂයන් පමණක් නොව ගුරුවරුන්ද ඉදිරිපත් කළ චෝදනා එසේ නොවෙතැයි ඔප්පු කරන්නට ඇමතිතුමාට පුළුවන් විය යුතුයි. විශ්ව විද්‍යාලයක් නම් එයට සුදුසු පුස්තකාලයක් තිබිය යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

තමනට පුස්තකාල පහසුකම් නැතැයි විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් කියනවා. පේරාදෙණියේ ඇති විශ්ව විද්‍යාලයෙහි නම් පුස්තකාල පහසුකම් තිබෙනවා; නේවාසික පහසුකම් තිබෙනවා. නමුත් කොළඹ ශාඛාවෙහි පුස්තකාල පහසුකම් හෝ නේවාසික පහසුකම් නැහැ. කලින් අශ්ව ගාලක් හැටියට පැවතුණු ස්ථානයකට ගොස් ශබ්ද වාහිනී යන්ත්‍ර මාර්ගයෙන් ඒ ඒ විෂයයන් පිළිබඳ පාඨ මාලා පවත්වාගෙන යෑම පමණයි, අද කෙරෙන්නේ. මෙය විශ්ව විද්‍යාල අධ්‍යාපනයක්දැයි ශිෂ්‍යයන් මෙන්ම කථිකාචාර්යවරුන්ද ප්‍රශ්න කළා.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Cannot the hon. Member reserve the matters which he is referring to for the Budget Debate ?

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදී මේ ප්‍රශ්නය ගැන දිගින් දිගට කථා කරන්නට නොලැබෙන බව තමුන්නාන්සේ දන්නවා ඇති.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Why ? In the Committee stage you can. කොමිටි අවස්ථාවේදී හොඳටම පුළුවනි.

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

කොමිටි අවස්ථාව සඳහා වුවද වෙන් වී තිබෙන්නේ සීමිත කාලයක්. තවමත් මෙම ගරු සභාවේ කටයුතු පාලනය වන්නේ එදා තිබුණු ස්ථාවර අනපනත් අනුවමයි. මන්ත්‍රීවරුන් 101 දෙනකු සිටින මන්ත්‍රී මණ්ඩලයක් සඳහා සකස් කරන ලද අනපනත් අනුවමයි, මන්ත්‍රීවරුන් 157 දෙනකු සිටින මන්ත්‍රී මණ්ඩලය පාලනය වන්නේ. ඒ වගේම ජාතික ආදායම රුපියල් කෝටි 100 ක් තරම් වූ කාලයේදී අයවැය ලේඛනය පිළිබඳ විවාදයට වෙන් වුණු කාලයමයි, ජාතික ආදායම රුපියල් කෝටි 200 ටත් වැඩි බව පෙන්වන අයවැය ලේඛනයක් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට දී තිබෙන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මයා. (දිවුලපිටිය)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய)
(Mr. Lakshman Jayakody—Divulapitiya)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගණපූරණයක් නැහැ.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.

පසුව ගණපූරණයක් තුබූයෙන්—

சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்படவேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

ප්‍රින්ස් ගුණසේකර මයා.
(திரு. பிறின்ஸ் குணசேக்கர)
(Mr. Prins Gunasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්ව විද්‍යාලයක් පිහිටුවීම සඳහා ඉදිරිපත් කර ඇති විශේෂ යෝජනාවක් පිළිබඳ විවාදය කදී මිස වෙන යමක් ගැන සිදු වන විවාදයකදී දිගින් දිගට මේ ගැන විග්‍රහ කරන්නට ඉඩක් නොලැබෙන නිසා අදාළ ඕනෑම කාරණයක් ගැන තමන් කැමති පරිදි අදහස් ප්‍රකාශ කරන්නට මෙම විවාදයට සහභාගි වන හැම මන්ත්‍රීවරයකුටම ඉඩ දීම යුතුකමයි. විශ්ව විද්‍යාලවල අභ්‍යන්තර පාලනය, අනාගත ස්වරූපය සහ අතීත වැරදි හැම එකක්ම සලකා බලන්නට අපට ලැබී තිබෙන එකම අවස්ථාව මේකයි. අප මෙම අවස්ථාව පැහැර හැරියහොත් අයවැය ලේඛනය පිළිබඳ විවාදයේදීත් අපට සිදු වන්නේ උඩින්පල්ලෙන් මොනවා හරි කියා විශ්ව විද්‍යාල වැය ශීර්ෂය අනුමත කරන්නටයි. මේ සඳහා වියදම් වන මුදල් ගැන බැලීම විතරක් නොවෙයි, අපේ යුතුකම වන්නේ. උසස් අධ්‍යාපනය පිළිබඳ විද්‍යායතන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගින් අනාගත ජාතියට සිදු කෙරෙන සේවය ගැන සිතා බලා ඒ හැම අංශයකටම අදාළ වන කරුණු මෙම මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තැබීම අපේ යුතුකමයි. මා සිතනවා තමුන්නාන්සේලාටත් ඒ වගකීම පැවරී තිබෙනවාය කියා. මා කතා කරමින් සිටියේ අපට ඉදිරිපත් කර තිබෙන ගැසට් නිවේදනය පිළිබඳවයි. එම ගැසට් නිවේදනයේ දෙවන කොටසෙහි සඳහන් වන්නේ මොනවාද ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

අරියාදු.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

අරියාදුවක් නොවෙයි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

සාකච්ඡා කිරීමත් අරියාදුවක්ද ?

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

හැම අංශයකින්ම කරුණු ඉදිරිපත් කරන්ට මා බලාපොරොත්තු වුණු නිසා ටිකක් කතාව දික් වුණා. මෙවැනි වැදගත් ප්‍රශ්නයක් ගැන උඩින් පල්ලෙන් මොකවත් කියා වාඩි වෙන එක වටින්නේ නැහැ. එම ගැසට් නිවේදනය යටතේ උගන්වන්ට යන විෂයයන් මොනවාද ? මෙන්න, එම නිවේදනය :

"(1) විශ්ව විද්‍යාලය තත්ත්වයේ උසස් අධ්‍යාපන ආයතනයක් 1967 ඔක්තෝබර් මස පළමු වැනි දින සිට පිහිටුවියයුතු යයිද, පහත දැක්වෙන අධ්‍යයන අංශවල, එනම්—

(අ) වෛද්‍ය විද්‍යාව
(ආ) විද්‍යාව
(ඇ) කලා
(ඈ) සමාජ විද්‍යාව
(ඉ) නීති, හා
(ඊ) වාස්තු විද්‍යාව

යන්නෙහි උසස් අධ්‍යාපනය සැපයීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා එය නීතිගත සංස්ථාවක් විය යුතු යයි ද,

(2) එම විශ්ව විද්‍යාලය "කොළඹ විශ්ව විද්‍යාලය" යන නමින් හැඳින්විය යුතු යයිද, හා......"

අන්න ඒ ආකාරයටයි සඳහන් වෙලා තියෙන්නෙ. මුල් පනතේ වාගේම මෙම රෙගුලාසියේවත් කියා නැහැ, මේ විෂයයන් උගන්වන්නේ මොන භාෂා මාධ්‍යයකින්ද කියා. මුල් පනතේ තිබෙන අඩු පාඩුවක් නිසා දැන් ප්‍රශ්න රාශියක් මතු වී තිබෙනවා. මෙම රෙගුලාසියෙන්වත් ඉදිරිපත් කරන්ටයි තිබුණේ, භාෂා මාධ්‍යය කුමක්ද කියා. මෙම තත්ත්වය පිළිබඳව වචනයක්වත් නීතියේ සඳහන් නොකළ නිසා විශ්ව විද්‍යාලයේ සනාතන මණ්ඩලය තුළ පවත්නා ව්‍යාකූල තත්ත්වය කොතරම්ද යන්න ගැන ගරු අධ්‍යාපන ඇමතිතුමා ටිකක් සොයා බලන්ට ඕනෑ. ඒ ඒ විද්‍යා අංශ, ඒ ඒ විද්‍යා පීඨ භාර මහාචාර්යවරුන් විශෙෂයෙන් භාෂා මාධ්‍යය පිළිබඳ ප්‍රශ්නයේදී තම තමන් කැමති විධියට පාලන කටයුතු ගෙන යනවා. සිංහලෙන්—රාජ්‍ය භාෂාවෙන්—තමන්ගේ විද්‍යා පීඨයේ කටයුතු කර ගෙන යාමට කැමති එක්තරා මහාචාර්යවරයෙක් පසුගිය සනාතන මණ්ඩලයේ රැස්වීමකදී ප්‍රශ්නයක් මතු කළා. 1961 සිටම මෙම විශ්ව විද්‍යාලයේ—ලංකා විශ්ව විද්‍යාලයේ—පිළිගත්, අනුමත කළ හා ක්‍රියාත්මක කළ පිළිවෙළ නම් ඒ ඒ විෂයයන් රාජ්‍ය භාෂාවෙන්—සිංහලෙන්—ඉගැන්වීමයි. එසේ නම් එය වෙනස් කිරීමට තරම් උත්සාහයක් ගන්නේ කාගේ අනුමැතිය ඇතිවද කියන ප්‍රශ්නයයි, ඒ. එම අවස්ථාවේදී අනෙක් මහාචාර්යවරුන් කියා තිබෙන්නේ කුමක්ද ? "ඒ විධියට ගෙනයන්ට අපට බැහැ ; ස්වභාෂා මාධ්‍යයන්ගෙන්—සිංහලෙන් හා දෙමළෙන්—උසස් අධ්‍යාපන කටයුතු කරන්ට කථිකාචාර්යවරුන් නැහැ." එම පිළිතුරයි ලැබුණේ. 1961 සිට 1965 වන තුරු මේ වැඩ පිළිවෙළ අනුගමනය කර ගෙන ආවා. ඉන් පසු අළුත් කථිකාචාර්යවරුන් බඳවා ගැනීමේදී භාෂා මාධ්‍යය ගැන සැලකිල්ලක් දක්වන්නේ නැතුව ඉංග්‍රීසිය ගැන විතරක් සලකා ක්‍රියා කර තිබෙන බවයි පෙනෙන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ප්‍රින්ස් ගුණසේකර මයා.]

අද උසස් අධ්‍යාපන ආයතනවල ස්ව භාෂා මාධ්‍යයෙන්—සිංහලෙන් හා දෙමළෙන්—උසස් අධ්‍යාපනය දෙන්නට බැරි තත්ත්වයක් පැනනැගි තිබෙන්නේ පසුගිය අවුරුදු දෙක තුන තුළදී අලුතින් බඳවා ගත් කථිකාචාර්යවරුන්ට ස්වභාෂාව පිළිබඳ දැනීමක් නොමැති වීම නිසයි. හේතුව ඒකයි. ස්වභාෂාවට ලැදි මහාචාර්යතුමා සනාතන මණ්ඩලයේදී ඒ ප්‍රශ්නය මතු කළා. පසුගිය අවුරුදු දෙක තුන තුළදී ඒ ඒ විද්‍යා පීඨයන් සඳහා බඳවා ගන්නා ලද කථිකාචාර්යවරුන්ගේ නම් හා ඔවුන්ගේ සුදුසුකම්, ඔවුන්ට ස්වභාෂාවෙන් නැත්නම් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මාතෘ භාෂාවෙන් විෂයයන් ඉගැන්වීමට පුළුවන්කම තිබෙනවාද යන කරුණුත් කරුණාකර කියන්න. එසේ ස්වභාෂාවෙන් ඉගැන්වීමට පුළුවන්කමක් දැනට ඔවුන් තුළ නැත්නම් කුමන කාලසීමාවක් තුළදී ස්වභාෂා මාධ්‍යයෙන් ඉගැන්වීමේ පුළුවන්කම ලබා ගන්නට ඉඩ සලසා තිබෙනවාද? අන්න ඒ ප්‍රශ්නය විසඳන්නේ නැතිව නම් නාම පුවරුව නැත්නම් "නේම් බෝඩ්" එක පමණක් වෙනස් කර විශ්ව විද්‍යාලයක් පිහිටුවීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. ඒ නිසා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අප ඉල්ලා සිටින්නේ මෙයයි: උසස් අධ්‍යාපනය කෙරෙහි ස්වභාෂා මාධ්‍යය භාවිතය වනු දැකීමට ගරු ඇමතිතුමා අවංක ආසාවක් දක්වනවා නම්, පසුගිය අවුරුදු තුන හතර තුළදී මේ ගැන සොයා නොබලා සිටියත්, අද සිදුවන්නේ කුමක්ද කියා තමුන්නාන්සේ දන්නේ නැති වුණත්, මේ විශ්ව විද්‍යාල ඇතුළත මේ මහාචාර්යවරුන් සිටගෙන ඒ ආයතන නැවත වරක් ඉංගිරිසියට ඇදගෙන යනවා නේද කියා හෙට සිටවත් සොයා බලා දැනගන්නය කියා අපි කියා සිටිනවා. විරුද්ධ පක්ෂය මෙතරම් වේලාවක් අරගෙන මෙතරම් වේදනාවෙන් මේ කාරණය ගැන සඳහන් කරන්නේ මක් නිසාද කියන එක එවිට තමුන්නාන්සේට පෙනේවි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අනිකුත් කරුණු ගැන මා මෙහි දී සඳහන් කරන්නේ නැහැ. තවත් ගැසට් නිවේදනයක් තිබෙනවා. ඒ 4 වැනි ගැසට් නිවේදනයයි. එහි දී ගාස්තු අය කිරීම ආදී කරුණු ගැන සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වන නිසා ඒවා ගැන මේ අවස්ථාවේ සඳහන් කරන්නේ නැහැ. ඒකත් දැනට තිබෙන නීතියේ ඇති එක්තරා අඩු පාඩුවක්. මේ ගැසට් නිවේදන දෙක නිසා පැන නඟින අලුත් තත්වය යටතේ ඇති කරන විශ්ව විද්‍යාලය පැරණි විශ්ව විද්‍යාලයේ ඡායාවක් නොකොට අලුතින් දියුණු වන්නට ආසාවෙන් සිටින පැරණි ජාතියක නිවහල් භාවය පිළිබිඹු කරන උසස් අධ්‍යාපන ආයතනයක් බිහි කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමාට ශක්තිය හා දූර්දර්ශී ඥණය ලැබේවා කියා ප්‍රාර්ථනා කරනවා.

අ. භා. 5.23

**තුඩාවේ මයා.**
(திரு. துடாவ)
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ ශාඛාවක් හැටියට තිබුණු කොළඹ විශ්ව විද්‍යාල ශාඛාව වෙනම විශ්ව විද්‍යාලයක් හැටියට පරිවර්තනය කර විශ්ව විද්‍යාල සංඛ්‍යාව වැඩි කිරීමට අපේ අධ්‍යාපන ඇමතිතුමා ගෙනැවිත් ඇති නියෝගවලින් ඇති වන තත්ත්වය හා ඒ නියෝගවල ඇති අවුල් තත්ත්වය ගැන මට කලින් කථා කළ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) හා හබරාදුව ගරු මන්ත්‍රීතුමා (ප්‍රින්ස් ගුණසේකර මයා.) කරුණු ඉදිරිපත් කළා.

ඒ නියෝග ගැන මා විශේෂ යමක් කියන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එසේම විශ්ව විද්‍යාලයක් ඇති කිරීමේ පරමාර්ථයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා ගෙන යන වැඩ පිළිවෙළ ගැනත් අපේ විරුද්ධත්වයක් නැහැ. එහෙත් විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනයක් ලබා ගැනීමේ චේතනාවෙන් අවුරුදුපතා විශ්ව විද්‍යාලයට ඇතුළු වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සෑහෙන පිරිසක් තම ඉගෙනීම අතරමඟ නතර කර පැනලා යන්නේ මොන කාරණයක් නිසාදැයි සෝදිසි කර බැලීම ඉතාමත් වැදගත් දෙයකැයි මා කල්පනා කරනවා. අනාගත බලාපොරොත්තු ඇතිව ඇතුළුවන අය ටික ටික එයින් ඈත් වන තත්ත්වයක් දැන් ඇති වේගන යනවා. තමන් ලබන විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනයෙන් තමන්ගේ අනාගත ජීවිතයට පිහිටක් නැති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

බව පෙනී ගියාම ඒ අය එයින් පිට වී යනවා. ලංකාවේ කලා උපාධි ලත් අය කී දෙනෙක් රැකීරක්ෂාවල් නැතිව සිටිත්ද?

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

2,600 යි.

**ප්‍රින්ස් ගුණසේකර මයා.**
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

උපාධිධාරීන් 2,600 ක්ය කියන්නෙ සුළු ගණනකට නොවෙයි.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

හොඳ ගණනක්.

ප්‍රින්ස් ගුණසේකර මයා.
*(திரு. பிறின்ஸ் குணசேக்கர)*
(Mr. Prins Gunasekera)

රැකීරක්ෂාවල් නැතිව ඉන්න උපාධිධාරීන්ගේ සංඛ්‍යාව 2,600 ක් නම් එය සුළු ගණනක් නොවෙයි. කොහොමද මේ අය ජීවත් වන්නේ? මේ තත්ත්වය මේ රටේ අනාගතයට බලවත් පහරක්. ඒ නිසා අලුතින් විශ්ව විද්‍යාල ආරම්භ කරන විට මේවා ගැනත් බොහෝ දුරට කල්පනා කළ යුතුව තිබෙනවා.

රැකීරක්ෂාවන් නැති කලා උපාධිධාරීන් 2,600 ක් අද රටේ සිටින බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. මේ උදවිය දැන් ජ්‍යෙෂ්ඨයෙන් සමර්ථ වූවන් සඳහා තිබෙන රැකීරක්ෂාවල් බොහෝ විට ඉල්ලනවා. කලා උපාධිධාරීන් අද ඒ තත්ත්වයට වැටී සිටිනවා. ඒ අය වෙනත් අංශයක සේවයට යොදා ගන්නට බැරිදැයි සොයා බැලිය යුතුයි. කාර්මික අංශයේ පුහුණුවක්—අධ්‍යාපනයක්—ලබා දී රටට අවශ්‍ය කාර්මික විශේෂඥයන් ලෙස ඒ අය සේවයේ යොදා ගන්නට බැරි දැයි කල්පනා කළ යුතුයි. ජාතියේ යහපත සඳහා ඒ අයගේ හැකියාව උපයෝගී කර ගත යුතුයි. එය කිසිසේත් අපරාධයක් නොවෙයි. ජපානයේ එසේ කර තිබෙනවා. කලා අධ්‍යාපනයක් ලත් අයට දීමට සුදුසු රක්ෂාවල් නැති වුණාම ඒ අය වෙනත් අංශවලට යවා රටට යම් සේවයක් කරන්නට අවස්ථාව ඒ රටේ සලසා තිබෙනවා. එවැනි වැඩ පිළිවෙළක් ඇති කර දීම ඉතාමත් අවශ්‍යයි.

1956 න් පස්සේ තමයි විශ්ව විද්‍යාලවලට වැඩි වැඩියෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් බැඳෙන්නට පටන් ගත්තේ. ඊට හේතුවක් තිබෙනවා. මේ රටේ විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය ගම්බද දරුවන්ටත් ලබා ගැනීමට ඉඩ සලසා දීමේ ප්‍රතිඵලයක් වශයෙන් විශ්ව විද්‍යාලවලට වැඩි වැඩියෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් ඇතුළු වෙන්නට පටන් ගත්තා. ජනගහණය වැඩි වීමත් සමග අධ්‍යාපන පහසුකම් මේ රටේ ඇති වීමත් එක් හේතුවක් වුණා. වඩ වඩා විද්‍යාල, මහා විද්‍යාල, ඇතිවීමෙන් වැඩි පිරිසක් උසස් අධ්‍යාපනයට ඇතුළත් වීමේ භාග්‍යය ලැබුවා. ඒ වගේම විද්‍යාලවල ඉගෙනීමේ පහසුකම් වැඩි කිරීමත් වැදගත් හේතුවක් වුණා. මේ සියල්ලම බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් තමයි, ලංකාවේ විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබා ගන්නා සංඛ්‍යාව ඉතාමත් ඉක්මණින් වැඩි වෙලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම, අපගේ රටේ විශ්ව විද්‍යාලවලින් ගතයුතු නියම ප්‍රයෝජනය අප තවම ලබාගෙන නැහැ. අපට අවශ්‍ය ඉංජිනේරුවරුන්ගෙන් දොස්තරවරුන්ගෙන් ඉතාමත් සුළු කොටසක් පමණයි අද අපට සිටින්නේ. මේ රටේ ජනගහනය අනුව සසඳා බලන විට අපට සිටින වෛද්‍යවරුන් ගණන බොහොම අඩුයි. ක්‍රම සම්පාදක මණ්ඩලයේ වාර්තා අනුව මේ රටේ දොස්තරවරුන් සිටින්නේ 5,000 කට එක් කෙනකු පමණයි.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඊටත් අඩුයි.

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

එහෙම නම් කීයද? 6,000 කට එක් කෙනකු පමණ?


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔව්.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු අධ්‍යාපන ඇමතිතුමා කියන්නේ 6,000 කට එක්කෙනකු බවයි. කොයිතරම් කනගාටුදායක තත්ත්වයක්ද? ලෝකයේ වෙනත් රටවල තත්ත්වය මීට වඩා හුඟක් දියුණුයි. තායිවානයේ පවා ජනගහන යෙන් 1,750 කට දොස්තර කෙනකු බැගින් සිටිනවා. මැක්සිකෝවේ 1,700 කට එක් කෙනකු සිටිනවා. අරාබි සමූහාණ්ඩුවේ 2,600 කට එක් කෙනකු සිටිනවා. තුර්කියේ 2,800 කට එක්කෙනයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මන්ත්‍රීතුමා ඔය ගණන් හිලවු ගත්තේ කොහෙන්ද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේලාගේම ක්‍රම සම්පාදන මණ්ඩලයේ වාර්තාවලින් මා මේවා ගත්තේ. සමාජවාදී රටවල තත්ත්වය මොකක්ද? චෙකෝස්ලෝවැකියාවේ, ජනගහනයෙන් 500 කට එක්කෙනා බැගින් වෛද්‍යවරුන් සිටිනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔය ලියවිලි සභාගත කරනවද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

චෙකොස්ලෝවැකියාවේ 500 කට එක් කෙනා බැගින් වෛද්‍යවරුන් සිටිනවායයි කීම තමුන්නාන්සේ විශ්වාස කරන්නේ නැද්ද?

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

There should be no cross-talk please. Will the hon. Member please address the Chair?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මොකෙන්ද ඔය ගණන් හිලවු කිය වන්නේ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ රට සම්බන්ධයෙන් මට කියවන්නට ලැබුණු පොත්පත්වලින් මට දැනගන්නට ලැබුණු කරුණුයි මා ඉදිරිපත් කරන්නේ. තමුන්නාන්සේලාටත් වුවමනා නම් ඒ රටේ සෞඛ්‍ය කටයුතු පිළිබඳ පොත්පත් චෙකෝස්ලෝවැකියානු තානාපති කාර්යාල යෙන් ලබා ගන්නට පුළුවනි. ඒවා ලබා ගෙන කියවා බලන්න.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)

යුගෝස්ලාවියාවෙ වෛද්‍යවරුන් ගණන කීයද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

යුගෝස්ලාවියාවෙ ගණන් මා දන්නේ නැහැ.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)

දන්න එක විතරයි කියවන්නේ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

දන්න ඒව නැතුව නොදන්න ඒවත් කියන්න පුළුවන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
Will he table this document ?

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
Will the hon. Member table the document ?

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගරු සභාපතිතුමනි, මා කියන්නේ බොරුවක් නම් ඊට පිළිතුරු දී එය බොරුවක් බව ඔප්පු කිරීම අධ්‍යාපන ඇමතිතුමාගේ යුතුකමක්. අධ්‍යාපන ඇමතිතුමා මට වඩා හොඳට කරුණු දැන ගත යුතුයි.

ෂෙල්ටන් ජයසිංහ මයා.
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)
He must table the document. He cannot mislead the House. He cannot just get up and say something.

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ගුරුවරයකුව සිට ඊයේ පෙරේයිදා මේ මන්ත්‍රී මණ්ඩලයට පැමිණි මට වඩා මේ රටේ අධ්‍යාපනය භාරව සිටින ඇමතිතුමා මෙවැනි දේවල් පිළිබඳ තොරතුරු දැනගත යුතුයි. එම නිසා මා කියන දේවල අසත්‍යයක් තිබෙනවා නම්, "ඒක එහෙම නොවෙයි; මෙන්න මෙහෙමයි" කියා එළිදරව් කරන්න අධ්‍යාපන ඇමතිතුමාට යුතුකමක් තිබෙනවා.

ගරු ඊරියගොල්ල
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
අසත්‍ය යයි කියන්නේ නැහැ. අපට දැන ගන්නට ඒ ලේඛනය—

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
අසත්‍ය නොවේය කියනව නම් සත්‍යනෙ ? ඒක පිළිගන්න. [බාධා කිරීමක්] මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) මා ළඟට එනව නම් සම්පූර්ණයෙන්ම ඒ රටවල තිබෙන තත්ත්වය මට එතුමාට උගන්වන්ට පුළුවනි.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)
ඒක වෙන වැඩක්.

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මේ විස්තර ටික මගෙන්ම දැන ගන්න ඒ තරම් වුවමනාවක් තිබෙනවා නම් මේ සභාවේදී මට ඒක කරන්ට පුළුවන් කමක් නැහැ—

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)
තමුන්නාන්සේ කියන්න ඕනෑ, ඒ පොත්පත්—[බාධාකිරීම්]

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මගේ ළඟ තිබෙන පත්‍රිකා, පොත් පත් තමුන්නාන්සේට බලන්න දීල තමුන්නාන්සේට ඕනෑ නම් මට උගන්වන්න පුළුවන්.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
*(திரு. டென்சில் பெர்ணாண்டோ)*
(Mr. Denzil Fernando)
පොත් පත් ඕනෑ නම් අපේ ළඟත් තිබෙනව.

තුඩාවේ මයා.
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
තමුන්නාන්සේ මේ සභාවට නවක මන්ත්‍රීවරයෙක්. මට ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේට උගන්වන්න පුළුවන්. විශේෂයෙන්ම සමාජවාදී රටවල තත්ත්වයන් ගැන මම කියවා තිබෙනවා. මම ඒ රටවලට ගිහින් තිබෙනවා. මම ඒ රටවල සිදුවන කටයුතු ගැන පරීක්ෂා කර තිබෙනවා. ඒ නිසා මට පුළුවන්, ඒ කටයුතු ගැන තමුන්නාන්සේට උගන්වන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

අනේ, මට නම් උගන්වන්න හම්බ වෙන්නෙ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේ දැනගන්නත් කැමති නැහැ; ඉගෙන ගන්නත් කැමති නැහැ. තමුන්නාන්සේ එහෙම නම් මට උගන්වන්නයි එන්නෙ ?

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

නැහැ. මම කිව්වෙ නැහැ එහෙම.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

තමුන්නාන්සේට නම් මට උගන්වන්න බැරි බව කියන්නම්.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! Let the hon. Member speak.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்க)*
(Mr. Shelton Jayasinghe)

He is talking about the Health Department.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

A doctor has to be educated also.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ සෑහෙන තරම් වෛද්‍යවරුන් පුහුණු කරන්ට වුවමනා වී තිබෙනවා. ධනපති රට වල තත්ත්වයටත් නවම මේ රට ඇවිල්ල නැහැ. සමාජවාදී රටවල් අහලටවත් කිට්ටු කරන්ට බැරි වී තිබෙනවා, මේ රටේ තත්ත්වය. ඒ තරමට මේ රටේ වෛද්‍ය වරුන් හිඟයි.

**ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.**
*(திரு. டென்சில் பெர்ணண்டோ)*
(Mr. Denzil Fernando)

I rise to a point of Order. We are discussing Regulations introduced by the Minister of Education, but the hon. Member, without speaking on them, is speaking on something else.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The hon. Member may continue.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

නියෝජ්‍ය සභාපතිතුමනි, මීගමුවේ ගරු මන්ත්‍රීතුමා මොන පිස්සු කථා කරනවාදැයි මා දන්නෙ නැහැ. විශ්ව විද්‍යාලයක් ගැන කථා කරන විට, විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව ගැන කථා කරන විට, වෛද්‍ය වරුන් ගැන සඳහන් නොකර කොහොම කථා කරන්නද ?

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

මම මන්ත්‍රීතුමාට කිව්ව කථා කරන්න කියා. මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

බොහොම ස්තුතියි. අපේ රටේ කාර්මික අධ්‍යාපනයේ තත්ත්වය කොහොමද ? අපේ රටේ කාර්මික දියුණුව සඳහා අවශ්‍ය විශේෂඥ දැනුම ඇති උදවිය සෑහෙන ප්‍රමාණයක් නැහැ. 1948 සිට 1964 දක්වා අපේ රටේ කෘෂිකර්ම උපාධිධාරීන් 100 කට වඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බිහිවෙලා නැහැ. ඇත්ත වශයෙන්ම කියනව නම් අපේ රටේ සිටින කෘෂිකාර්මිකයන් සංඛ්‍යාව ගැන සලකා බැලුවාම මේ රටේ කෘෂිකාර්මික දියුණුවක් ඇති කරන්ට නම් කෘෂිකර්ම උපාධිධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කළයුතු බව පෙනී යනවා. උපාධිධාරීන් මගින් කෘෂිකාර්මිකයන්ට කෘෂිකර්මය පිළිබඳව සැහෙන අවබෝධයක් ලබාදීමෙන් තමයි රට සංවර්ධනය කරන්ට පුළුවන් වෙන්නෙ. අපි ඒ වගේ වැඩ පිළිවෙළක් ගැන තවම කල්පනා කරල නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ජපන් රටේ කෘෂිකාර්මික කම්කරුවන් 215 දෙනකුට එක උපාධිධරයකු බැගින් සිටිනව. ඉතින් ඒ රටේ කෘෂිකර්මය දියුණු වීම පුදුමයක් නොවෙයි. දැන් ඒ වාර්තා ඉදිරිපත් කරන්න යයි මට කියයි. ජපානය ඉතා විශාල අස්වැන්න ප්‍රමාණයක් ලබන රටක් යයි වාර්තාවල කියා තිබෙනවා. ඒසා විශාල අස්වැන්නක් ලබන්න හේතුව මොකක්ද? කෘෂිකාර්මික උපාධිධරයන් වැඩිපුර පුහුණු කර කෘෂිකාර්මික කම්කරුවන්ට සැහෙන අවබෝධයක් ලබා දී විද්‍යාව උපයෝගී කර ගෙන ගොවීන්ගේ දැනුම වැඩි කර තමයි ජපන් රට ඒ කෘෂිකාර්මික දියුණුව ලබා ගෙන තිබෙන්නෙ. අපේ රටේ තවම සිටිනවා, ගොවිතැනට පෝර වුවමනා නැතැයි සිතන උදවිය බොහොම දෙනෙක්. දෙවියන්ගේ බලයෙන් මේවා ඉෂ්ට කර ගන්නට බලාපොරොත්තු වන උදවිය තවමත් අපේ රටේ සිටිනව. එම නිසා අපේ රට ස්වයංපෝෂිත කරන්න නම්, අපේ රටේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කරන්න නම්, කෘෂිකාර්මික උපාධිධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කරන්න ඕනෑ. මේක බජට් එක නොවෙයි. මේ විවාදයට අදාළ කරුණු මා ඉදිරිපත් කරන්නෙ. ඒ අනුව බලනවා නම් අපේ රටට කෘෂිකර්ම උපාධිධාරීන් නවදහසක් පමණ වුවමනා කරනවා. ඒ තරමට අපේ විශ්ව විද්‍යාලවල තත්ත්වය දියුණු කිරීම අවශ්‍ය වී තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අයවැය ලේඛන විවාදයේදී ඔය කරුණු ගැන විස්තර වශයෙන් කථා කරන්නට පුළුවන් නොවැ.



තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

මගේ කථාව අහන්න ඔය තරම් අකැමැති නම් කෙටි කරන්නම්.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

අකමැති නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

තමුන්නාන්සෙගෙ එක වරදක් තීබෙනවා. තමුන්නාන්සේට ඉදිරිපත් කරන දේවල් පිළිගන්නට තමුන්නාන්සේ ලෑස්ති නැහැ. තමුන්නාන්සේ තුළ දැන් තිබෙන්නෙ ඒකාධිපති අදහස්. මෙපමණ කාලයක් තුළ ගුරුවරුන්ගේ බෙලි කැපීම නවත්වන්නය කියා අප කියා සිටියා. නමුත් තමුන්නාන්සෙ තවමත් කරනව නොවැ ඒක. [බාධා කිරීමක්]

ඊළඟට තිබෙන ප්‍රශ්නය භාෂා මාධ්‍යය පිළිබඳ ප්‍රශ්නයයි. පසුගිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවත් සභාග ආණ්ඩුවත් සිංහල භාෂාව විශ්ව විද්‍යාලය දක්වා ඉගැන්වීමේ මාධ්‍යය කරන්නට සෑම අනුබලයක්ම දුන්නා පමණක් නොවෙයි, ඒ පරමාර්ථය ඉෂ්ට කර ගැනීමේ අදහසින් සියලුම අවශ්‍ය කටයුතු කරගෙන ගිය බවත් තමුන්නාන්සේ දන්නවා. නමුත් 1965 දී බලයට පත්වූ මේ ආණ්ඩුව ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම අනිත් පැත්ත පෙරළන්නට උත්සාහයක් දරාගෙන යනවා. මේ ආණ්ඩුව සිංහල භාෂාව රාජ්‍ය භාෂාව ලෙස පිළිගන්නවාය, විශ්ව විද්‍යාලය දක්වා සිංහලෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිගන්නවාය කියා රටට කියා පෑවාට මොකද ක්‍රියා කිරීමේදී ඒ අදහස් සම්පූර්ණයෙන්ම කඩාකප්පල් වන විධියටයි වැඩ කරගෙන යන්නෙ. ඇත්ත වශයෙන්ම එහි පුදුමයක් නැහැ. ධනපති අධිරාජ්‍යවාදී ප්‍රතිපත්තියක් අනුගමනය කරන උදවිය ඒ විධියට තමයි කටයුතු කරන්නෙ. අධ්‍යාපන ඇමතිතුමා සෑම ස්ථානයකදීම ඉංග්‍රීසි ගැනමයි කථා කරන්නෙ. වැඩි වැඩියෙන් ඉංග්‍රීසි ඉගෙන ගන්නය යන්නයි එතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

නිතරම කියන්නෙ. අධ්‍යාපන ඇමතිතුමා සංචාරය කරන සෑම ස්ථානයකදීම වැඩි වැඩියෙන් ඉංග්‍රීසි ඕනෑය කියා ප්‍රකාශ කරන බවයි අපට ප්‍රවෘත්ති පත්‍රවලින් පෙනෙන්නෙ. බාලාංශයේ සිටම ඉංග්‍රීසි උගන්වන්නට තමුන්නාන්සේගේ අදහසක් තිබෙනවාද ?

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

නැහැ. එහෙම අදහසක් නැහැ.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

එතුමා තුළ එවැනි අදහසක් නැතිලු. එහෙම නම් තුන්වැනි පන්තියේ සිට ඉංග්‍රීසි උගන්වන්නට අදහසක් තිබෙනවාද? තුන්වැනි පන්තියේ සිට ඉංග්‍රීසි ඉගැන්වීමේත් තේරුමක් නැහැ. එක් අතකින් උගන්වන ඉංග්‍රීසියකුත් නැහැ. අනෙක් අතින් රටේ ධනය නිරපරාදේ පාවිච්චි කිරීමක්. ඒ ගුරුවරුන් වෙන වැඩවලට යොදවා ගන්නටත් බැරි වෙනවා. ඒ අතින් බලන විට තුන්වැනි පන්තියේ සිට ඉංග්‍රීසි ඉගැන්වීමත් රටට පාඩුයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

මේ රෙගුලාසි ඔය කියන කාරණයට සම්බන්ධ නැහැ. ඒ පනතත් කෙටුම්පත ළඟදීම ඉදිරිපත් කරනවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

ඉංග්‍රීසි නැතිව මේ කටයුතු කරන්නට පුළුවන් බවයි මා කියන්නෙ. ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මාධ්‍යය වශයෙන් දිගටම පවත්වාගෙන යන්නට වුවමනාවක් නැහැ. සිංහල භාෂා මාධ්‍යයෙන් මේක කරන්නට පුළුවනි. දෙමළ භාෂා මාධ්‍යයෙන් මේක කරන්නට පුළුවනි. ලෝකයේ බොහෝ රටවල එය ක්‍රියාවට පරිවර්තනය කර තිබෙනවා. සෝවියට් දේශයට ඉගෙන ගන්නට යන අපේ රටේ ළමයි ගැන තමුන්නාන්සේ දන්නවා. ඒ ළමයි සෝවියට් දේශයට ගිහින් වෛද්‍ය විද්‍යාව පවා ඉගෙන ගන්නෙ රුසියන් භාෂාවෙනුයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

සෝවියට් දේශයේ ළමයිනුත් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නවා.

තුඩාවේ මයා.
(திரு. துடாவ)
(Mr. Tudawe)

සෝවියට් දේශයේ පමණක් නොවෙයි, වෙන රටවල ළමයිනුත් ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. නමුත් ඒ ළමයින් තමන්ගේ මව් භාෂාවෙන් වෛද්‍ය විද්‍යාව පවා හදාරණවා. ඒවාගේම ඉංජිනේරු විෂයනුත් අනික් විෂයනුත් ඉගෙන ගන්නෙ රුසියානු භාෂාවෙනුයි. ලංකාවෙන් සෝවියට් දේශයට යන ශිෂ්‍යයින්ට අවුරුද්දක් තුලදී රුසියානු භාෂාව ගැන සම්පූර්ණ අවබෝධයක් ලබා දෙනවා. ඉන්පසු ඒ භාෂාවෙන් තමයි අපේ ශිෂ්‍යයින් ඉගෙන ගන්නෙ. වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව හා අනෙකුත් විෂයයන් ඔවුන් රුසියානු භාෂාවෙන් ඉතා දක්ෂ අන්දමට හදාරණවා පමණක් නොවෙයි ඒ බව ක්‍රියාවෙනුත් ඔප්පු කර තිබෙනවා. එසේ සෝවියට් රුසියාවේදී උසස් අධ්‍යාපනයක් ලබා ලංකාවට ආ ඒ ශිෂ්‍යයන් ඉතා දක්ෂ අන්දමින් ක්‍රියා කර තිබෙන බව තමුන්නාන්සේලා පත්‍ර මාර්ගයෙන් දකින්නට ඇති. යන්ත්‍ර-සූත්‍ර කඩා යකඩවලට විකුණන්නට සූදානම් කර තිබූ අවස්ථාවල, ඒ රටවලට ගොස් උසස් අධ්‍යාපනයක් ලබා ආ ශිෂ්‍යයන් ඒ යන්ත්‍ර-සූත්‍ර අහක දමන්නට ඉඩ නොදී ඒවා අළුත්වැඩියා කොට ප්‍රයෝජනයට ගැනීමට සැලැස්වූ බව, ඒ ශිෂ්‍යයන් එතරම් දක්ෂ අන්දමින් ක්‍රියා කර තිබෙන බව මට දැන ගන්නට ලැබී තිබෙනවා. ඒ නිසා ඉංග්‍රීසියම ඕනෑ, කියන එක—වෛද්‍ය විද්‍යාව හදාරන්නට ඉංග්‍රීසිය ඕනෑ, ඉංජිනේරු විද්‍යාව හදාරන්නට ඉංග්‍රීසිය ඕනෑ, කියන එක—පට්ටපල් බොරුවක්. ඉංග්‍රීසියම ඕනෑය කියමින් කරන්නට හදන්නේ, ඊනියා මහත්තත්වයක් ආරක්ෂා කර ගැනීමට කටයුතු කිරීමයි. ඉංග්‍රීසිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැත්නම් කිසිම මහත්තත්ත්වයක් නැතැයි කියන එකයි, මේ ආණ්ඩු පක්ෂයේ වැඩි දෙනාගේ අදහස. අධ්‍යාපන ඇමතිතුමාගේ අදහසත් එයමදැයි හරියටම කියන්නට මට පුළුවන්කමක් නැහැ. මගේ සාමාන්‍ය අදහස නම් අධ්‍යාපන ඇමතිතුමා සිංහලට කැමැතිය යන්නයි, සිංහලෙන් සැම කටයුත්තක්ම කරන්නට කැමතියි යන්නයි.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඉස්සර කැමැත්තක් දැක්වූවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ අතීතය ගැන කල්පනා කර තමයි, මා කියන්නේ. නමුත් මේ ආණ්ඩු පක්ෂයේ වැඩි දෙනාගේ අදහස තවදුරටත් ඉංග්‍රීසියම තබා ගන්නටයි. ඒ අය සියල්ලම කරන්නට බලාපොරොත්තු වන්නේ ඉංග්‍රීසියෙන්. ඒ නිසා, ඉංග්‍රීසියට දක්වන මේ කැදරකම, ගැතිකම, වහල්කම ඉවත් කර, මේ රටේ විශ්ව විද්‍යාලවල කටයුතු සම්පූර්ණයෙන්ම සිංහලෙන් කිරීමට අවශ්‍ය විධිවිධාන යොදන ලෙස අප ඉල්ලා සිටිනවා.

අද අපේ ඇමතිවරුන්ට සිංහලෙන් කථා කරන්නට බැහැ නොවැ? කථාවක් කළොත් කරන්නේ, ඉංග්‍රීසියෙන්. මේ රටේ තිබෙන ඉතාමත් ශ්‍රෙෂ්ඨතම, උත්තරීතර මණ්ඩලයේ—මුළු රටටම කැඟසා කියන මේ සභාවේ—සිංහලෙන් කථා කරන්නට ඔවුන්ට බැහැ. ඉතින් කොහොමද අපි කියන්නේ, ඔවුන් තුළ සිංහලයට ආදරයක් තිබෙනවාය කියා? සිංහලයට ආදරයක් තිබෙනවා නම්, සිංහල රටට ආදරයක් තිබෙනවා නම්, සිංහල භාෂාවටත් ආදරයක් තිබෙන්නට ඕනෑ; සිංහල භාෂාවට නියම ස්ථානය දෙන්නට ඕනෑ; හැම අවස්ථාවකදීම ඒ භාෂාවෙන් කථා කරන්නට ඕනෑ. එයයි, සිංහලයට, සිංහල රටට ආදරය දක්වන නියම ක්‍රමය. ඒ නිසා, විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය සිංහල මාධ්‍යයෙන් කිරීම ඉදිරියට ගෙන යාමට හරස්කපන, බාධා කරන ගුරුවරුන් ඒ විශ්ව විද්‍යාලවල ඉන්නවා නම්, ඔවුන්ට කිසිම දයාවක් නොදක්වන ලෙස, අධ්‍යාපන ඇමතිතුමා මේ ගරු සභාවේදී අපට පෙන්වන එඩිතරකම විශ්ව විද්‍යාලවල උගන්වන ඒ ගුරුවරුන්ටත් පෙන්වන ලෙස මා එතුමාගෙන් ඉල්ලා සිටිනවා.



උසස් අධ්‍යාපන ආඥාව

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "ලංකාව සංස්කෘතික කාන්තාරයක්ය" යි අයිවර් ජෙනිංස් උන්නැහේ ඒ කාලයේ කියූ බව තමුන්නාන්සේ දන්නවා. අයිවර් ජෙනිංස්ට මේ රටේ ඇති සංස්කෘතියක් නැහැ. ඒ විධියටයි උන්නැහේ ඒ කාලයේ කල්පනා කළේ. ඒ පුරුද්ද, ඒ සිතුවිලි තමයි තවමත් මේ විශ්ව විද්‍යාලවලට රිංගාගන තිබෙන්නේ. ඒ සිතුවිලි, ඒ පුරුදු ඉවත් කරන්නට දැන් කාලය පැමිණ තිබෙනවා. අපේ රට සංස්කෘතික කාන්තාරයක්යයි කියන යම්කිසි පුද්ගලයෙක් මේ රටේ විශ්ව විද්‍යාල භාරව සිටියා නම්, මේ රටේ අනාගතය පිළිබඳ සේවයක් එවැනි පුද්ගලයකුගෙන් අප බලාපොරොත්තු වන්නේ කොහොමද? අදත් ඒ තත්ත්වය තිබෙනවා. ඒ නිසා එම තත්ත්වය නැති කිරීමට කටයුතු කිරීම අවශ්‍යයි.

මා අද උදේ "ලංකාදීප" පත්‍රයේ දුටුවා, බොහොම ලස්සණ ප්‍රකාශයක්, ලිපියක්. ඒ ලිපියෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමාටත් මල් පොකුරක් පිළිගන්වා තිබෙනවා. එහි උඩින්ම තිබෙන්නේ, "වෙද විදුහල සිංහලට බසී—රෝහල්වල ප්‍රශ්නයකි" කියායි. තමුන්නාන්සේගේ දැන ගැනීම සඳහා මා දැන් එය කියවනවා :

"1968 වර්ෂයේ සිට ලංකා විශ්ව විද්‍යාලයේ වෛද්‍ය, ඉංජිනේරු හා විද්‍යා අංශවලට ඇතුළු වන ශිෂ්‍යයන්ට සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීමට ඒ අංශවල මහාචාර්යවරු කැමැත්ත පළකොට සිටිති. ඒ නිසා ඉතිහාසයේ පළමු වරට ඉංග්‍රීසි වෙදකම සහ බටහිර ඉංජිනේරු විද්‍යාව සිංහලෙන් ඉගැන්වීම කෙරෙනු ඇත්තේ 1968 වර්ෂයේ සිටය.

වෛද්‍ය විද්‍යාලයේ ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට සිංහලෙන් බටහිර වෙදකම ඉගැන්වීමට තීරණය කොට ඇතත්, රෝහල්වලදී මේ ශිෂ්‍යයන්ට ප්‍රායෝගික පුහුණුවක් දීමේදී ඔවුන්ට ඉගැන්වෙනු ඇත්තේ සිංහලෙන් හෝ ඉංග්‍රීසියෙනි.

රෝහල්වලදී වෛද්‍ය ශිෂ්‍යයන්ට ඉගැන්වීමට නියමිතව ඇත්තේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ සේවය කරන වෛද්‍ය විශේෂඥයන්ට හෙයින්, සිංහලෙන් ඉගැන්වීමට ඒ වෛද්‍යවරුන්ගේ කිසිදු බැඳීමක් නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

කෙසේ හෝ 1968 වර්ෂයේ සිට වෛද්‍ය විද්‍යාලයට ඇතුළු වන්නට සුදුසුකම් ලබන දරුවන් මව් බසින් විද්‍යාව හැදෑරූ අය හෙයින් ඔවුන්ට වෛද්‍ය විද්‍යාලය තුළද ඉගැන්විය යුත්තේ මව් බසින්ම බැව් අධ්‍යාපන ඇමති අයි. ඇම්. ආර්. ඒ. ඊරියගොල්ල මහතා දිසාපාමොක්ට කීවේය.

එසේ ඇතුළු වන අයට හොඳ ඉංග්‍රීසි අධ්‍යාපනයක්ද ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය මහත් සේ සැලකිලිමත් වන බැව් අධ්‍යාපන ඇමතිවරයා කියයි.

එහෙත් ඔවුන්ට ඉංග්‍රීසි අනිවාර්ය නොවේ.

වෛද්‍ය විද්‍යාව උගන්වනු සඳහා පොත් සංඛ්‍යාවක් සිංහලෙන් මුද්‍රණය වී ඇති නමුදු නවතම මත අඩංගු වනුයේ බටහිර සිට එන වෛද්‍ය විද්‍යාත්මක පොත්පත්වල නවතම සංස්කරණ මුහුණුවල හෙයින් ඉංගිරිසි පොත් පත් අනිවාර්යයෙන්ම උපයෝගී කොටගෙන සිංහලෙන් උගන්වන ලෙස මහාචාර්යවරුන්ට උපදෙස් දී තිබේ.

අධ්‍යාපන ඇමතිවරයා එසේ උපදෙස් දී ඇත්තේ එක ඉංග්‍රීසි පොතක් සිංහලෙන් පරිවර්තනය කොට මුද්‍රණද්වාරයෙන් පිට වෙද්දී ඒ පරිවර්තනයට මුල් වූ පොතේ නව සංස්කරණය 22 ක්ම පිට වී ඇති හෙයිනි.

අප මේ තත්ත්වය පිළිගන්නවා. වෛද්‍ය විද්‍යාව වැනි විෂයයන් සම්බන්ධයෙන් මොහොතින් මොහොත අලුත් අලුත් මත ඉදිරිපත් වෙනවා. ඒවා ගැන දැන ගැනීම ඉතාමත්ම අවශ්‍යයි. එහෙත් පොත් පරිවර්තනය කිරීමෙන් නම් ඒ මත ඉක්මනින් දැන ගන්නට පුළුවන් කමක් නැහැ. විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් ඉංග්‍රීසි භාෂාව හොඳින් ඉගෙන ගෙන ඉක්මනින් අලුත් අලුත් මත දැන ගත යුතුයි. අලුත් මත උරා ගන්නට ශක්තිය ඒ ශිෂ්‍යයනට තිබෙන්නට ඕනෑ. එහෙත් ඒ නිසාම භාෂා මාධ්‍යය වෙනස් කළයුතු යයි කිය යුතු නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අප එහෙම කියන්නේ නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මුස්ලිම් පාඨශාලාවල ළමයින් භාෂා කීපයක්ම ඉගෙන ගන්නවා. අරාබි, දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා හතරම ඒ අය ඉගෙන ගන්නවා. එහි කිසිම වරදක් නැහැ. සිංහල ශිෂ්‍යයන් ඉගෙන ගන්නේ සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා දෙකයි. එහෙත් තවත් භාෂා ඉගෙන ගන්නට පුළුවන් නම් හොඳයි. පුළුවන් නම් රුසියන්, චීන, හින්දි වැනි භාෂා ඉගෙන ගත්තාට කමක් නැහැ. එහෙම ඉගෙන ගන්න තරමට ප්‍රයෝජනවත් වෙනවා. [බාධා කිරීමක්] ඉංග්‍රීසි ඉගෙන ගැනීම වරදකැයි අප කියන්නේ නැහැ. එහෙත් කාලාන්තරයක් තිස්සේ අප ඉංග්‍රීසියට ගැතිව සිටි පලියටම ඒකම ඉගෙන ගත යුතු නැහැ. වුවමනා නම් ඉංග්‍රීසි වෙනුවට වෙනත් ලෝක භාෂාවක් ඉගෙන ගන්නට අවසථාව දෙන්නට ඕනෑ. ඉංග්‍රීසියට තිබෙන ගැතිකම නැති කරන්නට ඕනෑ. ඉංග්‍රීසියෙන්ම උගන්වන්නට තිබෙන වුවමනාව මොකක්ද?

මා කථා කරන්නේ විශ්ව විද්‍යාල භාෂා මාධ්‍යය ගැනයි. මව් බසින් ඉගැන්විය යුතු බව ලෝකයේ සිටින අධ්‍යාපන විශාරදයන්ගේ මතයයි. මව් බසින් උගන්වන්නේ නැත්නම් දැනුම තහවුරු කරන්නට බැහැ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The Hon. Minister does not say that he is not going to teach Sinhalese. He also believes that education does not stop with Sinhalese.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

මේ ආණ්ඩුව කරන්නේ කියන එක නොවෙයි. මෙතැන ඇවිත් නොයෙක් දේ පොරොන්දු වෙනවා. ඒ වගේම පලිගන්නේ නැතැයි කියනවා. මා නියෝජනය කරන කොට්ඨාශයේ සිටින ගුරුවරයකු ඊයේ පෙරේදා "දවස" පත්‍රයෙහි ලියමනක් පළ කිරීමේ වරදට ත්‍රිකුණාමලයේ විද්‍යාලයකට මාරු කර යවා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අස් කරල නැද්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

අස් කරල නැහැ. මාරු කර යවා තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

දෙපාර්තමේන්තුවෙන් අවසර නොගෙන එහෙම ලියුම් පළ කළාම අස් කරනවා.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඒ ගුරුවරයාගේ නම කුමාරප්පෙරුම. ඔහු පදිංචිව සිටින්නේ මාතර හිත්තටියේ යි. "ගොඩගම කුමාරප්පෙරුම" නමින් "දවස" පත්‍රයේ ලියමනක් පළ කළ නිසා ඔහු ත්‍රිකුණාමලයට මාරු කර යවා තිබෙනවා. ඒ ලියමනෙන් ඔහු කර තිබෙන්නේ ගුරුවරුන් මාරු කිරීමේ ක්‍රමය විවේචනය කිරීමයි. මුල් අකුරු කිසිවක් නැතිව නිකම් "ගොඩගම කුමාරප්පෙරුම" නමින් ඔහු ලියමන පළ කළ තරමින් ඔහු මාරු කර යවා තිබෙනවා. ඔහු උගන්වමින් සිටියේ වැලිගම් වටගෙදරමුල්ලේ යි. මාතර කොට්ඨාශයට එක්සත් ජාතික පක්ෂයෙන් තරග කොට පරාජයට පත් වූ ජස්ටින් විජේවර්ධන මහතාගේ ලියමනක් උඩ ඔහු ත්‍රිකුණාමලයට මාරු කර යැව්වා. ගරු අධ්‍යාපන ඇමතිතුමා නම් නිතරම ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඔහොම දෙයක් සිදු වී තිබෙන බව දැනුම් දුන්නාද ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

කිසි දිනෙක මා තමුන්නාන්සේ මුණ ගැසෙන්නට පැමිණ නැතත් මේ කාරණය ගැන නම් තමුන්නාන්සේ මුණ ගැසෙන්නට මා අදහස් කරගෙන සිටියා. මා මේ ගැන අධ්‍යාපන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාට නම් කිවා. නමුත් කිසිම වැඩක් වුණේ නැහැ. [බාධා කිරීමක්] මා ඒ ගැන කීවේ තමුන්නාන්සේ කියන දේ මට පිළිගන්ට බැරි නිසයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තමුන්නාන්සේ මේ ගැන කියලත් නැහැ. තමුන්නාන්සේ හමු වුණෙත් නැහැ ; ඒ ගැන දන්නෙත් නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ඔන්න එහෙනම් මම ඒ ගැන ප්‍රසිද්ධියේ ම කිව්වා. එනිසා මා කියා සිටිනවා ඒ ගුරුවරයාට කරුණාකර ගාලු දිස්ත්‍රික්කය දෙන ලෙස. ගාලු දිස්ත්‍රික්කය දෙන්ට බැරි නම් හම්බන්තොට දෙන්න ; මාතරට දෙන්න. පත්‍රයකට ලිපියක් ලිව්ව පලියට එවැනි දඬුවමක් දීම කොතරම් අසාධාරණයක් ද ? එම ගුරුවරයා එවැනි ලිපියක් ලිව්වාය කියා ඔප්පු කරන්ටත් බැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ පළාතේ ජස්ටින් විජයවර්ධන නමින් කෙනෙක් සිටිනවා. අර කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (පර්සි වික්‍රමසිංහ මයා) කීවා වාගේ ඒ මිනිහා හැම දේටම ඇඟිලි ගහනවා ; ලියුම් ලියනවා. අරක කරන්න, මේක කරන්න කිය කියා ඇමතිවරුන්ට කරදර කරනවා. ඉන්න දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] හිටපු මන්ත්‍රී දවස් 33 යි හිටියේ. නමුත් හැම එකටම ලියනවා, මාතර හිටපු මන්ත්‍රී, මාතර හිටපු මන්ත්‍රී කියලා. ගරු ඇමතිතුමා කියනවා, "මම කරනවා ; මම කරනවා" යනුවෙන් නමුත් අපි පිළිගන්නේ කෙසේද ? එතුමා කීවා අස් කරපු ගුරුවරුන්ට ජූලි මාසයේදී වැඩ දෙනවාය කියා. දැන් ජූලි මාසය ඉවර වේගෙන යනවා. කෝ ඒ අය සේවයට ගත්තාද ? මා අහනවා, මේහෙමත් වැඩක් තිබෙනවාද කියා. අනුකම්පාව කියන එක තියෙන්ට ඕනෑ නේද ? මා මෙම කරුණු කියන්නේ ලොකු වේදනාවකින්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙවැනි ගුරුවරුන් විඳින දුක් කරදර, මානසික වේදනා දෙස බලන විට ඒවා ගැන මෙම සභාව ඉදිරියේදී පැය ගණන් කතා කරන්ට පුළුවනි. වහාම මේ ගුරුවරුන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]
ටික ගන්නවාය; මේ ගැන මටත් කනගා වුය කියා අධ්‍යාපන ඇමතිතුමා පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉටු කළාද? එනිසා එතුමා කියන දේවල් ඉටු කරනවායැයි කෙසේද පිළිගන්නේ?

සිංහලෙන් තමයි වැඩ කරන්නේ කියා එතුමා කියනවා. නමුත් එතුමාට වැඩ කරන්ට විදියක් නැහැ. නොයෙකුත් විදියේ බලපෑම් තිබෙනවා. අධ්‍යාපන ඇමති ධුරයෙන් පවා එතුමා පන්නන්න හදනවාය කියා අපට ආරංචියි. කතෝලික පල්ලියට පාඨශාලා ටික ආපසු දීමේ චේතනාවෙන් එතුමාව පන්නන්න ව්‍යාපාරයක් ගෙනියනවා නම් අපි ඊට කෙළින්ම විරුද්ධ වෙනවා. පාඨශාලා රජයට ගත්තේ ජාතික අධ්‍යාපන ක්‍රමය නිසිසේ ක්‍රියාවේ යොදවන්නයි. මීගමුව අතුරු මැතිවරණයේදී ලොකු කුමන්ත්‍රණයක් ගෙන ගොස් තිබෙනවා, මෙම පාඨශාලා පල්ලියට ආපසු දෙන්ට. කෙසේද දෙන්ට හදන්නේ? අධ්‍යාපන ඇමතිතුමා එම ධුරයෙන් පන්නා දමා වෙන කෙනෙකුට එම ධුරය දෙන්ට හදනවා. පාඨශාලා ටික ආපසු පල්ලියට දෙන්ට බැරිය කියා එතුමා තදින් සිටින බව ආරංචියි. එතැනදී නම් අපට එතුමාගේ පැත්ත අර ගෙන එතුමාත් සමග සටන් කරන්ට සිදු වෙනවා. කාටකාට දෙන්ට යනවාද දන්නේ නැහැ. පත්‍රවල මේවා සඳහන් වෙනවා. හැම තැනම කසුකුසු තිබෙනවා. අපට ආරංචියි මෙවැනි ව්‍යාපාරයක් ගෙනියන්න හදනවාය කියා. මේ පාඨශාලා ටික නැවත පල්ලියට දීම සඳහා ව්‍යාපාරයක් ගෙනියනවා නම් අපි සම්පූර්ණයෙන්ම ඊට විරුද්ධව සටන් කරනවා. මීගමුව ආසනය දිනාගන්න ඔනෑ තරම් පොරොන්දු දෙන්ට පුළුවනි. [බාධා කිරීම්]

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
මීගමුවට ගොස් හතර ගාතය දමා වැඳලා ඇන් මෙතැනට එනවා. නිකන් ඉන්නවා අයිසේ. ඔය කතාව විතරක් කියන්න එපා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
ඔන්න පල්ලිය ආවා.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
මීගමුවේදී හතර ගාතේ දමා වැන්දා. පල්ලියේ දොරකඩ හිටගෙන සිටියේ නැද්ද?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
පාඨශාලා රජයට පවරා ගෙන ජාතික අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම සඳහා ආරම්භ කළ වැඩ පිළිවෙළ තමුන්නාන්සේලා නවත්වන්ට උත්සාහ කළාට රටේ ජනතාව ඊට ඉඩ දෙන්නේ නැහැ. මේ රටේ පාඨශාලා රජයට ගැනීමේදී කම්බි ගසා පාඨශාලා වට කරගෙන තමුන්නාන්සේලා ගෙන ගිය ව්‍යාපාරය ඉදිරියටත් ගෙනයාමට ඉඩ දෙන්න බැහැ.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
මොකද, තමුසේ නවත්වන්නද යන්නේ?

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
මා නොවෙයි, මහජනයායි නවත්වන්නේ. [බාධා කිරීම්] ඔකෙන් තේරෙනවා තමුන්නාන්සේලාගේ අදහස්.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)
මගේ අදහස් එම අදහස්ම තමයි. කවදාවත් වෙනස් වෙලා නැහැ. වෙනස් කරන්නේත් නැහැ.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)
ඒක තමයි තමුන්නාන්සේලාගේ වුවමනාව. අධ්‍යාපන ඇමතිවරයා පන්නා දමා වෙන කෙනෙකුට මේක භාර දීලා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පාඨශාලා ආපසු කතෝලික පල්ලියට දෙන්න උන්නැහේලාගේ අදහස තිබෙනවාය කියන එක දැන් ප්‍රකාශ වුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කථා කරමින් සිටියේ විශ්ව විද්‍යාලයේ සිංහල මාධ්‍යය ගැනයි. සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය දීම දිගටම පවත්වා ගෙන යනවාය කියා ගරු අධ්‍යාපන ඇමතිතුමා කිව්වා. අප ඒ ගැන සන්තෝෂ වෙනවා. සිංහල මාධ්‍යයෙන් ඉංග්‍රීසි මාධ්‍යයට බහින්නට ඉඩ දීම වලක්වනවා වගේම ඉංජිනේරු විද්‍යාව හා වෛද්‍ය විද්‍යාව ඉගෙන ගැනීමට ඉංගිරිසිය පිළිබඳ විශේෂ දැනීමක් අවශ්‍යයයි කියන මතය උඩ සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගෙන එන ළමයින්ට සිංහල මාධ්‍යයෙන් ඉංජිනේරු හා වෛද්‍ය විද්‍යා ඉගෙන ගැනීමට හරස් කැපීමක් කරන්නට යනවා නම් එයට ඉඩ නොදීමට වගබලා ගන්නා ලෙසත් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් අප ඉල්ලා සිටිනවා. එවැන්නකට ඉඩ දෙනවා නම් එය ලොකු විනාශයක් ; මේ රටේ ගම්බද ප්‍රදේශවලින් එන සිංහල දරුවන්ට කරන ලොකුම වරදක් ; අපරාධයක්. ඉංගිරිසිය දෙස බලා, සිංහලෙන් ඉගෙන ගෙන එන ළමයින් කොන් කර දමනවා නම් එය ලොකුම වරදක්. ඒ නිසා එවැන්නකට ඉඩ නොතබන ලෙස මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ඉංගිරිසි නැතිව බැරිය යන අදහස ඇතැම් විශ්ව විද්‍යාලයවල වපුරාගෙන යනවා. මා පුවත් පත් වාර්තාවක දැක්ක, විද්‍යෝදය විශ්ව විද්‍යාලයයේ එක්තරා කථිකාචාර්යවරයෙක් ඉංගිරිසියේ අගය කියාගෙන ගොස් ප්‍රකාශ කර තිබුණා, බාලාංශයේ සිට ඉංගිරිසිය උගන්වන්නට ඕනෑය කියලා. එවැනි අය අපේ විශ්ව විද්‍යාලවල සිටිනවා නම් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය දීම කර ගෙන යන්නේ කොහොමද ? සිංහලයට ලැබිය යුතු තැන ලැබෙන්නේ කොහොමද ? ඒ නිසා ටිකක් විමසිලිමත්ව මේ ගැන ක්‍රියා කරන ලෙස ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා.

අ. භා. 6

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

වෙලාව 6 යි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

ගරු අධ්‍යාපන ඇමතිතුමා ගන්නට යන්නේ අලුත් වැඩ පිළිවෙළක් බව එතුමා සලකන්නට ඕනෑ. මේ රටේ විශ්ව විද්‍යාල එකක් තිබුණු අවස්ථාවක විශ්ව විද්‍යාල හයක් හෝ හතක් අවශ්‍යයි කියමින් සැහෙන හඬක් නැගූ කෙනෙක් හැටියට කොළඹ නගරයේ තවත් විශ්ව විද්‍යාලයක් ඇති කිරීම සම්බන්ධව ඇත්තෙන්ම මේ අවස්ථාවේදී අපි එතුමාට ප්‍රශංසා කළ යුතුයි. එතුමා මේ පියවර ගැනීම සම්බන්ධවත් එතුමාට ප්‍රසංශා කළ යුතුයි. එහෙත් අපේ ඉල්ලීම එයින් තෘප්තියට පැමිණෙන්නට එපාය කියන එකයි. සැහෙන අඩු පාඩු රාශියක් තිබෙනවා. ඒවා සම්බන්ධව මට කලින් කථා කළ දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) තමුන්නාන්සේලා වෙත කරුණු ඉදිරිපත් කළා. ඒ සම්බන්ධව මා විසිනුත් කරුණක් දෙකක් විශේෂයෙන් සඳහන් කළ යුතුව තිබෙනවා.

කොළඹ විශ්ව විද්‍යාලයක් ඇති කිරීමේදී මේ ශිෂ්‍යයින්ට ලොකුම අඩු පාඩුවක් ඇති වෙනවා. පේරාදෙණියේ නම් සැහෙන පුස්තකාලයක් තිබෙනවා. සැහෙන පුස්තකාලයක් නැතිව කවදාවත් විශ්ව විද්‍යාලයක හරිහැටි ඉගෙන ගන්නට පුළුවන් කමක් නැහැ. අර්ථ ශාස්ත්‍රය ආදී විෂයයන් උගන්වන විට දවස් පතාම අලුත් අදහස් මතු වෙනවා. ඒ නිසා ඒවා බලා ගැනීමට නොයෙකුත් විධියේ සඟරා ආදිය ගන්නට ඕනෑ. එහෙත් එවැනි පුස්තකාල පහසුකම් කොළඹ විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයින්ට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

නැහැ. අද ඔවුන් යන්නේ කොළඹ නගර සභාවේ පුස්තකාලයටයි. එම පුස්තකාලයත් අද පිස්සිගෙ පළා මල්ල වගෙයි. එතන රණ්ඩු දබරත් ඇති වෙනවා. ඉගෙන ගන්නා ළමයකුට අවශ්‍ය විවේකයක් එතන නැහැ. උදේ පාන්දර ආ එක්කෙනා එතන ලගිනවා. එතකොට තවත් කෙනෙකුට එතන පත්‍රයක් බලන්නටවත් ඉඩක් ඉතිරි වන්නේ නැහැ. ඒ ළමයින් ඉගෙනීම කරන්නේ අමාරුවෙනුයි. ඔය අන්දමට විශාල කරදරයක් ඇති වෙනවා. මේ තත්ත්වය වෙනස් කර සාර්ථක කර නොගත්තොත් විශ්ව විද්‍යාලයෙන් ප්‍රයෝජනයක් නැති වෙනවා. විශ්ව විද්‍යාලයට අවශ්‍ය ගොඩනැගිලි ඉදිකිරීම ඉතාමත් ලොකු, වැදගත්ම වැඩක් නිසා ඒ හැම දෙයක් ගැනම උනන්දු වී අඩුපාඩුකම් හැකි තාක් දුරට පුළුවන් තරම් ඉක්මනින් හරිගස්සන්නට කටයුතු කළ යුතුයි.

දැනට කොළඹ ඉගෙනීම ලබන ළමයින්ට විඳින්නට සිදු වී තිබෙන හිරිහැර කරදර සහ දුෂ්කරතාවන් ගැන ගරු ඇමතිතුමා දන්නවා. විශේෂයෙන්ම වාසස්ථාන සොයා ගැනීමේ ප්‍රශ්නය මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කෙරෙහි තදින් බල පානවා. මේ රටේ විශ්ව විද්‍යාල තැනූ අවස්ථාවේ ගත් ප්‍රතිපත්තිය මූලික වශයෙන් වෙනස් කර තිබෙනවා. මෙතෙක් සිදු නොකරන ලද ආකාරයට ඒ මූලික ප්‍රතිපත්තිය වෙනස් කර තිබෙනවා. නේවාසික ශිෂ්‍යයන් හැටියට විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය ලැබීමේ ක්‍රමය නැති කර පිටස්තර තැන්වල නතර වී සිට බාහිර ශිෂ්‍යයන් වශයෙන් පෙනී සිටීමට පුළුවන් ළමයින්ට ඉඩ දීමෙනුයි ඒ වෙනස කර තිබෙන්නේ. එවැනි වැඩ පිළිවෙළක් ඇති කළත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බාහිර ශිෂ්‍ය ශිෂ්‍යාවන් හැටියට ඉගෙනීමට ඉඩ දෙනත්, යම් යම් මූලික පහසුකම් සලස්සන්නට ඕනෑ. සෑහෙන වැදගත් ස්ථානවල නතර වීමට පහසුකම් ඇද්දැයි සොයා බලන්නට ඕනෑ. ශිෂ්‍ය නිවාස—හොස්ටල්—ක්‍රමයක් ඇති කරන්නට බැරි නම් වෙනත් මාර්ගයන්වත් ඇති කෙරෙන්නට ඕනෑ.

එසේ නොකළොත් දෙනු ලබන අධ්‍යාපනයෙන් නියම ප්‍රයෝජන ලැබෙන්නේ නැහැ. දඩාවතේ යන්නටයි සිද්ධ වන්නේ. එයින් ඇති වන ප්‍රතිඵල භයානකයි. හොඳ පරිසරයක් නැතිකම නිසා නරක ගතිගුණවලට බහින්නට නොදැනුවත්වම වාගේ සිදු වෙනවා.

ඒ සමගම සඳහන් කළ යුතු තවත් වැදගත් කාරණයක් තිබෙනවා. ශිෂ්‍ය සංගම් සම්බන්ධයෙන් තවමත් ක්‍රියා කරන බව පෙනෙන්නේ පරණ අදහස් උඩමයි. ශිෂ්‍ය සංගම්වල කටයුතුවලට ඕනෑ නැති අවහිරකම් ඇති කිරීමට බලාපොරොත්තු වෙනවා. දැන් විද්‍යෝදය විශ්ව විද්‍යාලයෙත්, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙත් එවැනි අවහිරකම් තිබෙනවා. ශිෂ්‍යයන් දේශපාලනය ගැන කථා කළාම එය වරදක් ලෙස සලකන්න සූදානම් වෙනවා. දේශපාලනඥයෙකු ශිෂ්‍ය සංගමය ඇමතුවොත් එයත් වරදක් ලෙස සලකන්නට යතොත් එය සතුටුදායක තත්ත්වයක් නොවෙයි. ශිෂ්‍යයන් දේශපාලනය හදාරන්නට ඕනෑ. දේශපාලනය අද ඉගෙනීමේ වැදගත් අංශයක්. ඇත්තෙන්ම පක්ෂභේද ගැනත්, පක්ෂවල තිබෙන මත ගැනත්, එහි වැදගත්කම ගැනත් ශිෂ්‍යයින් තුළ සෑහෙන වැටහීමක් තිබෙන්නට ඕනෑ. එංගලන්තයේ විශ්ව විද්‍යාලවල දේශපාලන විද්‍යාව උගන්වන්නේ නැද්ද? කොන්සර්වේටිව් පක්ෂයේ දේශපාලන ප්‍රතිපත්ති මොනවාද, ඒවායින් අදහස් කරන්නේ මොනවාද, කම්කරු පක්ෂයේ දේශපාලන ප්‍රතිපත්ති මොනවාද, එයින් අදහස් කරන්නේ මොනවාද, සමාජවාදී දේශපාලන පක්ෂවල අදහස් මොනවාද, මාක්ස්වාදි දේශපාලනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? යනාදි වශයෙන් අප ඉගෙන ගත් කාලයේදීත් අපට ඉගෙන ගැනීමට පුළුවන් වුණා. කාල් මාක්ස්ගේ මතය අපත් ඉගෙන ගත්තා. ඒ නිසා පරණ අදහස් අත්හැර දමා ඒ විධියට කල්පනා කරන්නට ඕනෑ. ශිෂ්‍යයින්ගේ ඉගෙනීම ඒ විධියට සීමා කරන්නට බැහැ. අවුරුදු දහ අට පැන්නායින් පසු ශිෂ්‍යයින් උනන්දුවක් දක්වන විෂයයන් සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීමට ඉඩ දෙන්නට ඕනෑ. ඒවා වහන්නට බැහැ. වහන්නට හොඳම නැහැ. නොයෙක් නොයෙක් දේවල් සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් විධියේ මතභේද ඉදිරිපත් වීමෙන් පසු තමයි දියුණුවක් ඇති වන්නේ. නානාවිධ මත හැප්පීමෙන් තමයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දියුණුවක් ඇති වන්නේ. ඒ නිසා විශ්ව විද්‍යාලවල ඕනෑ නැති සීමාවල් ඇති කර අනවශ්‍ය වැටවල් බඳින්න යන්න එපා. මෑතදී දැනගන්නට ලැබුණු තවත් වැදගත් කරුණක් කියන්නට තිබෙනවා. එය, මා හිතන හැටියට ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලය කරන වරදක්. පැරණි අදහස් උඩ වැඩ කරගෙන යන්නට ඒ උදවිය උත්සාහ කරනවා. එය පේරාදෙණියේ විශ්ව විද්‍යාලයේත් තිබෙන අදහසක්. එනම් එම්. ඒ, පී. එච්. ඩී වැනි උසස් උපාධියක් නැති ගුරුවරයකුට උසස් තත්ත්වයක් ලබා ගන්නට ඉඩක් නොලැබීමයි. එය වරදක්. අවංකව කියනවා නම්, යම් ගුරුවරයකුගේ දක්ෂතාව මැනිය යුත්තේ ඔය උපාධිය අනුව නොවෙයි. මගේ අත්දැකීම් අනුව මට ඒ බව කියන්නට පුළුවනි. මට උගැන්වූ ප්‍රොපෙසර් ලැස්කිට තිබුණේ ඉතිහාසය පිළිබඳ පළමුවැනි පෙළේ බී. ඒ. උපාධියක් පමණයි. එහෙත් එතුමා අපට ඉගැන්නුවේ දේශපාලනය.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
හරියට උගන්නලා නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
සමහරවිට ශිෂ්‍යයන්ගේ අඩුපාඩුකම් නිසා එහෙම වන්නට පුළුවන් බව මා පිළිගන්නවා. එහෙත් ඒ ගැන ගුරුවරයාට දෝෂාරෝපණය කරන්නට එපා. මා නරක වන්නට පුළුවනි. එහෙත් අද ලෝකයේ දේශපාලන භූමියෙහි ප්‍රමුඛස්ථානයක් ලබා ගෙන වැඩ කරන අයගෙන් වැඩි දෙනකු ලැස්කිගෙන් ඉගෙන ගත් අය බව මා ආඩම්බරයෙන් කියනවා.

යම් ගුරුවරයකුගේ දක්ෂතාව මනින්නට තිබෙන්නේ, ඔහු උගත් විෂයය උඩ ඔහු විසින් කරන ලද අලුත් නිර්මාණ, ඉදිරිපත් කරන ලද අලුත් අදහස්, අලුතෙන් ලියන ලද පොතපත යනාදිය අනුවයි. මාත් සෑහෙන උපාධි කීපයක් තිබෙන කෙනෙක්. ඒ වුණත් කෙනකුගේ දක්ෂකම උපාධියෙන්ම පමණක් මැනීම හරියයි මා කියන්නේ නැහැ. උපාධියකුත් ලැබූ නැනැත්තකු විසින් අවුරුදු ගණනක් තිස්සේ කරන ලද වැඩ දෙස බැලීමෙන්, වඩා හොඳට ඔහුගේ දක්ෂතාව මනින්නට පුළුවනි. පැරණි වැරදි අධ්‍යාපන ක්‍රමයක් උඩ පේරාදෙනි විශ්ව විද්‍යාලයය ගමන් කළ බව අප දන්නවා. එය දැන් වෙනස් කරන්නට ඕනෑ. සෑහෙන දක්ෂකම් ඇති ගුරුවරුන් සිටිනවා නම් ඔවුනට එම්.ඒ., පී.එච්.ඩී. උපාධි නැතත් නිසි තැනක් ලබා දෙන්නට ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එහෙත්, මූලික උපාධියක් තිබෙන්නට ඕනෑ.

**ගරු ඩී. පී. ආර්. ගුණවර්ධන (කර්මාන්ත හා ධීවර ඇමති)**
*(கௌரவ டி. பி. ஆர். குணவர்தன—கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*
(The Hon. D. P. R. Gunawardena—Minister of Industries and Fisheries)
ගුරුවරයාට වඩා ශිෂ්‍යයා දක්ෂ නම්?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
එතකොට ශිෂ්‍යයාගේ දක්ෂකම පිළිගන්නට ඕනෑ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)
ගරු කර්මාන්ත ඇමතිතුමා ගුරුවරයාද? ශිෂ්‍යයාද?

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
මා දන්නේ නැහැ. මා කියන්නේ වැරදි අදහස්, මත ආදිය වෙනස් කළ යුතු බවයි. කොළඹ පමණක් නොව තවත් කීප පොළක විශ්ව විද්‍යාලය තුන හතරක් ඇති කරතත් අප ඊට ආධාර උපකාර කරන්නට ලැස්තියි. මෙවැනි අවස්ථාවකදී මුහුණ පාන්නට සිදුවන ලොකු අමාරුවක් තිබෙනවා. මා ඒ ගැන කාටවත් දොස් කියන්නේ නැහැ. මා හිතන හැටියට ඒ ගැන අප සියලු දෙනාම වග කිව යුතුයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

ඉදිරි කාලයේදී මේ රටේ උසස් අධ්‍යාපනය ලබන පිරිස මෙතරම් ප්‍රමාණයකට වැඩි වේයයි කල්පනා කොට ඊට සෑහෙන ගුරු මණ්ඩල සකස් කිරීමට අප කටයුතු කරලා නැහැ. අධ්‍යාපනය සම්බන්ධයෙන් මුල සිටම වැඩ කළ කවුරුනුත් මීට වැරදි කාරයින් වෙනවා. අපට වුවමනා දක්ෂ ගුරුවරුන් සපයා ගැනීම අද අමාරුවක් වී තිබෙන්නේ ඒ නිසයි. මේ සියලු කරුණු සලකා බලා පුළුවන් තරම් ඉක්මණින් එම අඩුපාඩුකම් සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා ඉතා ඕනෑකමින් ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තවත් පරිපූරක ඇස්තමේන්තු දෙකක් තිබෙනවා. එම නිසා මේ විවාදය——

අ. භා. 6.12.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**

*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*

(Mr. Lakshman Jayakody)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මොන හේතුවක් නිසා මේ විවාදය සීමා කරන්නට ගරු ඇමතිතුමා අදහස් කරනවාදැයි ඇත්ත වශයෙන්ම මට තේරෙන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

තව දෙකක් තියෙනවානේ.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

මේ සාකච්ඡාව ඉවර වුණහම ඒ අනෙක් යෝජනා ගැනත් කථා කරමු. මේ ගැන කථා කරන්නට වැඩි යමක් නැතැයි කියා එතුමා මේ විවාදය සීමාකරන්නට බොහොම මහන්සි ගන්නවා.

**ගරු ඊරියගොල්ල**

*(கௌரவ ஈரியகொல்ல)*

(The Hon. Iriyagolle)

ඔය මන්ත්‍රීතුමා නම් කොයි එකටත් කථා කරන්නට වටිනවා.

**ජයකොඩි මයා.**

*(திரு. ஜயக்கொடி)*

(Mr. Jayakody)

උසස් අධ්‍යාපන පනත විවාද කරන්නට අපට දවස් දෙකක පමණ කාලයක් ලැබුණා. ඊට පෙර විද්‍යාලංකාර, විද්‍යෝදය පිරිවෙන් දෙක විශ්ව විද්‍යාල බවට පරිවර්තනය කිරීමේදී ඒ පිළිබඳව මෙම ගරු සභාවෙහි පමණක් නොව ඒ ඒ පීඨයන් තුළ පවා සාකච්ඡා ඇති වුණා. වෙනමම විශ්ව විද්‍යාලයයක් ඇති කරන්නට ගරු ඇමතිතුමා බලය ඉල්ලන මේ අවස්ථාවේදී මේ සාකචඡාව සීමා කරන්නට එතුමා උත්සාහ ගන්නේ ඇයි? මෙය සුළු ප්‍රශ්නයක් නොවෙයි. හතරවැනි විශ්ව විද්‍යාලයයක් පිහිටුවන්නට යන මේ අවස්ථාවේදී, තිබෙන විශ්ව විද්‍යාල තුනේ අඩුපාඩුකම් ගැන සාකචඡා කළ යුතුව තිබෙනවා. විශ්ව විද්‍යාලසීය උපාධිධාරීන්, විද්‍යාඥයන්, විශෙෂඥයන් මේ රටේ ආර්ථික දියුණුව සඳහා අවශ්‍ය බව රජය විසින් රට හැමතැනම ප්‍රචාරය කරගෙන යන මේ අවස්ථාවේදී මේ තරම් වැදගත් සාකචඡාවක් සීමා කරන්නට උත්සාහ ගැනීම ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ බුද්ධියට ලොකු මදිකමක්. අද මේ රෙගුලාසි ඉදිරිපත් කළ වෙලාවෙවත් ගරු ඇමතිතුමා මේ ප්‍රශ්නය ගැන අපට කිසිම විස්තරයක් දුන්නෙ නැහැ. අළුතෙන් කොළඹ විශ්ව විද්‍යාලයක් පිහිටුවන්නට සම්පාදනය කරන ලද මේ රෙගුලාසි ඉදිරිපත් කරමින් අපට එතුමා කියා සිටියේ, මහ පාරේ සිටින ගුරුවරුන් පන්තිකාමරවල ඉගැන්වීමට යෙදවීම සඳහා සකස් කරන ලද රෙගුලාසි වගයක් බවයි. ඊට වඩා අබමල් රේණුවක තරම්වත් විස්තරයක් කළේ නැහැ. අධ්‍යාපන ඇමතිතුමා මුලින්ම මේ පදවියට පත්වුණු වෙලාවෙ අපි විශ්වාස කළා, අධ්‍යාපන අංශයට ආණ්ඩු පක්ෂයේ සිටින ඉතාම බුද්ධිමත් පුද්ගලයා පත් කළාය කියා. මේ රටේ ආර්ථික දියුණුවක් ඇති කිරීමේ, මේ රටේ ජන ජීවිතය නඟා සිටුවීමේ වගකීම් භාරය රඳා පවතින්නේ අධ්‍යාපනය මතයි. ඒ වගකීම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

භාරය අතේ ඇති අධ්‍යාපන ඇමතිවරයා මේ රෙගුලාසි විවාද වීම මෙතරම් සීමා කරන්ට යෑම ගැන අපි කනගාටු වෙනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ විශ්ව විද්‍යාල පමණක් නොව සම්පූර්ණයෙන්ම මේ රටේ අධ්‍යාපන ක්‍රමය 1956 න් පසුව යම්කිසි සැලැස්මකට ගෙනාවා නම් ඒ සැලැස්ම අනුව වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාත් කටයුතු කරයි කියන විශ්වාසයක් මෙතුමා ඇමති ධුරයට පත් වූ මුල් අවස්ථාවේ අප තුළ තිබුණා. මේ රටේ පාසල්වල අධ්‍යාපන මාධ්‍යය පමණක් නොව මේ රටේ විශ්ව විද්‍යාලවල අධ්‍යාපන මාධ්‍යයත් සිංහල වශයෙන් පිළිගනියි කියන විශ්වාසයක් අප තුළ තිබුණා. එහෙත් අද සිංහල මාධ්‍යයෙන් වැඩ නොකෙරෙනවා පමණක් නොව තමන් සිංහල භාෂාවෙන් අධ්‍යාපනය ලැබූ නිසා රජයේ රැකියාවකට හෝ වෙනත් සේවාවකට හෝ ඉල්ලුම් කිරීමේදී තමන්ට පහර වදීය කියන චකිතයක් සිංහල උගතුන් තුළ තිබෙනවා. ඉංග්‍රීසි නොදත් අයට අනාගතයක් නැහැ කියන විශ්වාසයක් විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් තුළ පවතින නිසා ඒ අය අද ලොකු බියකින් සිටිනවා.

**ටී. බී තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

නියෝජ්‍ය සභාපතිතුමනි , ගණපූරණය නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරනයක් නොමැති වූයෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබුයෙන්—**

சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.

பிறகு, நிறைவெண் இருந்ததனால்—

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)

මා කියාගෙන ආවෙ සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගැනීම ක්‍රමානුකූලව ආපසු ගිය අන්දම ගැනයි. කෙලින්ම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා දීමට අප කල්පනා කළේ ඇයි කියන ප්‍රශ්නය ගනිමු. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යම් ශිෂ්‍යයෙක් තමන්ගේ මව් භාෂාවෙන් කටයුතු කරන වද, තමන්ගේ මව් භාෂාව ගැන වැඩිපුර දැනුමක් ලබනවද, අන්න ඒ ශිෂ්‍යයාට තමයි, තමන්ගේ පරම්පරාගත සිරිත් විරිත් ගැන ලැදියාවක් ඇති වෙන්නෙ. එමෙන්ම ඒ ශිෂ්‍යයන් තුළ තමයි, ජාති මමත්වය කියන එක ඇති වෙන්නෙ. අද ඒ ජාතිමමත්වය නැහැ. පරගැතියන්ගේ තත්ත්වයට වැටී සංකර වූ ප්‍රතිපත්තියක් ඇති ජනතාවක් බිහි වන විට ජාති මමත්වය ක්‍රමානුකූලව නැතිව යනවා.

මේ ආණ්ඩුවේ ඇමතිවරු රට හා ජාතිය දියුණු කරන්නට, සෞභාග්‍යය ළඟා කර ගැනීමට, මේ රටේ සහයත්වය දියුණු කරන්නට, කවුරුත් එකට එකතු වී කටයුතු කරන්නට වුවමනාය යනාදී කථා කියනවා අප අසා තිබෙනවා. නමුත් ඔය කියන කථා වලින් මහජනතාව පිබිදෙන්නෙ නැහැ. පිබිදීමක් ඇති වෙන්නට නම් මගේ රටය, ජාතියය, භාෂාවය යන හැඟීම මහජනතාවගේ සිත් තුල ධාරනය වෙන්නට ඕනෑ. එය ගුවන් විදුලියෙන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ගුවන් විදුලිය මගින් උදේ සිට රෑ වන තෙක් මේක මහජනතාවගේ කණට ඇමුවාට පිබිදීමක් ඇති වෙන්නෙ නැහැ. පිබිදීමක් ඇති වෙන්නට නම් ලේ කකියන්නට ඕනෑ. ජාති මමත්වයක් ඇති වී දියුණු වූ ඕනෑම රටක ජනතාව දෙස බලන්න. ජනතාව පුබුදුවා ගන්නට වුවමනා නම් ලේ කකියවා ගන්නට ඕනෑ. නමුත් උසස් විශ්ව විද්‍යාලවල පවා ඉගෙන ගන්නා ජාතියේ අනාගත මුරදේවතාවන් වන අපේ ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ ජාතික හැඟීම් මොට්ට වී ගියොත් ඒ කාලයේදී කර්මාන්ත හා ධීවර ඇමතිතුමා සඳහන් කළ ඒ තුප්පහි සංස්කෘතිය යළිත් මේ රටේ රජ වෙන්නට පුළුවනි. අධ්‍යාපන ඇමතිතුමාත් කර්මාන්ත හා ධීවර ඇමතිතුමාත් 1956 දී ජාතික හැඟීම්වලින් යුක්තව ජාති මමත්වයකින් කටයුතු කළා. කර්මාන්ත ඇමතිතුමා මොනතරම් උසස් ජාති මමත්වයකින් ක්‍රියා කළාද කියතොත් එතුමා කලිසම පවා අත්හැර රෙද්දට බැස්සා. දිගටම කලිසම පාවිච්චි කළත් එතුමා වෙනස් වෙන්නෙ නැහැ. නමුත් ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

[ජයකොඩි මයා.]

විධියට කලිසමෙන් රෙද්දට බැස්සෙ කුමන හේතුවක් උඩද? ඒ අවස්ථාවේදී එතුමා තුළ ජාති මමත්වයක් ඇති වූ නිසයි. නමුත් අද විශ්ව විද්‍යාලවලින් පිට වන ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ ඒ ජාති මමත්වය මොට්ට කිරීමට ඉංග්‍රීසි භාෂාවේ තිබෙන උසස් තත්ත්වය, අභිමානය නමැති බීජය, ක්‍රමානුකූලව වපුරා ගෙන යනවා. සෑම විද්‍යා පීඨයකම ඒ තත්ත්වය පැන නැඟී ගෙන එනවාය කියා දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ප්‍රකාශ කළා.

එක් අතකින් අපේ ලංකවේ ශිෂ්‍යශිෂ්‍යාවන් විදේශීය රටවලට ගොස් ඒ රටවල විශ්ව විද්‍යාලවලට ඇතුළු වී ඒ රටේ භාෂාව ඉගෙන ගෙන ඒ භාෂාවෙන් ඒ රටේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් නොදෙවැනි අන්දමට උසස් විද්‍යා පාඨමාලා හදාරා සමර්ථ වීම ගැන අපට පුදුමයි. ඒ අනුව කල්පනා කර බලන විට අපේ මව් භාෂාවෙන් උසස් අධ්‍යාපනය හදාරන්නට බැරිය කියා පැවසීම විහිළුවක්. පරගැති වූ අයට අපේ විශ්ව විද්‍යාලවල තත්ත්වයක් දුන් නිසයි අද මෙවැනි තත්ත්වයක් ඇති වී තිබෙන්නෙ. පැට්‍රිස් ලුමුම්බා විශ්ව විද්‍යාලයේ ලංකාවේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණනාවක් උසස් අධ්‍යාපනය ලබනවා. ඒ ශිෂ්‍යශිෂ්‍යාවන් වෛද්‍ය විෂයයන්, ඉංජිනේරු විෂයයන්, උසස් කාර්මික විෂයයන් සහ "Humanities, Calculus, Cosmics, Dynamics" ආදී සෑම විෂයයක්ම හදුරන්නෙ රුසියානු භාෂා වෙනුයි. මීට පෙර අසාවත් නැති භාෂාවක්, ඉංග්‍රීසි භාෂාව වගේ නොව අකුරු පවා හුඟාක් වෙනස් භාෂාවක්—රුසියන් භාෂාව—අවුරුද්දකින් පුහුණු කරනවා. ඊළඟ අවුරුද්දේ සිට ඒ ඒ විෂයයන් පිළිබඳ උසස් දැනීමක් රුසියන් භාෂාවෙන්ම ලබා දෙනවා. අවුරුදු තුන හතරක් යන විට රුසියන් ළමයින්ටත් වඩා දක්ෂ අන්දමින් අපේ ලාංකික ළමයින් රුසියන් භාෂා මාධ්‍යයෙන් ඒ විෂයයන් පිළිබඳ උසස් දැනීමක් ලබා ගන්නා බව දැනට මත් ඔප්පු වී අවසානයි. ඒ නිසා, සිංහල භාෂාවෙන් මේ විෂයයන් පිළිබඳ උසස් දැනීමක් ලබා දෙන්නට බැරිය කියනවා නම්; ඒ කථිකාචාර්යවරු, මහාචාර්යවරු එසේ බැරිය කියන්නේ බැරිකම නිසා නොවන බව පැහැදිළියි. ඔවුන් එසේ සිංහල භාෂා මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනයක් ලබා දෙන්නට බැරිය කියන්නේ වෙනත් යම් අදහසකින් නිසා, ඔවුන්ගේ ඒ ක්‍රියා මාර්ගය ජාතිමමත්වය මොට කිරීමේ වැඩ පිළිවෙළක් හැටියට සල කන්නට පුළුවන්.

මේ විෂයයන් පිළිබඳ උසස් දැනීමක් සිංහල භාෂා මාධ්‍යයෙන් දෙන්නට බැරිය කියන්නේ ඇයිද කියා අපට නොයෙක් විට හිතෙනවා. රසායන විද්‍යාවේ තිබෙන නොයෙක් විද්‍යාත්මක වචන සිංහලට පරිවර්තනය කරන්නේ කොහොමද කියා අපෙන් අහනවා. භෞතික විද්‍යාවේ තිබෙන නොයෙකුත් නම් සිංහලට පරිවර්තනය කරන්නේ කොහොමද කියන ප්‍රශ්නය මතු කරනවා. අපි බලමු, අද සිංහල මාධ්‍යයෙන් ඉගෙන ගන්නා අපේ දරුවන් දිහා. සිංහල භාෂා මාධ්‍යයෙන් 4 වන පන්තියේ ඉගැන්වෙන නොයෙකුත් විෂයයන් පිළිබඳ සමහර වචන අපට පවා තේරෙන්නේ නැහැ. එසේ අපට ඒ සමහර වචන නොතේරෙන්නේ, අප ඒ භාෂා මාධ්‍යයෙන් එම විෂයයන් ඉගෙන ගත්තේ නැති නිසයි. නමුත් ඒ කුඩා දරුවන්ට ඉබේම වාගේ ඒ වචන පුරුදු වී, හුරු වී තිබෙනවා. ඒ විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් ලබන, අද විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තිවල ඉගෙන ගන්නා ළමයින්ට ගැඹුරු තේරුම් ඇති වචන පිළිබඳව පවා හොඳ අවබෝධයක් තිබෙනවා. නමුත් අපට එවැනි දැනුමක් නැහැ. තමන්ට නොතේරෙන ඒ මිම්මෙන් මැණ බලා තමයි, අද සමහර කථිකාචාර්ය වරුනුත් අදහස් පළ කරන්නේ. උසස් අධ්‍යාපනයක් ලත් ඇතැම් දක්ෂ පුද්ගල යන් පිරිසක් මේ රටින් පිට වී යාම පිළිබඳව හබරාදුවේ ගරු මන්ත්‍රීතුමාත් (ප්‍රින්ස් ගුණසේකර මයා.) අදහස් වග යක් ප්‍රකාශ කළා. රට හැර ගිය ඒ පුද්ගල යන්ගේ දක්ෂතාවය මාත් පිළිගන්නවා. සමහර උගත් පුද්ගලයන් මේ රට හැර ගියේ ඇයි? ලංකාවේ දේශපාලන ස්වරූපය වෙනස් වේගන ඒම නිසා ඇතිවූ බිය හේතුකොට ගෙන ඔවුන් මෙරටින් පිට වී ගියා. අනෙක් කාරණය, ලංකාවේ වාතාවරණය හොඳ නැත කියන අදහස නිසා ඇති වූ බියයි. තුන් වන කාරණය, තමන්ගේ සමාජ තත්ත්වයට පහරක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැදීමයි. ඉංග්‍රීසි උගත් පන්තියට මින් මත්තට තැනක් නැත කියන හැඟීම උඩ තමන්ගේ රක්ෂාව ආරක්ෂා කර ගැනීමට ඔවුන් රට හැර ගියා. එසේ රට හැර ගිය අයගෙන් සමහර උදවිය දැන් ආපසු ලංකාවට එන්නට ඕනෑය කියනවා.

සිංහල භාෂා මාධ්‍යයෙන් මේ විෂයයන් පිළිබඳ උසස් අධ්‍යාපනයක් දෙන්නට බැරි කමක් නැති බව අපට හොඳින්ම පැහැදිළිව පෙනෙනවා. රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සත්ව විද්‍යාව ආදි ඕනෑම විශේෂ විද්‍යාවක් පිළිබඳ පොත් පත් සිංහල භාෂාවට පරිවර්තනය කරන්නට පුළුවන්. අධ්‍යාපන ඇමතිතුමා දක්ෂ පරිවර්තකයෙක්. එතුමා "ලේ මිසරාබ්ලේ" නමැති පොත "මනුතාපය" යනුවෙන් ඉතාමත් ලස්සණට සිංහලට පරිවර්තනය කර තිබෙනවා. වෙනස් භාෂාවකින් වූ ග්‍රන්ථයක් ඉතා හොඳින් සිංහලට පරිවර්තනය කරන්නට තරම් හැකියාවක් තිබෙන දක්ෂයෙක් නිසා තමයි, අධ්‍යාපන ඇමතිතුමා බුද්ධිමතෙක් යැයි මා කිවේ. සිංහලට පොත් පරිවර්තනය කිරීමේ දක්ෂයෙක් හැටියට අපි අධ්‍යාපන ඇමතිතුමා පිළිගන්නවා. එවැනි කැක්කුමක්, ලැදියාවක් අනෙක් අයටත් තිබෙනවා නම් ඕනෑම පොතක් සිංහලට පරිවර්තනය කිරීමට බැරි කමක් නැහැ.

අ. භා. 6.30

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

**අනතුරුව කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.**

*அதன் பிறகு, குழுக்களின் உப அக்கிராசனர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே உப சபாநாயகர் தலைமை தாங்கினார்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* MR. DEPUTY SPEAKER *took the Chair.*

උසස් අධ්‍යාපන ආඥාව

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප ඉංගිරිසියට විරුද්ධ බවට සමහර උදවිය තුළ හැඟීමක් තිබෙනවා. ඉංගිරිසිය ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. උසස් අධ්‍යාපන මාධ්‍යය ඉංගිරිසි කර ගැනීම ගැනයි, අප විරුද්ධ වන්නේ. ඉංගිරිසියට තබා කිසිම භාෂාවකට අප විරුද්ධ නැහැ. ලෝක භාෂා ඥානය ඇති කර ගන්නට පුළුවන් නම් එය රටටත් පුද්ගලයන්ටත් බොහොම ප්‍රයෝජනවත් වෙනවා. දැනට ඇති ජාත්‍යන්තර සම්බන්ධතාව ගැන සළකන විට ලෝක භාෂා ඥානයක් නැතිවම බැහැ. එසේ වුවද රටක අධ්‍යාපන මාධ්‍යය ඒ රටේ මාතෘ භාෂාව විය යුතුයි. අධ්‍යාපන මාධ්‍යය මාතෘ භාෂාව නොව වෙනත් භාෂාවක් විය යුතු යයි යමකු කියනවා නම් එය පිළිගන්නට අපට පුළුවන්කමක් නැහැ. ගරු අධ්‍යාපන ඇමතිතුමාත් එවැනි අයගේ කීම් භාර ගැනීම වැරදියි. මේ රටේ දරුවන්ට ඉංගිරිසි ඉගැන්වීම සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා නම් අප එහි වරදක් කියන්නේ නැහැ. එහෙත් අධ්‍යාපන මාධ්‍යය මාතෘ භාෂාව විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අලුතෙන් ඇති කරන විශ්ව විද්‍යාලයෙහි සීමිත පීඨ ගණනක් පමණක් ඇති කරන්නට යන බව පේනවා. විශ්ව විද්‍යාලයක් නම් එහි නොයෙකුත් විෂයයන්, නොයෙකුත් විද්‍යාවන්, ඉගැන්විය යුතුයි. මේ අලුතෙන් පිහිටුවන විශ්ව විද්‍යාලයෙහි ඉංජිනේරු පීඨයක් ඇති කිරීම ගැන කිසිම සඳහනක් නැහැ. කොළඹ විශ්ව විද්‍යාලයෙහි ඉංජිනේරු පීඨයක් ඇති කරනවාදැයි අප දැනගන්නට කැමතියි. ගණිත විද්‍යාව, රසායන විද්‍යාව, සත්ව විද්‍යාව වැනි විෂයයන් ඉංජිනේරු අංශයකට වුවමනා නැහැ. ඒ සඳහා වෙනමම විෂයයන් තිබෙන්නට ඕනෑ.. Pure Mathematics, Applied Mathematics වැනි ඒ අවශ්‍ය විෂයයන් ගැන මෙහි සඳහන් වන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

කෝ ? ගැසට් නිවේදනයේ තිබෙන්නේ මෙහෙමයි :

"(1) විශ්ව විද්‍යාලය තත්ත්වයේ උසස් අධ්‍යාපන ආයතනයක් 1967 ඔක්තෝබර් මස පළමුවැනි දින සිට පිහිටුවිය යුතු යයිද, පහත දැක්වෙන අධ්‍යයන අංශවල එනම්—

(අ) වෛද්‍ය විද්‍යාව
(ආ) විද්‍යාව
(ඇ) කලා
(ඈ) සමාජ විද්‍යාව
(ඉ) නීති, හා
(ඊ) වාස්තු විද්‍යාව

යන්නෙහි උසස් අධ්‍යාපනය සැපයීමේ, දියුණු කිරීමේ හා සංවර්ධනය කිරීමේ කාර්‍ය සඳහා එය නීතිගත සංස්ථාවක් විය යුතු යයි ද,—"

ඉතින් කෝ ? ඉංජිනේරු විද්‍යාව ගැන සඳහන් වී නැහැ. Faculty of Agriculture, Faculty of Engineering යන මේ පීඨ දෙක ගැන සඳහන් වන්නේ නැහැ. ලංකාවේ කෘෂිකර්ම දියුණුව සඳහා විශේෂයෙන්ම කෘෂිකර්ම විද්‍යා පීඨයක් තිබීම අවශ්‍යයි. ඒ වගේම ඉංජිනේරු විද්‍යා පීඨයකුත් තිබෙන්නට ඕනෑ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

"විද්‍යාව" කියන එකෙන් ඔය ඔක්කොම ගැනෙනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

නෑ, නෑ, පේරාදෙණියේ තිබෙන්නේ වෙනත් තත්ත්වයක්. එහි වෙනම ඉංජිනේරු පීඨයක් තිබෙනවා; ඒ වගේම වෙනම කෘෂිකර්ම පීඨයක් තිබෙනවා.

There is a Faculty of Agriculture, and there are different other Faculties there. Here, you are not going to start them; you have only a limited few—Medicine, Science, Arts, Zoology and Law.

උසස් අධ්‍යාපන ආඥාව

මේක ලොකු අඩුපාඩුවක්. ගරු ඇමතිතුමා වුවමනාවෙන්ම මේක කළාදැයි මා දන්නේ නැහැ. කෘෂිකර්මය ගැන මේ රටේ විශාල ආන්දෝලනයක් පවතින කාලයේදී, ඉංජිනේරුවන් වුවමනා යයි විශාල ආන්දෝලනයක් පවතින කාලයේදී, විශේෂයෙන්ම කෘෂිකර්ම විද්‍යාව සහ ඉංජිනේරු විද්‍යාව ඉගැන්වීම සඳහා වෙනම පීඨ දෙකක් කොළඹ සරසවියෙහි ඇති කළ යුතු නේද ?

මේකත් එක්තරා යටි වැඩ පිළිවෙළක්ද ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඉංජිනේරුවන් පුහුණු කරන්න තනි කරම එකක් දී තිබෙනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

එහෙනම් අර කණිෂ්ඨ විශ්ව විද්‍යාලවලත් පුහුණු කරන්ට යනවා. සාමාන්‍ය ඩිප්ලෝමා පාඨ මාලා වාගේ පුහුණු කරන්ට යනවා. ඒ විශ්ව විද්‍යාලය තියෙන්නේ කොහේද ? කොළඹ ඉංජිනේරු විද්‍යා පීඨයක් ඇති කරන්ට ඕනෑය කියා ගැසට් කර නැහැ. කෘෂිකර්මයට අදාල විද්‍යා පීඨයකුත් කොළඹ ඇති කිරීමට මෙම නියෝගවලින් අදහස් කර නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

එය තහනම් කර නැතෙයි කියමුකො. [බාධා කිරීම්]

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

අඩුපාඩුවක් තිබෙනවාය කී විට එහෙම එකක් නැතෙයි කියන්නේ ඇයි ? මෙවැනි අඩුපාඩුකම් පෙන්වන්ට අපට යුතුකමක් තිබෙනවා. කෘෂිකර්මය පිළිබඳ විශෙෂඥ පුහුණුවක් ලබා ගැනීමට ලංකාවේ පුළුවන්කමක් නැති නිසා පිටරට ගොස් ඒ පිළිබඳ විශෙෂඥ පුහුණුවක් ලබාගත් අයගේ සංඛ්‍යාව කොපමණද ? පිටරට ගොස් උපාධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලබා පැමිණි අය අතුරෙන් සියයට දශම 7 කට වඩා නැහැ, කෘෂිකර්ම විද්‍යාව සම්බන්ධ උපාධි ලබා පමිණි අය. ඉංජිනේරු විද්‍යාව උගත් අය ඊට වඩා ටිකක් වැඩියි. ඉංජිනේරු විද්‍යාව සමත් උපාධිධරයන් සියයට 5යි දශම ගණනකට වඩා නැහැ. කලා අංශයෙන් සියයට 60ක් පමණ සිටිනවා. අර විශෙෂ අංශ දෙක තමුන්නාන්සේලා අයින් කර දමා තිබෙනවා.

සාමාන්‍යයෙන් විශ්ව විද්‍යාල පර්යේෂණ අංශය ගැන අපට සන්තෝෂ වෙන්ට බැහැ. ඒ ගැන මා එක් අතකින් රජයට චෝදනා කරනවා. අළුත් නිර්මාන සකස් කිරීමට, අළුත් අදහස් ඉදිරිපත් කිරීමට, අළුත් තර්ක ගෙනහැර පෑමට අද විශ්ව විද්‍යාලවල ලොකු බියක් තිබෙනවා. සාමාන්‍යයෙන් විශ්ව විද්‍යාලයකට තිබිය යුතු නිදහස දැන් වැළලී තිබෙනවාය කියන හැඟීම ඔවුන් අතර මුල් බැසගෙන තිබෙනවා. දේශපාලන විද්‍යාව ඉගැන්වීම ගැන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) එක් අදහසක් ඉදිරිපත් කළා. විශ්ව විද්‍යාලවල ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගේ මොළවලට නොයෙකුත් අළුත් අදහස් ඇතුළු කර ලීමට තිබුණු සෑම මාර්ගයක්ම වාගේ කඩාකප්පල් වී තිබෙනවාය කියන හැඟීම දැන් ඇති වී තිබෙනවා. යම් ගුරුවරයකු හෝ යම් ශිෂ්‍යයකු හෝ බැරි වෙලාවත් ධනෙශ්වර ක්‍රමය උඩ මෙන්න මේ කටයුත්ත කළ යුතුය කියන අදහස දුන්නොත් ඒ නැනැත්තාට රජයේ සම්පූර්ණ ආරක්‍ෂාව ලැබෙනවා. එහෙත් සමාජවාදී ක්‍රමයකට අනුව ඒ සැලැස්ම ඇති කළ යුතුය කියා යමෙක් කීවොත් ඔහු පිටුපස නොයන්නේ සී. අයි. ඩී. එක පමණයි. ඒ විධියේ හැඟීමක්, බයක් අද පැතිර පවතිනවා.

රුසියාවේ එක්තරා විශ්ව විද්‍යාලයකට යාමට මටත් අවසථාව ලැබුණා. එම විශ්ව විද්‍යාලයේ සිටි කථිකාචාර්යවරුන් මට ගෙනැවිත් පෙන්නුවා, සමාජවාදය පිළිබඳව එම විශ්ව විද්‍යාලීය පුස්තකාලයේ තිබෙන පොත්පත්. ඒවා රුසියන් භාෂාවෙනුයි, ලියා තිබුණේ. නමුත් තමුන්නාන්සේලා කියන්නේ, රුසියාව වැනි රටක් නිතරම කටයුතු කරන්නේ ඒ රටේ උදවියට වෙනත් බාහිර රටවල් ගැන කිසිම දෙයක් පෙන්වන්නේ නැති අන්දමටය කියන දෙයයි. ඒ නිසා ඒ රටේ ජනතාව ලිඳක දමාගෙන සිටින මැඩියන්ට සමානය කියන හැඟීමක් බොහෝ උදවිය අතර තිබෙනවා. නමුත් ඒ රටේ පුස්තකාලවල විශාල කොටසක පිරී තිබෙනවා, එංගලන්තය අමෙරිකාව යනාදී ධනපති සමාජයන් තිබෙන රටවලින් ඉදිරිපත් කරන පොත් පත්. ඒ රටවලින් ඉදිරිපත් කරන පොත් පත් පමණක් නොවෙයි තිබෙන්නේ. ඒ රටවල අර්ථ ශාස්ත්‍රය පිළිබඳව විශේෂඥ අදහස් ඇතුළත් පොත් පත් පවා ශිෂ්‍යයින්ගේ ඥාණ වර්ධනය සඳහා තබා තිබෙනවා. එහෙත් මේ රටේ එවැනි පොත් පත් තිබෙනවාද? එවැනි පොත් පත් මේ රටට ගෙන්වන්නට ඉඩ දෙනවාද? සමාජවාදී රටවලින් මේ රටට පොත් පත් ගෙන්වීමත් සීමා කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ඒ අර කුණුහරුප පින්තූර ආදිය තිබෙන පොත් පත්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

සමාජවාදී රටවල ඒ පින්තූර නැහැ. ගරු ඇමතිතුමා බලන්නේ එවැනි පොත් පත් ගැනයි. මා කථා කරන්නේ ඒවා ගැන නොවෙයි.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අනික්වා සියල්ලක්ම ගෙන්වනවා.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු ඇමතිතුමා එහෙම කියන නමුත් චීන රාජ්‍යයෙන් හා සෝවියට් දේශයෙන් අපට ලැබී තිබෙන පොත් පත් රාශියක් අද රේගුවේ තිබෙනවා. ඒවා මේ රටට ගෙන්වීම තහනම් කර තිබෙනවා. ඒ රටවලින් කුණුහරුප පොත් පත් එවන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජයකොඩි මයා.]

ඒ රටවල් ඉඩ දේද? එවැන්නකට ඉඩ දුන්නොත් එයින් තමන්ගේ රටට කැළලක් සිදු වෙනවානේ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

කොයි රටෙන් ආවත් තහනම් කර තිබෙන්නේ කුණුහරප පොත් පත්.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

අප කියන්නේ කුණුහරුප පොත් පත් ගැන නොවෙයි. අප කියන්නේ බුද්ධිමත් ජනතාව කියවන උසස් විද්‍යාවන් ඉගෙන ගන්නට පුළුවන් පොත් පත් ගැනයි. කුණුහරුප පොත් පත් කියන්නේ ඒවාද? මෙවැනි බුද්ධිමත් ඇමතිවරයෙක් මේ විධියේ මෝඩ කතා කියන එක හරි පුදුමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කොළඹ විශ්ව විද්‍යාලයේ තිබෙන පුස්තකාලයට යන්න.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

මන්ත්‍රීතුමා ළඟදී ගිහින් නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මා ගියා. මා ඒ පුස්තකාලයට ගියා පමණක් නොවෙයි, එහි පොත් පත් කියවන හැටිත් මා දැක්කා. විශේෂයෙන්ම විශාල සංඛ්‍යාවක් සිටින කලා ශිෂ්‍යයින්ට ඉතාම වැදගත් ආශ්‍රිත පොත් පත්වල තිබෙන්නේ එක පිටපතක් පමණයි. යම් පොතක් ගැන සඳහන් කර එය කියවා එන්නය කියා කථිකාචාර්යවරයා මුළු පංතියටම කියනවා. එක පංතියක 50කටත් වැඩි පිරිසක් සිටිනවා. එම පොත කියවන්නට පුස්තකාලයට ගිය විට එහි තිබෙන්නේ ඒ වර්ගයේ එක පොතයි. අන්න ඒවයි අඩු පාඩු.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අපි ඔවා කරන්නේ පිරිමසාගෙනයි.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ආශ්‍රිත පොත් පත් පිරිමහන්නට යන වාද? බුද්ධිය මොට්ට කරන්නට යනවාය කියා මා කියන්නේ ඒ නිසයි. ඔය පොත් පත් පුළුල් ලෙස ගෙන්වීමට ඉඩ නොදෙන්නේ ඇයි?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සල්ලි නැහැනේ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුස්තකාල ගැන සඳහන් කළා. අද විශේෂ වශයෙන් පාවිච්චි කරන්නේ කොළඹ මහජන පුස්තකාලය පමණයි. කොළඹ විශ්ව විද්‍යාලයට අවශ්‍ය ග්‍රන්ථ ඒ ශිෂ්‍යයින්ට නැහැ. මොකක් හෝ විෂයයක් සම්බන්ධව පොත් පත් වුවමනා කළොත් සමහර ඒවා නැහැ. එමෙන්ම ඉඩකඩත් නැහැ. ඔය විශ්ව විද්‍යාලයේ තිබෙන පුස්තකාලයට මා දිනක් යන විට ළමයින් 200 ක් පමණ පොත් පත් බැලුවේ හිට ගෙනයි.

**තුඩාවේ මයා.**
*(திரு. துடாவ)*
(Mr. Tudawe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගණ පූරණයක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති වූයෙන් බෙදුම් සීනුව ශබ්ද කිරීමට නියෝග කරන ලදී.**

**පසුව ගණපූරණයක් තුබූයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

*Later, a Quorum being present—*

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ශිෂ්‍යාධාර ගැන අහන්නට කැමතියි. මේ සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩුව පැවති කාලයේදී එක්තරා ප්‍රතිපත්ති මාලාවක් ඇති කළා. ශිෂ්‍යාධාර මුදල් ලබා දීමටත්, මහජන බැංකුවෙන් මුදල් ණයට ලබා දීමටත්, "බර්සරීස්" නමින් හඳුන්වනු ලබන ක්‍රමයේ ශිෂ්‍යාධාරයක් දෙන්නටත් පහසුකම් ඇති කිරීමට වැඩ පිළිවෙළ සකස් කර තිබුණා. ඒ අනුව මහජන බැංකුවෙන් රුපියල් එක් දහස් පන් සියයක මුදලක් ණයට ලබා ගන්නට පුළුවන් වුණා. වැඩ පිළිවෙළවල් ගණනාවක් සකස් කර තිබුණා. අහිංසක ගම්බද දුප්පත් දරුවන්ට විපුල ප්‍රයෝජනයක් අත් කර දුන් වැඩ පිළිවෙළ දැන් වෙනස් වේගන යනවා. දැන් ක්‍රම ක්‍රමයෙන් ඒ ආධාර දීම් කැපීගෙන යනවා. පසුගිය කාල සීමාවේදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශාල සංඛ්‍යාවක් විශ්ව විද්‍යාලයට ඇතුළු වූ බව මා පිළිගන්නවා. මේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කිරීමට විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයින්ගෙන් රුකුලක් ලැබෙන බව ගරු ඇමතිතුමා පිළිගන්නවා නම්, ඔය සුළු සංඛ්‍යාවකටවත් ශිෂ්‍යාධාර අඩු කර තිබෙන්නේ ඇයි ?

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ශිෂ්‍යාධාර වැඩි කළා. ගෙවන ගණනත් වැඩි කළා. කරුණු නොදැන කථා කරන්නට හොඳ නැහැ.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

මා කියන දේ තමුන්නාන්සේට නොතේරෙනවා වෙන්නට ඇති. කෙනෙකුට ලැබෙන ප්‍රමාණය අඩු කර තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

The hon. Member is going into all the details which can be discussed at the Budget Debate.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

I am speaking of the Colombo Campus.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

You can refer to all those details in your Budget speech. If there are any shortcomings in the regulations you can refer to them.

**ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(திரு. ஷெல்றன் ஜயசிங்ஹ)*
(Mr. Shelton Jayasinghe)

How many hon. Members have dealt with that point.

**ජයකොඩි මයා.**
*(திரு. ஜயக்கொடி)*
(Mr. Jayakody)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඉදිරිපත් කළේ ශිෂ්‍යාධාර ප්‍රශ්නයයි. අනෙක් විශ්ව විද්‍යාල පිහිටුවීමට ක්‍රියා කරද්දී ඒ ගැන සාකච්ඡා කිරීමට දවස් දෙකක් පමණ කල් දුන්නා. අලුතින් විශ්ව විද්‍යාලයක් පිහිටුවන්නට, අලුත් රෙගුලාසියක් මගින් අලුත්ම කැම්පස් එකක්—පේරාදෙනියට සම්බන්ධකමක් නැති විශ්ව විද්‍යාලයක්—ඇති කර, කොළඹ විශ්ව විද්‍යාලය නමින් වෙනම නමකුත් දී කටයුතු කරන්නටයි යන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
නම පමණයි වෙනස් කර තිබෙන්නේ.

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එපමණක් නොවෙයි, සමහර විද්‍යා අංශ පවා පවත්වන්නට යනවා. මා පෙන්වා දෙන්නට උත්සාහ කරන්නේ මෙයයි : කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර ශිෂ්‍යයින් ඉන්නවා. පේරාදෙනියේ අභ්‍යන්තර ශිෂ්‍යයින් ඉන්නවා. කොළඹ බාහිර ශිෂ්‍යයින් මිස අභ්‍යන්තර ශිෂ්‍යයින් නැහැ. ශිෂ්‍යාධාර ගැන විශේෂයෙන් කියන්නට හේතු වුණේ මේ නිසයි. කොළඹ රේස් පිටියේ ඉගැන්වීම පටන් ගත් විට ආර්ථික තත්ත්වයේ දුර්වලකම් නිසා ශිෂ්‍යයින්ට විඳින්නට සිදු වූ අතවර ගැන තමුන්නාන්සේ දන්නවා. එවැනි අභාග්‍ය සම්පන්න තත්ත්වයන්ට මුහුණ පෑමට ශිෂ්‍යයින් බොහෝ දෙනෙකුට සිදු වුණා. මෙය පුදුමයට කරුණක් නොවෙයි. විශ්ව විද්‍යාලයීය අධ්‍යාපනය වෙනුවෙන් නිරත වී සිටින කාලය තුළ ආර්ථික පීඩනයනට අසු නොවී ජීවත් වන්නට පුළුවන් මාර්ගයක්—වැඩ පිළිවෙළක්—සකස් කර තිබෙනවා නම් එවැන්නක් සිදු වන්නේ නැහැ. අනෙකුත් රටවල බාහිර ශිෂ්‍යයින්ටත්, අභ්‍යන්තර ශිෂ්‍යයින්ටත් සමහර විට ආධාරයක් වශයෙන් පමණක් නොව වේතනයක් හැටියට—පඩියක් ලෙස—පවා යමක් ගෙවනවා. ලංකාවේ සිට සෝවියට් දේශයට ගොස් ඉගෙනීම ලබන ළමයින්ට රුපියල් 450 කට සමාන මුදලක්—රූබල් 90 ක් පමණ—මාසයකට ලැබෙන ආකාරයට ගෙවනවා.

**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ශිෂ්‍යත්ව ?

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
ඔව්.



**ගරු ඊරියගොල්ල**
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මෙහෙ රුපියල් සියයක් ගෙවනවා.

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
එහෙ ගෙවන ප්‍රමාණයයි මා කිව්වෙ. පඩි ලබන උපාධි අපේක්ෂකයින් පවා ඉන්නවා සමහර රටවල.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
තමුන්නාන්සේ බලන්නට ගියාද ?

**ජයකොඩි මයා.**
(திரு. ஜயக்கொடி)
(Mr. Jayakody)
ඔය කියන කාරණය දැන ගන්නට ඒ තැන්වලට යන්නටම වුවමනාද ? උදාහරණයක් වශයෙන්, ටෝකියෝ නගරය ජපානයේ අගනුවර බව දැන ගන්නට ඒ රටට යන්නටම වුවමනාද ? එක් රටක ශිෂ්‍යාධාර වශයෙන් එක් ශිෂ්‍යයකුට රු. 450 ක මුදලක් දෙන බව මා කිව්වහම මේ රටෙන් එක් ශිෂ්‍යයකුට රු. 100 ක් ශිෂ්‍යාධාර වශයෙන් දෙන බව කියා ගරු ඇමතිතුමා වැදගත් කරුණක් ඉදිරිපත් කළා. මොන රටක වුවත් මේ විධියට ශිෂ්‍යාධාර දෙන්නේ ඇයි ? ශිෂ්‍යයින්ගේ ආර්ථික පීඩනයෙන් ඔවුන් මුදවා ගැනීම සඳහායි. ශිෂ්‍යයාගේ සිතත් ඥානයත්, ගෙවල තිබෙන නොයෙක් කරදර හිරිහැරවලිනුත් වෙනත් බාහිර කරදරවලිනුත් සම්පූර්ණයෙන්ම ඈත් කොට ඔහු අධ්‍යාපනය කෙරෙහිම යොමු කරවීමටයි මෙවැනි ආධාර මුදල් දෙන්නේ. වෙනත් රටවල දක්ෂ වෛද්‍යවරුන්, දක්ෂ විද්‍යාඥයින්, වෙනත් අංශවල විශෙෂඥයින් වැඩි වැඩියෙන් බිහි වන්නේ ඒ රටවල ශිෂ්‍යයිනට වැඩි වැඩියෙන් ආධාර මුදල් දෙන නිසායි. අපේ රටේ එවැනි වෘත්තීන් සඳහා පුහුණු වීමට උත්සාහ කරන බොහෝදෙනකුට ඒ කටයුතු අතරමඟදී කඩාකප්පල් කර දමා වෙනත් රැකියාවන් හොයා යන්නට සිදු වන්නේ ඔවුන්ගේ ආර්ථික පීඩනය නිසායි. මේ රටේ විශ්ව විද්‍යාලවල උපාධි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥව

ලබා ගැනීමට ඉගෙන ගන්නා ළමයින් ඔවුනට වුවමනා මුදල් හදල් හොයා ගැනීමට නොකරන දෙයක් නැහැ. වේටර් වරුන් වශයෙන් වැඩ කරන ළමයින් පවා සිටින බව මා දන්නවා. රු. 100 ක්වත් දීම එවැනි අයට විශාල ප්‍රයෝජනයක්. එයවත් නැත්නම් තවත් අමාරු වෙනවා. එහෙත්, එවැනි ළමයින් මේ රටේ ජීව නාළිය, ප්‍රාණ නාළිය වශයෙන් සලකනවා නම්, ගරු අධ්‍යාපන ඇමතිතුමා ඔවුන් ගැන දැනට වඩා සැලකිලිමත් වීම එතුමාගේ යුතුකමක් හැටියට සැලකිය යුතුයි.

මේ ප්‍රශ්නය ගැන විස්තර වශයෙන් කථා කරන්නට අපට තවත් අවස්ථාවක් ලැබෙන නිසා මා දැන් මීට වඩා කථා කරන්නට අදහස් කරන්නේ නැහැ. අද විශ්ව විද්‍යාලයවල තත්ත්වය ගැන අප සන්තෝෂ වන්නේ නැහැ. ඒ තත්ත්වය වෙනස් කිරීමට ගරු අධ්‍යාපන ඇමතිතුමා මාන්සි වනවා ඇතැයි මා විශ්වාස කරනවා.

අ. භා. 6.50

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා ද මේ සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරන්නට අදහස් කෙළේ ගරු අධ්‍යාපන ඇමතිතුමා තවත් ධෛර්යමත් කොට එතුමාගෙන් හොඳ වැඩ කරවා ගන්නා චේතනාවෙනුයි. පටන් ගැනීමේදී මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් තිබුණු අවහිරකම් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. අප විශ්ව විද්‍යාලවලට ශිෂ්‍යයින් එක්තරා ගණනක් පමණක් ගැනීමේ සීමාවක් ඇති කොට තිබුණා. එහෙත්, අප ඒ සීමාව අකුරටම ක්‍රියාත්මක නොකෙළේ ප්‍රවේශ විභාගයෙන් සමත්වන ශිෂ්‍යයින් හැකි තාක් වැඩි ගණනක් ගන්නට විශ්ව විද්‍යාලය කටයුතු කළ නිසායි. මේ ප්‍රශ්නය කොතරම් උග්‍ර වුණාදැයි කියතොත්, අන්තිමේදී බාහිර ශිෂ්‍යයන් වශයෙනුත් කොටසක් විශ්ව විද්‍යාලයවලට බඳවාගෙන ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ඉඩකඩ සලසන්නටත් සිදුවුණා. විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාරවල ඉඩකඩ මදි වුණු නිසා ඒ අවස්ථාවේදී විශ්ව විද්‍යාලයය අවට නවාතැන් පොළවල සිට පැමිණීමටත් ශිෂ්‍යයිනට අවසර දෙන්නට සිදුවුණා. ඒ නිසා විශාල වශයෙන් කරදරයට පත් වුණේ විශ්ව විද්‍යාලයය අවට ජීවත් වුණු අයයි. විශ්ව විද්‍යාලයයේ සිට හැතැප්ම 7 ක් ඇතුළත සිටි ශිෂ්‍යයිනට විශ්ව විද්‍යාලයීය නේවාසිකාගාරවලට ඇතුළත් වන්නට බැරි වන අන්දමේ තහනමක් එදා තිබුණා. එම නිසා ඒ අයට විශ්ව විද්‍යාලය වලින් නියම ප්‍රයෝජන ගන්නට බැරි වුණා. විශ්ව විද්‍යාලයය කොළඹ සිට පේරාදෙණියට ගෙනගිය අවස්ථාවේදී විශාල වශයෙන් කෑකෝ ගැසීම් ඇති වුණේ ඒ පළාතට පමණක් විශ්ව විද්‍යාලයයෙන් සේවයක් ඇතිවේය යන්න ගැන බව ඔබතුමාට මතක ඇති. එහෙත් සිදුවුණේ කුමක් ද ? හැතැප්ම 7 සීමාව නිසා ළඟපාත ළමයිනට විශ්ව විද්‍යාලයයේ නේවාසිකාගාරවලට ඇතුළු වී එයින් ප්‍රයෝජන ගන්නට බැරි වුණා. අන්තිමේදී කොළඹත් විශ්ව විද්‍යාලයීය අධ්‍යාපන පන්ති ආරම්භ කරන්නට සිදුවුණා. ඒ අවස්ථාවේදී මේ රටේ ධනපති පත්තර ගම්බද ශිෂ්‍යයිනට විරුද්ධව විශාල ප්‍රචාරයක් ගෙනගිය බව මට මතකයි.

විශ්ව විද්‍යාල ගැන මෙනෙහි කරන විට ඒවා ජාතික ප්‍රයෝජනයට අදාළ නොවන දේවල්ය කියා විදේශිකයන් කොයිතරම් දුරට ඒවාට හරස් කැපුවාදැයි තමුන්නාන්සේට මතක ඇති. මේ රට කලා අතින් වාලුකා කාන්තාරයක් යයි අයිවර් ජෙනිංස් මහත්මයාත් කිව්ව බව තමුන්නාන්සේට මතක ඇති. අර්ථ ශාස්ත්‍රය පිළිබඳ උච්ඡස්ථානයක් එකල මෙහි තිබුණේ නැහැ. එවැනි අමාරුකම් මැඩපවත්වාගෙන ඉදිරියට ගොස් තිබීම ගැන අප සන්තෝෂ වෙනව. විශ්ව විද්‍යාලයේ නොයෙක් අංශ වලින් නිර්මාණ ශක්තිය ඇති උදවිය පහළ වන බව දැන් අපට ආඩම්බරයෙන් කියන්ට පුළුවනි. විශේෂයෙන්ම නාට්‍ය කලාව හා චිත්‍ර ආදිය සම්බන්ධයෙන් මේ රටේ පමණක් නොව ජාත්‍යන්තර කීර්තියට පත් පුද්ගලයින් අපේ විශ්ව විද්‍යාල වලින් බිහිව සිටීම අපේ ගෞරවයට කාරණයක්. ඒ වගේම හුඟක් දුරට ලේඛකයින් බිහිව තිබෙනව. විශේෂයෙන් ගම්බද පරිසරයට අනුව හැදුණු සිංහලය මව් භාෂාව කර ගත්, ඒ වගේම ද්‍රවිඩ භාෂාව මව් භාෂාව කර ගත් උදවියට තම නිර්මාණ ශක්තිය යොදා ජාතියට ප්‍රයෝජනවත් කටයුතු කිරීමට මේ විශ්ව විද්‍යාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඉලංගරත්න මයා.]

ඔස්සේ අවස්ථාව ලබා දීම අපගේ යුතුකමක්. ඒ යුතුකම හුඟක් දුරට සිදු වී ගෙන යාම ගැන අපි සන්තෝෂ වෙනව.

ගරු සභාපතිතුමනි, කොළඹ අස්නාලයේ පටන් ගත් විශ්ව විද්‍යාලය ගැන මුල් කාලයේ විශාල රාවයක් තිබුණා. එහි ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හැසිරීම් ආදිය ගැන නොයෙක් විධියේ ප්‍රචාරයන් තිබුණා. ඒව හුඟක් එල්ල කරන ලද්දේ සාමාන්‍ය ගම් බද ජනතාවගේ දූ පුතුන් මේ විධියේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලැබීමට විරුද්ධව කරන ලද ප්‍රචාරයන් හැටියටයි. ඒ තත්ත්වය නැති කිරීමට කොළඹත් විශ්ව විද්‍යාලයක් ආරම්භ කරන්ට යාම කාගේත් සන්තෝෂයට කාරණයක්. දැනට ශිෂ්‍ය ශිෂ්‍යාවන් 5,213 ක් සිටින බව ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා. මේ විධියේ ආයතනයක් පටන් නොගත්තොත් මේ අයගේ අධ්‍යාපනය අනාථ වන බවට කිසිම සැකයක් නැහැ. කෙසේ වෙතත් එකකට ලොකු නමකුත් අනිකට ටිකක් පුංචි නමකුත් යෙදීමෙන් එක්තරා අන්දමක බමුණු කුලයක් ඇති වන්න ඉඩ තිබෙනව. පේරාදෙනියේ විශ්ව විද්‍යාලය "ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය" වශයෙනුත් අනික "කොළඹ විශ්ව විද්‍යාලය" වශයෙනුත් නම් කිරීමෙන් එවැනි තත්ත්වයක් ඇති වන්න ඉඩ තිබෙන නිසා මේ ගැන ටිකක් පළල් ලෙස කල්පනා කර මේ දෙකින් එකක් උසස්ය, අනික පහත්ය කියන හැඟීම ඇති නොවන අන්දමට යමක් කරන්න පුළුවන් නම් හොඳයි කියා මා විශ්වාස කරනනව.

පසුගිය රජය විශාල මුදලක් වියදම් කර ගොඩනැගිලි ආදිය තනා විද්‍යාලංකාර හා විද්‍යෝදය විශ්ව විද්‍යාලයන් දියුණු කරන්නට කටයුතු කළ විධියටම දැනටත් කටයුතු කරගෙන යෑම ගැන අපි සන්තෝෂ වෙනව. කෙසේ වෙතත් විද්‍යාලංකාර හා විද්‍යෝදය විශව විද්‍යාලවල බොහොම කාලයක් තිස්සේ කටයුතු කරගෙන ආව, සේවය කරගෙන ආව නිලධාරීන්ට අවහිර වන විධියේ යම් ප්‍රකාශ කෙරී තිබෙන නිසා ඒ අය බොහොම දෙනකු අද භයකිනුයි සිටින්නෙ. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කිව්ව වගේ, හැම එක කටම උපාධියම අවශ්‍ය නැහැ. අප උපාධිධාරීන් නොවන නිසා මන්ද මානයකින් කරන කථාවක් නොවෙයි එය. පළපුරුද්දක් විශාල වශයෙන් සැලකිල්ලට ගතයුතු කාලයක් මේ. විශ්ව විද්‍යාල තත්ත්වයට එන්ට පෙර බොහෝ කාලයක් තිස්සේ විද්‍යාලංකාර හා විද්‍යෝදය පිරිවෙන්වලින් රටට විශාල සේවාවක් සිදු වී තිබෙන නිසාත්, ඒ සේවාවල යෙදී සිටි උදවිය පරිත්‍යාගයෙන් ඒ කටයුතු කරගෙන ගිය නිසාත්, ඒ උදවිය ඒ ස්ථානවලින් වෙනස් නොකර ඒ උදවියට ඒ ස්ථාන දිය යුතු යයි අප කල්පනා කරනව.

ගරු සභාපතිතුමනි, හැම දෙනාටම එක සේ විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබා ගන්නට බැරි බව කවුරුත් දන්නව. ඒ විශ්ව විද්‍යාලවල හුඟක් නිදහස තිබිය යුතුයි. මේ වන තෙක් විශ්ව විද්‍යාලවල කථිකාචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට දේශපාලනයෙහි යෙදීමට අවසර තිබෙනවා. එහෙත් දැන් ඒ නිදහසත් සීමා කරන්නට යනවාය කියා විශාල භයක් තිබෙනවා. ඒ නිදහසත් සීමා කරන්නට ගියොත් විශ්ව විද්‍යාලය කියන නමටත් කැළලක් ඇතිවෙනවාට කිසිම සැකයක් නැහැ. විශ්ව විද්‍යාලය සීමිත අධ්‍යාපනයක් දෙන ස්ථානයක් නොවෙයි. විශ්ව විද්‍යාලය ලෝක තත්ත්වයෙන් පළල් අධ්‍යාපනයක් ලබා දෙන ආයතනයක්. එම නිසා සීමා කිරීම්වලින් ඒ පළල් අධ්‍යාපනය ලබා ගන්නට නොහැකි වෙන්නට පුළුවනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඊළඟට හින්දු විශ්ව විද්‍යාලයක් හා ඉස්ලාම් විශ්ව විද්‍යාලයක් පිහිටුවීම ගැනත් මා මතක් කරන්නට සතුටුයි. ඒ සම්බන්ධව අද විශාල උනන්දුවක් පවතිනවා. ගරු ඇමතිතුමා ඒ කාරණය ගැනත් සිත යොමු කරනවා ඇත කියා මා බලාපොරොත්තු වෙනවා.

අපේ ආණ්ඩුව කාලයේදී දුන් සහනයන් රාශියක් දැන් නැතිවේගෙන යෑම ගැන අපට කණගාටුයි. මට ප්‍රථමයෙන් කථා කළ ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළාක් මෙන් මේ සහනයන් වැඩි වශයෙන්ම නැති වෙන්නට හේතුව උගන්වන මාධ්‍යය වෙනස් වීමයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
නැහැ, මාධ්‍යය වෙනස් වී නැහැ.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ගරු ඇමතිතුමා මාධ්‍යය වෙනස් වී නැත කියා ප්‍රකාශ කිරීම ගැන මා සතුටුයි. නමුත් පාලනයේ සිටින උදවිය ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් උගන්වන්නට යනවාය කියා විශාල ප්‍රචාරයක් ගෙන යනවා. මමත් දැන් ලොකු දරුවන් ඇති පියෙක්. අපේ දරුවනට අද යන එන මගක් නැතිවයි ඉන්නෙ. අවුරුදු නවයක් තිස්සේම අපේ දරු දැරියන් සිංහල මාධ්‍යයෙන් නැත්නම් දෙමළ මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබා ගැනීමටයි හැඩගැසුණේ. නමුත් දැන් මේ හදිසි වෙනස් වීම නිසා උසස් අධ්‍යාපනය තබා සාමාන්‍ය අධ්‍යාපනයවත් ලබා ගන්නට බැරි තත්ත්වයක් තිබෙන්නේ. එම නිසා කලින් මෙන් සිංහල මාධ්‍යයෙන් හා දෙමළ මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය ලබා දෙන්නට තිබෙන වැඩ පිළිවෙළ නොකඩවාම ක්‍රියාත්මක කරන්නය කියා ඔය බලතල දරණ උදවියට නියෝගයක් කරන්න. මහාචාර්ය මලලසේකර මහත්මයා විශේෂයෙන්ම සිංහල භාෂාවත් බුද්ධාගමත් ගැන කීර්තියක් දරණ කෙනෙක්. නමුත් එතුමා කරන ඇතැම් ප්‍රකාශ බොහොම භයානකයි. සිංහල භාෂා මාධ්‍යයෙන් ඉගෙන ගන්නට උත්සාහ කරන අය ම්ලේච්ඡයන්ය යන කථාව ගැනත් හුඟක් දෙනෙක් කථා කරනවා. උසස් තැන්වලින් කරන එවැනි ප්‍රකාශ නිසා සාමාන්‍ය ජනතාවගේ දරුවන් තුළ සාධාරණ බියක් ඇති වීම පුදුමයක් නොවෙයි.

නමුන්නාන්සේගේ අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිතුමා වශයෙන් සිටි කාලයේදී විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එක්තරා සහනයක් සලසාදී තිබුණා. විශ්ව විද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට බැංකුවෙන් ණය මුදලක් අරගෙන, ඒ ණය මුදල අධ්‍යාපනය ලබා ගැනීමේ කටයුතුවලට වියදම් කර, අධ්‍යාපනය ලබා අවසාන වී රක්ෂාවකට ගියාම වැටුපෙන් ඒ ණය මුදල ගෙවා දැමීමට එක්තරා වැඩ පිළිවෙළක් යොදා තිබුණා. දැන් ඒ වැඩ පිළිවෙල අඩපණ කර තිබෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
මා ඒ ගැන කියන්නම්, පිළිතුරු දෙන විට.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ණය මුදලක් ලැබීමට සුදුසු අයටත් දැන් එතැන තිබෙන අවහිරකම් නිසා ණය මුදලක් ලබා ගන්නට නොහැකි වී තිබෙනවා. කර්මාන්ත හා ධීවර ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමාත් හිස වැනීමෙන් මා කියන දේ පිළිගන්නවා. එම නිසා මේ කාරණය සම්බන්ධව ගරු ඇමතිතුමා ටිකක් කල්පනා කර බලන්න. තමන්ගේ කටයුතු අධ්‍යාපන අමාත්‍යාංශයට සීමා නොකර අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දුෂ්කරතාවයන් මොනවාද කියාත් කල්පනා කර බලන්න. අමාරුවෙන් හෝ අනික් ඇමතිවරුන්ගේත් සහයෝගය ලබාගෙන මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ යහපතට වැඩ පිළිවෙළක් සකස් කරන්න.

ඒවාගේම නැති බැරිකම් තිබෙන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් එක්තරා විධියකට සහනයක් සලසා දී තිබුණා. ඒ සහනයත් දැන් සීමා කර තිබෙනවා.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
නැහැ. ඊට වඩා සහන දී තිබෙනවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

එහෙම නම් දැන් මාස හයකට පමණ උඩදී පේරාදෙණියේදී වහ බී දිවි නසා ගත් ශිෂ්‍යයා ගැන මා මතක් කරනවා. ඒ ශිෂ්‍යා දිවි නසා ගත්තේ තමන්ට ලැබෙමින් තිබුණු මුදල නැතිව ගිය නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
නැහැ. පළමුවැනි අවුරුද්දේ අසමර්ථ වූ කණ්ඩායමවෙන්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඇමතිතුමා එහෙම කිව්වත් අප මේ ගැන සොයා බැලුව. ඒ ශිෂ්‍යයා දිවි නසා ගෙන තිබෙන්නේ අසමර්ථ වූ නිසා නොවෙයි; තමන්ට ලැබෙමින් තිබුණු මුදල නැතිව ගිය නිසයි.

තවත් කරුණක් කිව යුතුව තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා කීවා වගේ අද විශ්ව විද්‍යාල ශිෂ්‍යයන්ට සමිති පිහිටු වන්නටවත් නිදහස නැහැ. එවැනි සමිති පිහිටුවන්නට අද ඒ අය බොහොම භයයි. සිය සමිතිවල කථා පැවැත්වීම සඳහා ආණ්ඩු පාක්ෂික නොවන මන්ත්‍රීවරුන්, දේශ පාලන අදහස් දරන අය ගෙන්වා ගැනීමට ඒ අය භයයි.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
මන්ත්‍රීවරු නොගියාට පාඩුවක් වේයැ? මන්ත්‍රීවරු කියන ඒවා මෙහිදී අසා ගන්නට පුළුවන්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
මා හිතන්නේ, එය පාඩුවක්ය කියායි. විශේෂයෙන් දේශපාලන විද්‍යාවත් විශ්ව විද්‍යාලවල ඉගැන්වෙන නිසා, දේශපාලන අදහස් උදහස් දැන ගැනීමට විශ්ව විද්‍යාල සීය ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට සම්පූර්ණ නිදහස තිබෙන්නට ඕනෑ. වෙන එකක් තබා ක්‍රිෂ්ණ මූර්ති ධර්මය වුණත් ප්‍රචාරය කරන්නට, උගන්වන්නට නිදහස තිබෙන්නට ඕනෑ.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
ඒක උගන්වනවා නම් කොච්චර හොඳද; ඉගෙන ගන්නට, තේරුම් ගන්නට පුළුවන් නම්.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
තවත් කරුණක් මතක් කරන්නට කැමතියි. උසස් අධ්‍යාපනය ලැබීම සඳහා රජයේ සේවකයන්ට එක්තරා විධියක සහනයක් සලසා තිබුණා. යම් කණිෂ්ඨ සේවකයෙක් විශ්ව විද්‍යාලයීය අධ්‍යාපන යක් හෝ වෙනත් ආකාරයක උසස් අධ්‍යාපනයක් හෝ ලබා ගැනීමට සතුටු නම්, ඔහුට අඩු ගණනේ මාස 3 ක පඩි සහිත නිවාඩු දීමේ ක්‍රමයක් තිබුණා. දැන් ඒ ක්‍රමය සම්පූර්ණයෙන්ම අහෝසි කර තිබෙනවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
කවුද කියන්නේ, අහෝසි කළාය කියා?

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
ඉගෙන ගන්නා අය.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
300 කට පඩි සහිත නිවාඩු දී තිබෙනවා.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
එසේ ඉගෙන ගන්නා රජයේ සේවක යෙක් ගිය සතියේ මා හමු වී කිව්වා, ඒ ක්‍රමය අහෝසි කර තිබෙනවාය කියා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)
අහෝසි කර නැහැ.

ඉලංගරත්න මයා.
(திரு. இலங்கரத்ன)
(Mr. Ilangaratne)
අහෝසි කර නැත්නම් බොහොම සන්තෝෂයි. එහෙම නම් කැබිනට් මණ්ඩලයත් සමඟ සාකච්ඡා කර, ඒ සැකය දුරු කර ගන්නා ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

සැකයක් තබා ගන්නට එපා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

විශ්ව විද්‍යාලයේ ස්වාධීනත්වය දැන් හුඟාක් දුරට අඩු වී තිබෙනවා.

**ගරු ඉරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ස්වාධීනත්වය අඩු වුණේ කොහොමද කියා අප දන්නවා.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නට යෑමේදී, එක්තරා අන්දමකට අධ්‍යාපන කටයුතුවලට මැදිහත් වන්නට සිදු වන බව අප පිළිගන්නවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

නියෝජ්‍ය කථානායකතුමනි, සභාවේ ගණපූරණයක් නැහැ.

**මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොතිබියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.**

**පසුව ගණපූරණයක් තුබුයෙන්—**

*சபை கணக்கிடப்பட்டு நிறைவெண் இல்லையென்று கண்டதனால் பிரிவு மணி அடிக்கப்பட வேண்டுமென ஆணையிடப்பட்டது.*

*பிறகு, நிறைவெண் இருந்ததனால்—*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

Later, a Quorum being present—

**එස්. ද එස්. ජයසිංහ මයා. (කම්කරු, රැකීරක්ෂා හා නිවාස ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எஸ். டி எஸ். ஜயசிங்ஹ—தொழில், தொழில் வசதி, வீடமைப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. S. de S. Jayasingha—Parliamentary Secretary to the Minister of Labour, Employment and Housing)

Sir, it is very cold in the Chamber. That is why we go out.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

To warm yourself.

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා කියමින් සිටියේ, විශ්ව විද්‍යාලවල තිබුණු ස්වාධීනත්වය නැති වී ගොස් තිබෙන බවයි. ඕනෑම රජයක් ඒ රජයේ පරමාර්ථ අනුව එක්තරා ප්‍රමාණයකට අධ්‍යාපන කටයුතුවලට මැදිහත් විය යුතු බව අප පිළිගන්නවා. ඒ ප්‍රතිපත්තිය අනුව අපත් කටයුතු කරගන ආවා. වර්තමාන අධ්‍යාපන ඇමතිතුමාත් හුඟාක් දුරට ඒ ප්‍රතිපත්තිය අනුව කටයුතු කරගන යන්නට වීරිය කරන බව පෙනෙනවා. ඒ නිසා, විශ්ව විද්‍යාල සම්බන්ධයෙන් රජය සැලකිල්ලක් දැක්වීම ගැන, ඒ විශ්ව විද්‍යාලවල කටයුතු කෙරෙහි එක්තරා ප්‍රමාණයකට ඇඟිලි ගැසීම ගැන අප විරුද්ධ වන්නේ නැහැ. ඒ වුණත්, එක්තරා විධියක ස්වාධීනත්වයක් ඒ විශ්ව විද්‍යාලයවලට තිබිය යුතුයි. ප්‍රමාණය ඉක්මවා ඒ ස්වාධීනත්වය පරිහරණය කළොත්, මා හිතනවා ගරු ඇමතිතුමාට පමණක් නොව රටටත් එයින් කරදරයක් වනවාට කිසිම අඩමානයක් නැහැ.

ඒ වාගේම මා සන්තෝෂ වෙනවා, කොයි තරම් බලපෑම් තිබුණත් රජයට ගත් පාඨශාලා ආපසු නොදීමට අධ්‍යාපන ඇමතිතුමා ගන්නා උත්සාහය ගැන. අධ්‍යාපනය පිළිබඳ සම්පූර්ණ වගකීම භාර ගත යුත්තේ රජයයි. උසස් අධ්‍යාපනය පිළිබඳ වාතාවරණය නැත්නම් වටපිටාව ඇති කරන මූලික අධ්‍යාපනය දීම පිළිබඳ වගකීම එක්තරා අන්දමකින් රජය අතට ගැනීම ඉතා සුදුසුයි. රජයට පවරා ගත් ආධාර ලැබූ පාඨශාලා යළිත් ඒ ඒ පුද්ගලයන්ට දීමට දැන් බලපෑම් ඇති වෙගන යනවා. ඒ බලපෑම්, පෙළඹවීම් නිසා පාඨශාලා ටිකක් ආපසු දීලත් තිබෙනවා. මින් පසු කිසිම බලපෑමකට යටත් නොවී දිගටම කටයුතු කරගෙන යන ලෙස මා ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ අදහස් ටික සලකා බලන්න. ගරු ඇමතිතුමාට මෙයින් ධෛර්යයක් ලැබේවායි ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 7.8

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු කථානායකතුමනි, මාත් මෙම විශ්ව විද්‍යාල ඇති කිරීම ගැන වචන සවල්පයක් කථා කරන්නට අදහස් කරනවා. විශ්ව විද්‍යාල ඇති කිරීමේ අදහස හොඳයි. ඒ අතීත සිංහල යුගයේදී අපේ රටේ තිබුණු විශ්ව විද්‍යාල මෙන් නොව අධිරාජ්‍යවාදි පාලනය පැවති කාලයේදී රටේ වුවමනා එපාකම් ගැන නොසලකා විශ්ව විද්‍යාල පවත්වාගෙන ගියා. දෙවන ලෝක මහා සංග්‍රාමය ඇති වුණේ නැත්නම් ලංකාවේ විශ්ව විද්‍යාලයක් ඇති වන්නෙත් නැහැ. දෙවන ලෝක මහා සංග්‍රාමය නිසා එංගලන්තයේ සිට උපාධි පටවා එවන නැව්වලට සහ අහස් යානාවල ගමන් බිමන් අවහිර වූ හෙයින් ලංකාවේම උපාධි සකස් කර පිරිනමා එක්තරා පන්තියකට අයත් පිරිසක් බෝ කිරීම එදා පටන් ගත් විශ්ව විද්‍යාලයේ අරමුණයි. සාමාන්‍ය ජනතාවට වඩා ඉහළින් සිටීම සඳහා උපාධි ලේබල් ගසා ගත් පිරිසක් බෝ කිරීමට තමයි, එදා විශ්ව විද්‍යාලය උපයෝගි කර ගත්තේ. මේ තත්ත්වයෙන් අපේ විශ්ව විද්‍යාලය දීර්ඝ කාලයක් පැවතුණා. කෙසේ වුවද නරකෙනුත් හොඳක් ඇති වෙනවා යයි කියන්නාක් මෙන් දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව ලංකාවටත් විශ්ව විද්‍යාලයක් ඇති වුණා. නොයෙක් අනට කඹ ඇදීම් තිබී නොයෙකුත් කරදර ඇති වී අන්තිමේදී රාජ්‍ය මන්ත්‍රණ සභාවේදී එක වැඩි ඡන්දයකින් සම්මත වුණු යෝජනාවක් අනුව පේරාදෙණියට විශ්ව විද්‍යාලය ලැබුණා. එය උයන්වත්ත පොල් ගොල්ල පැත්තට යන්නට ගොස් පසුව පේරාදෙණියට ගියා. මෙම විශ්ව විද්‍යාලයෙන් වුණත් රටේ අවශ්‍යතා පිරිමැසෙන අධ්‍යාපනයක් ලැබුණා යයි කියන්නට පුළුවන්කමක් නැහැ. ඒ විශ්ව විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා පිට වූ උගතුන්ගෙන් රටේ අඩුපාඩුකම් මගහරවා ලීම සඳහා කිසියම් වැඩ පිළිවෙළක් ඇති වුණු බවක් පෙනෙන්නට නැහැ. අපේ පැරණි ගොවි මහතකු වී බුසලකින් බුසල් 10 ක් උපද්දනවා නම් විශ්ව විද්‍යාල අධ්‍යාපනයක් ලබා සිටින උපාධිධරයකු අඩු ගණනේ වී බුසලකින් බුසල් 20 ක් වත් උපද්දවන්නට ඕනෑ. විශ්ව විද්‍යාලයකින් ඉගෙන ගත් උපාධිධරයකු අපේ ගම්බද ප්‍රදේශයකට ගොස්, "පතෝල කරලට ගලක් එල්ලීම නිසා එය දික් වෙනවා නම් මිරිස් කරලට ගලක් එල්ලීමෙන් එය දික් වන්නට බැරි ඇයි ?" යනුවෙන් ප්‍රශ්නයක් අසා තිබෙනවා.

**බර්නාඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)

I rise to a point of Order. Since the air-conditioning apparatus has stopped, could you please direct that the windows be opened ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

It was stopped because there was a complaint that it was too cold inside the Chamber. It will be switched on after some time.

**ටී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්ව විද්‍යාල මගින් කළ යුත්තේත් රටේ අවශ්‍යතාවන් පිරිමසාලීමයි. මේ රටේ විශ්ව විද්‍යාලවල සහ බාහිර පාඨශාලාවල ඉංග්‍රීසි ඉගැන්වීම ගැන, අපේ මිනිසුන් ඉංග්‍රීසි දැනගැනීම ගැන, අපි විරුද්ධ වන බවක් රාජාසන කථා විවාදයේදී ගරු ඇමතිතුමා ප්‍රකාශ කර තිබුණා. ඒක වැරදි කල්පනාවක්. ඉංග්‍රීසි පමණක් නොවෙයි, පෘතුගීසි, ඕලන්ද, ප්‍රංශ වැනි භාෂා සිය ගණනක් ඉගෙන ගත්තත් අපෙන් වරදක් නැහැ. කවුද ඒකට විරුද්ධ වන්නේ ? අපි එවැනි අයට වැඩි වැඩියෙන් සලකනවා. හිස නමනවා. අපි විරුද්ධ වන්නේ ඒකට නොවෙයි. අපේ භාෂාව සහ අපේ ජාතිය දියුණු කිරීම පිණිස මේ රටේ වාසය කරන සියලු දෙනාම උත්සාහ දැරිය යුතුයි. ඒ සඳහා අපි, අපේ රටේ භාවිත වෙන සිංහල භාෂාව උසස්ම භාෂාව වශයෙන් සැලකිය යුතුයි. එසේ හෙයින් විශ්ව විද්‍යාලවලදී වේවා, අනිකුත් විද්‍යාස්ථානවලදී වේවා, මෙවැනි උසස් සභාවලදී වේවා, වෙන වෙනත් ආයතනවලදී වේවා, අපට ජන්ම දායාදයක් වශයෙන් ලැබී තිබෙන අපේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

රටේ වැඩි දෙනාගේ භාෂාව වන සිංහල භාෂාවේ අයිතිය රැකීම පිණිස එම භාෂාව භාවිතා කොට එය දියුණු කිරීමට උත්සාහ ගන්ට වුවමනා බව අප කල්පනා කළ යුතුයි. එසේ නොවෙනවා නම් තමයි, අපි විරුද්ධ වන්නේ.

ගරු ඇමතිතුමා සිංහල භාෂාව පිළිබඳව වැදගත් අදහස් කීපයක් ප්‍රකාශ කර තිබුණු බව පත්‍ර මාර්ගයෙන් අපට දකින්ට ලැබුණා. ඒවා මෙම පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කරන ලද අදහස් නොවෙයි. මා එම අදහස් පත්‍ර මාර්ගයෙන් කියවා බලා බොහොම සන්තෝෂයට පත් වුණා. සිංහල භාෂාව පිළිබඳව එතුමාට තිබෙන තත්වාවබෝධය පිළිබඳව මා ඉතාමත් සතුටට පත් වුණා. එතුමා කියා තිබුණා, ඉංග්‍රීසිය නිසා සිංහල භාෂාව යට වෙනවාය; ඉංග්‍රීසිය නිසා සිංහල භාෂාව නරක් වෙනවාය; එය සම්පූර්ණයෙන්ම නැති වෙනවාය යන අදහස. එතුමාගේ එම ප්‍රකාශය සියයට සියයක්ම ඇත්තයි. අපි මේ ගැන සියුම්ව කල්පනා කර බලන විට ඒ බව අපට පෙනී යනවා. ඉංග්‍රීසි උගතුන් විසින් සිංහල භාෂාව භාවිතා කරන්නට යාම නිසා සිංහල භාෂාවේ සම්ප්‍රදාය නැත්තටම නැති කර තිබෙන බව අපි පිළිගන්නවා. පත්‍රවල පළ වී තිබුණු පරිදි, ගරු ඇමතිතුමාට එම අවබෝධය ඇත්ත වශයෙන්ම තිබෙනවා නම් එය උසස් අවබෝධයක් හා හරි දැනීමක් බව අපි කියනවා. කොතෙකුත් භාෂා ඉගෙන ගත්තාට වරදක් නැහැ. විශ්ව විද්‍යාලවල උගන්වන අයට සාමාන්‍ය ස්ථාන වල උගන්වන අයට වඩා සිංහල පිළිබඳ උසස් දැනුමක් තිබෙන්ට ඕනෑ. මා එක් දිනක් කොළඹ පිහිටි ලොකු සාප්පුවකට ගියා පොතක් ගන්ට. එහිදී මා එක්තරා පොතක් පෙරළද්දී එහි තිබුණු කවියක් මට දකින්ට ලැබුණා. ඒ කවිය කියවා බලා අනික් පැත්ත බලන විට මට දකින්ට ලැබුණා පුහුණු ගුරුවරුන් තිදෙනෙක් එහි විත් සිටින බව. අර කවිය කියවූ මා ඒ අයගෙන් ප්‍රශ්න කළා, හෝඩියේ අකුරු දොළහ මොනවාද කියා. මේක ඇත්ත සිද්ධියක්. ඒ ගුරුවරුන් තිදෙනාම පුහුණු ගුරුවරුන් බව කියන්ට ඕනෑ. නමුත් ඒ අය හෝඩියේ අකුරු 12 දන්නේ නැහැ. මේ ගැන මා ඒ උදවිය සමග කථා කර මින් සිටින විට එතැනට පැමිණියා පැරණි ගුරු මහතෙක් මා ඒ ගුරු මහතාගෙන් ඇසුවා, "මේ පුහුණු ගුරුවරු තිදෙනා සිංහල හෝඩියේ අකුරු 12 දන්නේ නැති බව කියනවා; මහත්මයා දන්නවාද?" කියා. මා නම් මේක දෙවන ප්‍රමාණයේදී ඉගෙන ගත් එකක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
හෝඩියෙ තියෙන්නෙ අකුරු දොළහද?

**ටී. බී. තෙන්නකෝන් මයා.**
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)
හෝඩියේ තියෙන අකුරු 12 මොනවාද කියා තමුන්නාන්සේලාටවත් තේරෙන්නේ නැති එක ගැන කනගාටුයි. එනිසා නොදන්න දේ ගැන කථා කරන්ට යන්ට එපා. කොයි පැත්තෙ අයට වුණත් මා කියන්නේ ඒකයි. මා ඇසූ එම ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් අර ගුරු මහතා කීවේ මොකක්ද? ඒ පැරණි ගුරුවරයා මට කිව්ව, ඇයි ඒ කවියේ නැද්ද "සුරුවත් සමහරු නොදනිති ඉදුරා" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කවිය මේකයි:

"එක් සොර පස් වග ය ර ල ව සතරා
ශ ෂ ස හ එකකුරු ළයනෙක අකුරා
සුරුවත් සමහරු නොදනිති ඉදුරා
හෝඩියෙ බරකුරු දැනගත් සපුරා"

ඒ විධියට හෝඩියෙ අකුරු දොළහ දැන ගන්නය කියනවා. "එක් සොර" කියන්නේ හෝඩියේ ස්වර 12 එකයි කියන එකයි. "පස් වග" වර්ග පහ පහයි. ය ර ල ව කියන අකුරු හතර හතරයි. ශ ෂ ස හ කියන අකුරු ටික. ළ අකුරු එකයි. ඔන්න ඕවයි හෝඩියේ බරකුරු. බර කියන්නේ 12 ට. ඉතින් මේ සිංහල පාර්ලිමේන්තුවේ ඒ පැත්තෙත් මේ පැත්තෙත් සිටින අයට ඕක නොතේරෙන එක ගැන මට කරන්නට දෙයක් නැහැ. මා නම් මෙය ඉගෙන ගත්තේ දෙවැනි පොත කියවද්දීයි. එහෙත් දන් සිටින සමහර පුහුණු ගුරුවරුන්වත් එය දන්නේ නැහැ. සිංහල ඉගෙන ගෙන තිබෙන්නේ ඒ පිළිවෙළටයි. ගරු ඇමතිතුමාට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. තෙන්නකෝන් මයා.]

මම ඇත්තක් කියන්නම්. මා කොළඹ සිට ගෙදරට යන අවස්ථාවේ එක්තරා ගුරුවරයෙක් මගේ ගෙදරට ඇවිත් හිටියා. ඒ ගුරුවරයාගෙන් මා ඇහුවා “ පැමිණියේ ඇයි ?” කියලා. එතකොට ගුරුවරයා කියනවා, “ මා පාසැලේ උගන්වන්නේ 4 වැනි ප්‍රමාණයටයි. හෙට උගන්වන්නට තිබෙන පාඩමේ මා නොදන්නා අකුරු දෙකක් තිබෙනවා. එය අහගන්නට ආවා ” කියලා. සිංහල පිළිබඳව දැනීමක් මට තිබෙනවාය කියා අපේ පළාත්වල සිටින මිනිසුන් අතර ප්‍රසිද්ධියක් තිබෙනවා. එහෙත් මා නම් ඒ තරම් දන්නා මනුෂ්‍යයෙක් නොවෙයි. ඒ ගුරුවරයා ඇවිත් මගෙන් ඇහුවා “ මෙන්න මේ අකුරු දෙක මොනවාද ” කියලා. අකුරු දෙක මේකයි : අපේ හෝඩියේ තිබෙනවා ඉළුයන්න (ඏ) කියා අකුරක් හා මහා ප්‍රාණ ජයන්න (ඣ) කියා අකුරක්. දන්නේ නැති අකුරු දෙකක් වන ඣ යන්නයි, ඏ යන්නයි, කොයි විධියද කියා ඒ ගුරුවරයා මගෙන් ඇහුවා. සිංහල භාෂාව පිළිබඳව ගුරුවරුන්ගේ දැනීමේ තත්ත්වය එයින්ම පෙනෙනවා. අපි කවුරුත් සිංහල කථා කරනවා. ඇමතිතුමා ප්‍රකාශ කළ අන්දමට අප සිංහල දැනීම ලබාගන්නට යන්නේ ඉංගිරිසි උගත් අය සෑදූ සිංහලවලින් හා ගෙවල්වල කුස්සියේ කථා කරන සිංහලවලිනුයි. මහත්වරුන් ඉගෙනගෙන තිබෙන්නේ කුස්සියෙන් එන සිංහල. සිංහල ඉගෙන ගැනීමට තිබෙන්නේ ඔය මාර්ග දෙකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුරාණයේ තිබුණු විශ්ව විද්‍යාල තමයි පිරිවෙන්. පිරිවෙනේ විභාග සමත් වූ හාමුදුරුවෝත් ප්‍රාචීන පණ්ඩිත විභාගය සමත් වූ හාමුදුරුවෝත් භාෂාව පිළිබඳව පිබිදිලා හිටියා. දැනීම අතින් කිසිම දෙයකින් අඩුවක් නැහැ. ව්‍යාකරණ රීතියක් ගැන හෝ අක්ෂරයක් ගැන අප ඉගෙන ගත් ගුරුවරයකුගෙන් ඇසුවොත් ඉතාමත් පුදුමාකාර අන්දමට ඉතාමත්ම පැහැදිලිව එය පැහැදිලි කර දේවි. අද පිරිවෙන්වලත් ඒ තත්ත්වය නැහැ. අප ඉගෙන ගත් පසුගිය අවධියේ සිංහල භාෂාව පිළිබඳ තිබුණු තත්ත්වය අද පිරිවෙන්වලත් නැහැ. එම නිසා මේ යටපත් වී ගොස් ඇති සිංහල භාෂාව හරියාකාර උගන්වන ස්ථානයක් කවුරු හෝ ඇති කරනවා නම්—සිංහල භාෂාවේ නියම තත්ත්වය නැවත ඇති කරනවා නම්—එය විශාල සේවයක්. සිංහල භාෂාවේ වචන නැතැයි කියල හුඟ දෙනෙක් කියනවා. අපේ මන්ත්‍රීවරුනුත් කියනවා නීතියේ තිබෙන වචනයක අදහස සිංහලෙන් දෙන්නට ඒ සඳහා කෙලින්ම එක වචනයක් යොදන්නට බැරිය කියලා. ඉංග්‍රිසි වචනවල අර්ථය ඒ ආකාරයටම දෙන්නට පුළුවන් ශක්තියක් ඇති සිංහල වචන සොයා ගැනීම බොහෝ විට අපහසු කාර්යයකැයි කීවාම එහි අනෙක් පැත්ත ගැනත් සලකා බැලීම යෝග්‍ය බව මා කියා සිටියා. කෙලින්ම ඉංග්‍රිසි වචනයකින් අදහස නිවැරදිව ප්‍රකාශ කිරීමට බැරි සිංහල වචන දාහක් වුණත් ඉදිරිපත් කිරීමට පුළුවන් බව මා එවිට කිව්වා. සුදුසු වචන සොයා ගැනීම අපහසු වන තැන් ඕනෑ තරම් ඇති බව කාටවත් රහසක් නොවෙයි. සිංහල භාෂාවේ වචනයක් වන “ නෙරිය ” යන්න එක් ඉංග්‍රිසි වචනයකින් කියන්නට පුළුවන්දැයි මා ඇසුවා. නෙරියේ සඟවාගෙන ගියාය කිව්වොත් එය ඉංග්‍රිසියට පරිවර්තනය කිරීම ඉංගිරිසි වචන කිහිපයක් යොදා මිස නොකළ හැකියි. නෙරිය කියන්නේ නරියා කියන වචනයෙන් හදාගත් එකක් එහෙම නොවෙයි. ඒ නිසා සිංහල ගැන හරි දැනුමක් නැති උදවිය සිංහල පරිවර්තනය කිරීමෙන් සිංහලයටත් නින්දා කරන්නට එපා.

අප නිතරම පාහේ කථා කරන්නේ සිංහල භාෂාවෙනුයි. අපත් සිංහල භාෂාව පිළිබඳව සෑහෙන දැනුමක් තේරුමක් ඇති අය හැටියට රටේ සමහර උදවිය පිළිගෙන තිබෙනවා. මට මතකයි 1942 අවුරුද්දේ සිදු වූ දෙයක්. කුමාරතුංග මුනිදාස නමින් ප්‍රසිද්ධ, උගත් සිංහල පඬිවරයා ගැන තමුන්නාන්සේ අසා ඇතුවාට කිසිම සැකයක් නැහැ. එතුමා කළ කථාවලට ඇහුම්කන් දීමට මටත් වාසනාවක් තිබුණා. බොහොම සාරවත් කථා කිරීමට කුමාරතුංග මුනිදාස පඬිතුමා සමර්ථයි. සිංහල භාෂාවේ රසවත්කමක් එහි ඇති ගැඹුරු ස්වභාවයත් ගෙනහැර දක්වමින් ඒ පඬිවරයා කථා කරන විට, සිංහල භාෂාවේ විශාරදයින් තමන් යයි සිතා සිටි බොහෝ දෙනෙකුට තමන්ගේ සිංහල දැනුම ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

සමහර විට ලජ්ජා හිතෙන්නට ඇති. අප කථා කරන්නේ සිංහලදැයි ඇතැම් උදවියට සැක හිතෙන්නටත් ඇති. සිංහලය ගැන අප ලබා ඇති වැටහීම කුමක්දැයි තමන්ටම ලජ්ජා හිතෙන තරම් ව්‍යක්ත ස්වභාවයකින් ඒ පඩිවරයා කථා කරනු ඇසූ බොහෝ දෙනා තමන් සිංහලයන් වශයෙන් සිටීම ගැන ආඩම්බරයටත් පත් වුණු බව මට කියන්නට පුළුවනි. එවැනි ශ්‍රේෂ්ඨ සිංහල පණ්ඩිතයන් මා දැක තිබෙනවා, ලංකාවේ. විශ්ව විද්‍යාලයක ක්‍රමානුකූල අධ්‍යාපනයක් ලත් කෙනෙකුගේ දැනුම අනෙක් අයගේ දැනුමට වඩා උසස් විය යුතු බව මා පිළිගන්නවා. ඒ අනුව උපාධිධරයකුගේ දැනුම උසස් බව පිළිගත යුතුයි. ඒ කොයි හැටි වෙතත් උපාධිය ලබා සිටි තරමට ඔවුන්ගෙන් මේ රටට ඒවායින් ප්‍රයෝජනයක් නොලැබුණු බව ගරු ඇමතිතුමාත් කියාවි. කවුරුන් කොයි තරම් තරහ වුවත් අපේ රටටත් ජාතියටත් හරි ප්‍රයෝජනයක් තවම මේ අයගෙන් ඇති වෙලා නැහැ යන්න මට කියන්නට පුළුවනි. මා එය ස්ථිර වශයෙන්ම කියනවා.

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා. (මිනුවන්ගොඩ)**

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

ගරු ඇමතිතුමාත් එය විශ්වාස කරනවා.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

එතුමා එය විශ්වාස කළ යුතුයි.

**තුඩාවේ මයා.**

*(திரு. துடாவ)*

(Mr. Tudawe)

ඔව්, ගරු අධ්‍යාපන ඇමතිතුමාට විශ්ව විද්‍යාලයකින් ලැබුණු උපාධියක් නැහැ නොවැ.

**ටී. බී. තෙන්නකෝන් මයා.**

*(திரு. ரீ. பி. தென்னகோன்)*

(Mr. T. B. Tennekoon)

විද්‍යාව ගැනත්, ඉංජිනේරු කර්මාන්තය ගැනත් වෙනත් දේ ගැනත් කථා කරන ඇතැම් අය කියනවා ඒවා සිංහලෙන් නම් උගන්වන්නට බැහැ කියලා. මා දුම්රිය දෙපාතීමේන්තුවේ වැඩ කර තිබෙනවා. දුම්රියේ එන්ජිමේ ලියා තිබෙන හැම දෙයක්මත් තිබෙන්නේ ඉංග්‍රීසියෙනුයි. මා ඒ වැඩ කළේ ඉංග්‍රීසි ඉගෙන ගෙනත් නොවෙයි. දුම්රිය දුවවන්නට අදින එකට කියන්නේ රෙගියුලේටර් යන නමයි. සිංහලෙන් ඇද්දත් ඒක දුවනවාමයි. සවලය කියලත් එකක් තිබෙනවා. ඒකත් ඉංග්‍රීසියෙන් පාවිච්චි නොකළාට සිංහලෙන්මත් පාවිච්චි කරන්ට පුළුවනි. වතුර දමන උපකරණයේ නමත් ලියා තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. එහෙත් සිංහලෙනුත් එය පාවිච්චි කරන්නට පුළුවනි. කොයිල් කියන එකත්, සවලයත්, ඉන්සියුලේටරයත්, ඔය හැම උපකරණයක්ම ඉංග්‍රීසි නොදන්න අය අතිනුත් ක්‍රියා කරවන්නට පුළුවනි. මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වැඩ කරන විට කොම්පෝස් කරනවය කියා දෙයක් කරනවා. ඉම්පෝස් කරනවය කියා දෙයකුත් කරනවා. ඔය හැම දෙයක්ම සිංහලයෙනුත් කරන්නට පුළුවනි. ඔය කොයි කොයි උදවිය කොයි කොයි විධියට කිව්වත් ඉංග්‍රීසියෙන් කරන්නට පුළුවන් දේවල් හැම එකක්ම වාගේ සිංහලෙනුත් කරන්නට පුළුවනි. ලංකාවේ නොයෙක් කර්මාන්ත කරන්නන් ඉංග්‍රීසි දැනගෙන නොවෙයි ඒවා කරන්නේ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමාගේ කර්මාන්ත ශාලාවල වැඩ කරන්නේ ඉංග්‍රීසියෙන් නොවෙයි රෙදි වියන්නේ ඉංග්‍රීසියෙන් නොවෙයි. ගොවිතැන් කරන්නෙත් ඉංග්‍රීසියෙන් නොවෙයි. ඉංග්‍රීසිය නොවෙයි වුවමනා කරන්නේ මුලින්. අපට වුවමනා ආහාර, වස්ත්‍ර ආදියයි පළමුවෙන්ම වුවමනා කරන්නේ. මේකට ඉංග්‍රීසිය නැතිව බැරියයි මිනිසුන් කියනවා නම්, රටේ මිනිසුන් වැඩි දෙනකු එය බාරගෙන කටයුතු කරනවා නම් මීට වඩා පුදුමයක් තවත් නැහැ.

**වෛද්‍යාචාර්ය ඊ. එම්. වී. නාගනාතන් (නල්ලූර්)**

*(டொக்டர் ஈ. எம். வி. நாகநாதன்—நல்லூர்)*

(Dr. E. M. V. Naganathan—Nallur)

What is the subject we are discussing, Sir?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

If you do not know it, please do not ask questions.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

You do not seem to know it either.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

That is not the way to address the Chair.

වෛද්‍යාචාර්ය නාගනාතන්
(டொக்டர் நாகநாதன்)
(Dr. Naganathan)

I asked a question.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You have no right to ask such a question.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

He should withdraw that remark.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

I do not take notice of people like that.

ටී. බී. තෙන්නකෝන් මයා.
(திரு. ரீ. பி. தென்னகோன்)
(Mr. T. B. Tennekoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේව ගැන විස වන්නට හේතුවක් ඒ උදවියට නැහැ. ඔය කනේ දමන එක දමාගෙන කථාවේ පරිවර්තනය අසා ගන්නට පුළු වන්කම තිබෙන නිසා, නල්ලූර්හි ගරු මන්ත්‍රීතුමාට මගේ කථාව නොතේරී ඒ විධියට ප්‍රශ්න කළායයි හිතන්නටත් අපට පුළුවන්කමක් නැහැ. ජාති භේදයක්, වර්ග භේදයක්, ආගම් භේදයක් ඇවිස්සෙන කිසිම දෙයක් මගේ කථාවෙහි නැහැ.

විශ්ව විද්‍යාලයකින් අප බලාපොරොත්තු වන්නේ අපේ රටට වුවමනා කරන මිනිසුනුයි. රටේ හැම දෙනාම අද්ධ්‍යාපන වරුන් කරන්නට අපට වුවමනාවක් නෑ. හැම දෙනාම ඉංජිනේරුවන් කරලත් බැහැ. ලංකාවේ හැම දෙනාම දොස්තර වරුන් වුණොත් බෙහෙත් ගන්නට කෙනකු නැතිව යනවා. ඔක්කොම ගුරු වරුන් වුණොත් ඉගෙන ගන්නට කවු රුන්වත් නැහැ. සියලු දෙනාම ඉංජිනේරු වන් වුණොත් අනෙක් වැඩ කරන්නට මිනිසුන් නැති වෙනවා. එම නිසා, ලංකාවේ ජනගහනය අනුව, රටට වුවමනා කරන ප්‍රමාණය අනුව එක් එක් වර්ගයේ මිනි සුන්—දොස්තරවරුන්, ඉංජිනේරුවන්, ගුරුවරුන්, වඩුවන්, මේසන්වරුන් යනාදී උදවිය—බිහි කර ගැනීමයි අපට වුවමනා කරන්නේ. විශ්ව විද්‍යාල වලිනුත් වෙනත් අධ්‍යාපන ආයතනවලිනුත් අප බලා පොරොත්තු වන්නේ එයයි. මේ වැඩේ මොන ආණ්ඩුවකින් කෙරුණත් අපට කමක් නැහැ. මේ රටට වුවමනා කරන අන්දමේ අධ්‍යාපන ක්‍රමයක් ඇති වෙනවා නම්, වුවමනා කරන විශ්ව විද්‍යාල හා වෙනත් ආයතන ඇති වෙනවා නම්, එය මොන ආණ්ඩුවෙන් වුණත් අපට කමක් නැහැ. අප ආණ්ඩු කරද්දිත් ඒවා කරන්නට වෑයම් කළ බවත් මා මේ අවස්ථාවේදී කියන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා කළ ප්‍රකාශයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. සෑම ළමයකුටම හැතැප්ම 2 කට වඩා දුර නොගොස් මූලික අධ්‍යාපනය ලබා ගැනීමට පාඨශාලාත් සෑම ළමයකුටම හැතැප්ම 5 කට වඩා දුර නොගොස් උසස් අධ්‍යාපනය ලබා ගැනීමට විද්‍යාලයනුත් ඇති කළ යුතුයයි එතුමා කිව්වා. ඒවා මගින් විශ්ව විද්‍යාලවලට ළමයින් යැවීමයි එතුමාගේ අදහස වූයේ. ඒ බලා පොරොත්තුව ඉෂ්ට කර ගැනීමට තමයි අප, රටේ සෑම පාසලක්ම, සෑම විද්‍යාල යක්ම—ඒවා බෞද්ධාගමේ වුවත්, කතෝලික ආගමේ වුවත්, වෙනත් ආගමකට අයත් වුවත්—රජය අතට ගෙන සෑම තැනෙකම ඒකාකාර අධ්‍යාපනයක් දීමට වැඩ පිළිවෙළ යෙදුවේ. ඒ ආණ්ඩුව ඇති වන්නට පෙර මේ රටේ උසස් අධ්‍යාපනය ලැබුණේ, විශ්ව විද්‍යාලවලට යාමේ අවස්ථාව ලැබුණේ, කොළඹ හතේ ධන වත් පවුල්වල මෝඩ පුත්‍රයින්ට මිස දුප්පත් ගොවි කම්කරුවන්ගේ බුද්ධිමත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උසස් අධ්‍යාපන ආඥාව

දරුවන්ට නොවන බව කවුරුන් මා සමග තරහ වුවත් මේ අවස්ථාවේදී මා ස්ථිර ලෙසම ප්‍රකාශ කරනවා. ඒ අධ්‍යාපනයෙන් අපට අවබෝධ වුණා, ගම්බද පාඨශාලාවල ඉගෙන ගන්න ශිෂ්‍යයින්ට ඉතා උසස් බුද්ධියක් තිබෙන බව. සමහර විට රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යයන්ට වඩා දක්ෂ ලෙස එක වරම විභාගයෙන් සමත් වී උසස් උපාධි ලබාගත් අපේ ගලේවෙල විද්‍යාලයේ ඉගෙනීම ලැබූ ළමයින් සිටිනවා. එවැනි උපාධි ලබාගත්තට මදි. මම කලින් ප්‍රකාශ කළා වගේ මේ රටේ හැම දෙනාගේම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් ඇති කරන්න ඕනෑ.

මේ අළුත් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව, විද්‍යාව, කලා, සමාජ විද්‍යාව, නීතිය හා වාස්තු විද්‍යාව ආදිය උගන්වන්න යන බව අපට දැන ගන්න පුළුවන්කම තිබෙනවා. ඒවා ඉගැන්වීම බොහොම හොඳයි. ලෝකයේ විශ්ව විද්‍යාල ඇති වුණේ අදහස් දෙකක් අනුවයි. ඒ දෙකෙන් අර පරණ අදහස අත්හරින වැඩ පිළිවෙළක් ඇති කළයුතු බවයි, මා තරයේ කියන්නෙ. එනම්, රටේ මිනිසුන්ගෙන් වෙන්වීම පිණිස පට්ටම පෙන්නීමට උපාධි දීමේ ක්‍රමය අත්හැරිය යුතුයි. අපට විශේෂයෙන් අවශ්‍යව තිබෙන්නෙ රටට ප්‍රයෝජනවත් වන දැනුමක් ලබා දීම සඳහා විශ්ව විද්‍යාල පවත්වාගෙන යෑමයි.

විශ්ව විද්‍යාලවල සිංහල මාධ්‍යයෙන් කටයුතු කරන්ට බැරි බව නොයෙකුත් අන්දමින් ප්‍රකාශ වී තිබෙනවා. "අපට සිංහලෙන් උගන්වන්න පුළුවන්" යයි පසු ගිය කාලයේ මහාචාර්යවරුන් බොහෝ දෙනෙක් ප්‍රකාශ කළ බව ගරු අධ්‍යාපන ඇමතිතුමා දන්නවා. අද ඇමතිතුමා අපේ සටනට විරුද්ධව කථා කළත් අපේ කාලයේ සිංහල භාෂා සටනට මාර්ගදේශකත්ත්වය දෙමින් එහි මූලිකත්වය ගෙන එතුමා ක්‍රියා කළ බව—

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

අදත් එහෙමයි.

**පී. බී. තෙන්නකෝන් මයා.**
*(திரு. ரீ. பி. தென்னகோன்)*
(Mr. T. B. Tennekoon)

ඇමතිතුමාට දැන් අමතක වුණත් අපට නම් අමතක කරන්න පුළුවන්කමක් නැහැ. ඇමතිතුමාට හොඳට මතක ඇති ඒ කාලයේ එතුමා අප සමග භාෂා සටනෙ වීරවරයෙකු වශයෙන් කටයුතු කරන කාලයේ, විශ්ව විද්‍යාලයේ වැඩ කටයුතු සිංහලෙන් කරන්ට බැරි යයි බොහෝ දෙනකු කියා සිටි අවස්ථාවේ මහාචාර්යවරුන් විශාල පිරිසක් අපේ පැත්තට සිට "ඕනෑම විෂයයක් පිළිබඳව සිංහලෙන් අවශ්‍යවන කරුණු අපි උගන්වන්නම්" යයි කියා සිටි බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනත් භාෂාවකින් තිබෙන දෙයක් සිංහලෙන් උගන්වන විට ඒ භාෂාවේ වචනයට සමාන සිංහල වචනයක්ම වුවමනා කරන්නෙ නැහැ. ඒ භාෂාවේ වචනයම පාවිච්චි කළාට දෝෂයක් නැහැ. මම දුම්රියේ එන විට දැක තිබෙනවා. "ඇනිකට්" කියන වචනය ඉංග්‍රීසියෙන් යොදා තිබෙනවා. එහෙත් ඒක ඉංග්‍රීසි වචනයක් නොවෙයි. ඒ වගේ නොයෙක් භාෂාවලින් නොයෙක් වචන අරගෙන අපේ භාෂාව පෝෂණය කරගෙන වැඩ කටයුතු කරගෙන යන්න පුළුවන්.

අනික් කාරණය, යම් කෙනෙක් උනන්දු වෙනව නම් වෙනත් භාෂාවක් ඉගෙන ගැනීම එතරම් අමාරු දෙයක් නොවෙයි. මම දෙමළ භාෂාව ඉගෙන ගත්ත, සුමාන යෙන්. මට සෑහෙන්ට දෙමළ භාෂාව ලියන්න කියන්න පුළුවනි. කියනව නම් තවත් ඕනෑම භාෂාවක් මම ඉගෙන ගන්නම්. රුසියන් භාෂාවෙනුත් මට වචන 10 ක් 15 ක් කථා කරන්න පුළුවනි. මම රුසියාවට ගිහින් හිටියෙ දවස් කීපයයි. අපේ දුප්පත් ළමයි ඉංග්‍රීසි කථා කරන ගෙවල්වල බෝයි වැඩට ඇවිත් සුමාන දෙකක් ඉඳල ගියාම ගමේදී ඉංග්‍රීසියෙන් කථා කරනව. මම මේ දේශපාලන බිමේ ඉංග්‍රීසියෙන් වැඩ කරන නගර සභාවක අවුරුදු 20 ක් හිටිය. පාර්ලිමේන්තුවේ අවුරුදු 12 ක් හිටිය. පාර්ලිමේන්තු ලේකම්වරයකු වශයෙන් අවුරුදු 7 ක් හිටිය. මට වුවමනා කළා නම් ඉංග්‍රීසි භාවිතා කරන්න ඕනෑ තරම් මට පුළුවන්කම තිබුණා. එහෙත් මේ රටේ භාෂාවෙන් මේ රටේ වැඩ කරන්ට පුළුවන් තත්ත්වයක් මගේ ජීවිත

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. තෙන්නකෝන් මයා.]

කාලයේදී කවදා හෝ පෙන්වන්න පුළුවන් වුණොත් එය පෙන්වීම තමයි මගේ උසස් අධිෂ්ඨානය. මේ ගැන මට තවත් බොහෝ දේ කියන්ට තිබෙනව. එහෙත් තමුන්නාන් සේගේ මුහුණත් හොඳ නැහැ. ඇමති වරයාත් තරහ කරගෙන මේව ගැන දිගින් දිගට කථා කරන්න මගේ කැමැත්තකුත් නැහැ. එම නිසා මගේ වචන සවල්පය මෙයින් අවසාන කරනව.

අ. භා. 7.38

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව යටතේ කථා කළ සියළුම ගරු මන්ත්‍රීවරුන් අළුතෙන් විශ්ව විද්‍යාලයක් පිහිටුවීම ගැන විරුද්ධත්වයක් නොදක්වන බවත් ඊට සැම සහයෝගයක්ම දෙන්නට සූදානම් බවත් ප්‍රකාශ කිරීම ගැන මා ඉතාම සන්තෝෂ වෙනවා. භාෂාව පිළිබඳව් නම් ගරු මන්ත්‍රීවරුන් වැරදි හැඟීමකින් යුක්තව කථා කළ බව කිව යුතුයි. ගරු අගමැතිතුමා 1965 වර්ෂයේදී ලංකා විශ්ව විද්‍යාලයේ උප කුලපති තුමා ඇතුළු කථිකාචාර්යවරුන්ට කීවාක් මෙන් 1968 වර්ෂයේ පටන් ස්වභාෂාවෙන් හැම විෂයයක්ම විශ්ව විද්‍යාලයේ ඉගැන්වීමට නියමිතයි. මෙහිදී කථා කළ ගරු මන්ත්‍රීවරුන් බොහෝ දෙනෙකුට අමතක වූ කාරණයක් තිබෙනවා. තවමත් අපේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය භාෂාත්‍රයෙන්ම දෙනවා. මේ අවුරුද්දේත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ප්‍රාථමික පන්තිවලට අප ශිෂ්‍යශිෂ්‍යාවන් භාර ගත්තා. තවත් අවුරුදු 17 ක් ගත වන තුරු, ඒ කියන්නේ මේ ශිෂ්‍යශිෂ්‍යාවන් විශ්ව විද්‍යාලවලට ඇතුළුවී උසස් අධ්‍යාපන යද ලබා අවසාන කරන තුරු ඉංග්‍රීසියෙන් ඒ අයට ඉගැන්විය යුතුයි. එය අද තිබෙන නීතියයි. ඒ නීතිය වෙනස් කිරීම පිළිබඳව මා ළඟදී ඉදිරිපත් කරන සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන පනත් කෙටුම්පතේ ව්‍යවස් ථාවක් තිබෙනවා. මින්මතු සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් අපේ පාඨශාලාවල ශිෂ්‍යශිෂ්‍යාවන්ට ඉගැන්විය යුතුයයි නියම කරන ව්‍යවස්ථාවක් මා ළඟදී ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන ඒ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා. එතෙක් භාෂාත්‍රයෙන්ම ඉගැන්වීමට අප නීතියෙන් බැඳී සිටිනවා. මේ අවුරුද්දේ ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් ඉගෙන ගෙන ඇතුළු වූ ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය කෙළවර කරන තුරු යටත් පිරිසෙයින් තව අවුරුදු 17 ක් ගත වන තුරු, අධ්‍යාපනය ගෙන යා යුත්තේ ඉංග්‍රීසියෙනුයි. එහෙත් එසේ අධ්‍යාපනය ලබන ශිෂ්‍යශිෂ්‍යාවන්ගේ සංඛ්‍යාව ඉතාම අඩුයි. කොළඹත් එවැනි ශිෂ්‍යශිෂ්‍යාවන් දහසකට වඩා සිටිනවාය කියා මා කල්පනා කරන්නේ නැහැ. මේ සංඛ්‍යාව ඒ තරම් අඩුයි. එමනිසා ඉතා ස්වල්ප දෙනෙකුට ඉගැන්වීමට විශාල වියදමක් දැරීමට සිදුවන නිසා පමණක් නොව එයින් එතරම් ප්‍රයෝජනයක්ද නොවන නිසාත් මේ රටේ ස්වදේශික සියළු දෙනාම සිංහලෙන් හෝ දෙමළෙන් ඉගෙන ගැනීමට පෙළඹවීම සඳහාත් මා ඒ පනත් කෙටුම්පතට ව්‍යවස්ථාවක් ඇතුළු කර තිබෙනවා. එතෙක් විශ්ව විද්‍යාලවල හෝ වේවා ද්විතීය අධ්‍යාපනය පිළිබඳ ආයතනවල හෝ වේවා මාධ්‍ය තුනෙන්ම පන්ති පැවැත්විය යුතුයි. සමහර ස්ථානවල එවැනි පන්ති තිබෙනවා. රාජකීය විද්‍යාලයෙ, ආනන්ද මහා විද්‍යාලයෙ එවැනි පන්ති තිබෙනවා. ඒවාගේම තවත් නොයෙක් විද්‍යාලවලත් භාෂාත්‍රයෙන්ම උගන්වනවා. සමහර විට ඒ තත්ත්වය වෙන්න ඇති මේ ගරු මන්ත්‍රී වරුන් පටලවා ගෙන තිබෙන්නේ. එක් මාධ්‍යයකින් ඉගෙන ගන්නා අය දිගටම ඉගෙන ගෙන යන්නේ ඒ මාධ්‍යයෙන්මයි. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමාගේත් (බර්නාඩ් සොයිසා මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) කථාවලින් සැහෙන තත්ත්වයක් එළිපෙහෙළිවීම ගැන මා ඉතාම සන්තෝෂයි. එතුමන්ලා අවංකව තම අදහස් ප්‍රකාශ කළේ වී නමුත් වැරදි හැඟීම්වලින් යුක්තව සමහර අදහස් ඉදිරිපත් කළ බව මට පෙනී ගියා. මේ ළඟදී, විශ්ව විද්‍යාලයට ඇතුළු වන්නන්ට ඉංග්‍රීසි අනිවාර්ය විෂයයක් කිරීමට ජාතික උසස් අධ්‍යාපන මණ්ඩලය කල්පනා කරන්නට ඇති. ඒ අවස්ථාවේදී ජාතික ආණ්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් මා ඒ අදහසට එකහෙළාම විරුඬ වුණා. එහෙත් ඉංග්‍රීසි ඉගෙනීම ප්‍රයෝජන වත්. බොහෝ විට ඉංගිරිසි වචන සිංහල යෙන් පාවිච්චි කරනවාය කියා දඹුල්ලේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. තෙන්නකෝන් මයා.) කීවා. විශ්ව විද්‍යාලවල ඒ ඒ විද්‍යා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පීඨ පිළිබඳ මහාචාර්යවරුනුත්, උප කුලපති වරුනුත් ළඟදී මගේ කාර්යාලයට කැඳෙව්වා. ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදි විද්‍යා විෂයයන් ස්වභාෂාවෙන් ඉගැන්වීමට ඇති අපහසුව කුමක්දැයි මා ඔවුන්ගෙන් ඇසුවා. ඔවුන් කීවා, "ස්වභාෂාවෙන් ඉගැන්වීම සඳහා සිංහලයට පරිවර්තනය වී ඇති පොත් පත් ඇත්තේ ස්වල්පයයි ; සමහර වචනවලට පාරිභාෂික වචන—"ටෙක්නිකල් ටර්ම්ස්"—සොයා ගන්නට බැරිය" කියා. නමුත් එම විෂයයන් ස්වභාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව එතරම් දුෂ්කරතාවයන් ඇති බවක් ඔවුන් හැඟෙව්වේ නැහැ. ඒ හැම විෂයයක්ම සිංහලයෙන් ඉගැන්වීම සඳහා සිංහල පොත් පත් නැත්නම් ; අවුරුදුපතා, මාස්පතා, සතිපතා ආදි වශයෙන් නිතරම පාහේ වෙනස් වන විද්‍යාව පිළිබඳව ශිෂ්‍යයන්ට අවබෝධයක් ලබා දීමට ප්‍රමාණවත් සිංහල පොත් නැත්නම්; ඉංගිරිසි පොත් පත් පාවිච්චි කර සිංහලයෙන් උගන්වන්නය කියා මා ඔවුන්ට කීවා.

**බර්නාර්ඩ් සොයිසා මයා.**
*(திரு. பெர்னட் சொய்ஸா)*
(Mr. Bernard Soysa)
කෙරෙන්නේ නැහැ.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)
එපමණක් නොවෙයි. මුහුද යටින් යන යාත්‍රාවලට ඒ කාලයේ සිංහලයෙන් නමක් තිබුණේ නැහැ. අහස් යාත්‍රාවල යම් යම් කොටස්වලට සිංහල වචන තිබුණේ නැහැ. ඉංජිනේරු කර්මාන්තයත් දැන් ඉස්සරට වඩා බොහොම දියුණු වී තිබෙන නිසා එහි සමහර වචනවලට සුදුසු සිංහල වචන නැහැ. ඒ වචනවලට සුදුසු පාරිභාෂික වචන හදන්නට අපේ භාෂා පරිවර්තකයන් බොහෝවිට උත්සාහ කරන්නේ ; සංස්කෘත බෙංගාලි විශ්ව කෝෂ පෙරළා ගෙනයි. ඒ ඉංග්‍රිසි වචනවලට සුදුසු සිංහල වචන වශයෙන් ඔවුන් යොදන්නේ, ඉංගිරිසි වචනවලට වඩා දහ ගුණයක් අමාරු, උගුර කැඩෙන වචනයි. මා ඔවුන්ට කීවා, ජාත්‍යන්තර වශයෙන් පාවිච්චි කරන වචනම සිංහල ස්වරයෙන් විභක්ත්‍යන්ත කොට ඉගැන්වීම ඊට වඩා හොඳය කියා. "අල්මාරිය", "මේසය" යන වචන සිංහල වචන නොවෙයි. යම්කිසි භාණ්ඩයක් සඳහා අන් කිසි භාෂාවකින් ව්‍යවහාර කරන වචන සිංහල ස්වරයෙන් විභක්ත්‍යන්ත කොට පාවිච්චි කිරීමට තරම් අපේ සිංහල භාෂාව පොහොසත්. එසේ ඉංගිරිසි වචනම විභක්ත්‍යන්ත කොට සිංහල වචන හදා ගැනීම, සංස්කෘත හෝ වංග හෝ හින්දි හෝ වචනවලට වඩා ප්‍රයෝජනවත්. ඉංගිරිසි භාෂාවෙන් ඒ ඒ විෂයයන් උගැන්වීමේදීත් ඉංගිරිසි වචනම නොව ප්‍රංශ, ග්‍රීක්, ජර්මන් රුසියන් වචන හුඟාක් පාවිච්චි කරනවා. ඒ අනුව පාරිභාෂික වචන සෑදීමේදී උගුර කැඩෙන සංස්කෘත වචන. නොයොදා, ඉංගිරිසි වචනම විභක්ත්‍යන්ත කොට සිංහලට පෙරළා ගන්නවා නම් පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පිට රට යන ශිෂ්‍යයන්ටත් එයින් විශාල ප්‍රයෝජනයක් අත්වෙනවා. එම නිසා ඒ ඉංගිරිසි වචනම විභක්ත්‍යන්තය දමා සිංහල කර එම විෂයයන් උගන්වන ලෙස මා ඔවුනට කීවා. ඒ අයත් කීවා, "හා" කියා.

ඒ වුණත් මගේ හැඟීම නම්, ඉංගිරිසි භාෂාව පිළිබඳව සෑහෙන දැනුමක් තිබෙනවා නම් උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයනට එයින් විශාල ප්‍රයෝජනයක් අත්වන බවයි. මට පෙනෙන හැටියට නම්, මේ ගරු මන්ත්‍රීවරුනුත් ඊට විරුද්ධ නැහැ. බොහෝ දෙනෙක් කීවා, අපේ පුස්තකාලවල තිබෙන පොත් පත් ප්‍රමාණවත් නැත කියා. මා කලින් කී අදහස දැරීමට පුස්තකාල පිළිබඳ ප්‍රශ්නයත් එක් හේතුවක් වුණා. අපේ පුස්තකාලවල තිබෙනවා, ලක්ෂ ගණන් වටිනා පොත් පත්. එහෙත් ඉංගිරිසි දැනුමක් නැත්නම් ස්වභාෂා මාධ්‍යයෙන් ඉගෙන ගන්නා ළමයිනට ඒ පොත් පත් වලින් නියම ප්‍රයෝජනය ලබා ගන්නට බැහැ. එපමණක් නොවෙයි. විද්‍යාව පිළිබඳ යම් යම් සිද්ධාන්ත අවුරුදු පතා, මාස්පතා, සතිපතා වෙනස් වෙනවා. ආදියේ ස්ථිර වශයෙන් පිළිගත් යම් යම් සිද්ධාන්ත පවා දැන් වෙනස් වෙගන යන නිසා, ඒවා දැන ගැනීම සඳහා ඒවා පළ වන—මාස්පතා, සතිපතා පළ වන—ඉංගිරිසි සඟරා, පොත් පත් කියවීමට ළමයිනට අවස්ථාව සැළසෙන්නේ ඉංගිරිසි භාෂාව ඉගෙන ගෙන තිබුනොත් පමණක් හෙයින් ඉංගිරිසි භාෂාව ඉගැන්වීමට මා නියම කර තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

3045

උසස් අධ්‍යාපන ආඥාව

[ගරු ඊරියගොල්ල]

5 වන ප්‍රමාණයේ සිට ඉංගිරිසි ඉගැන්වීමට නියම කර ඇතත් ඉංගිරිසි ගුරුවරුන්ගේ හිඟකම නිසාත්—පසුගිය කාලය තුළ ජාත්‍යාලය සීමාව ඉක්මවා ගෙන යමින් ඉංගිරිසි ඉගෙනුමට සෑහෙන තැනක් නොදුන් හෙයින් 3 වන ප්‍රමාණයේ සිට තබා 5 වන ප්‍රමාණයේ පටන්වත් ඉංගිරිසි ඉගැන්වීමට තරම් ප්‍රමාණවත් ගුරුවරුන් නැති නිසා—5 වන ප්‍රමාණයේ සිට ඉංගිරිසි ඉගැන්වුවත් සමහර විට එයින් ශිෂ්‍යයනට එතරම් ප්‍රයෝජනයක් නොලැබේයැයි දැන් මට හැඟෙන නිසාත්, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හෙවත් 9 වන පන්තියේ පටන් විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ දෙවන අවුරුද්ද දක්වා වූ ඒ හතර අවුරුද්ද ඇතුළත විශේෂඥ ගුරුවරුන් හා උපාධිධර ගුරුවරුන් යොදවා ඒ ළමයිනට සෑහෙන ඉංගිරිසි දැනුමක් ලබා දෙන්නට කලින් අවුරුදු දෙකේදී අඩුපාඩු ඇති වුණත් විශව විද්‍යාල ප්‍රවේශ පන්තියේ අවුරුදු දෙකේදී හොඳින් ඉගැන්වීමට—වුව මනා කරන ඉංගිරිසි ගුරුවරුන් 2,600 ක් දැන් සූදානම් කර තිබෙනවා. ඒ 2,600 දැන් හැම පාඨශාලාවකටම බෙදා හැර තිබෙනවා. තවම කොළඹ ප්‍රදේශයේ වැඩිපුර හිරකර ගෙන සිටිනවා නම් ඒ ගැන සොයා බලා වැඩිපුර සිටින අය පිටිසර ඇති ගුරුවරුන් අඩු පාඨශාලාවලට පිටත් කර හරිනවා. ඒ අය ලවා විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තියේ ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවනට අවුරුද්දක් තුළ විධිමත් ඉංගිරිසි අධ්‍යාපනයක් ලබා දී සෑහෙන ඉංගිරිසි දැනුමක් ඇති කරන්නට අප බලාපොරොත්තු වෙනවා. ඉංගිරිසි අනිවාර්ය කළ යුතු යයි සමහරුන් යෝජනා කෙළේ මෙතැනදීයි. එහෙත් මා ඊට විරුද්ධ වුනා. විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගය සඳහා ඉංගිරිසි වුවමනා නැහැ. එසේ වුවද විශ්ව විද්‍යාලයට යන සෑම ළමයකුටම ලබන අවුරුද්ද ළඟ අවුරුද්දේ සිට විධිමත් ඉගෙනීමක් ලැබෙන පරිද්දෙන් දැන් වැඩ සකස් කර ඉවරයි.

ඊළඟට වෛද්‍ය ශිෂ්‍යයන්ගේ තත්ත්වය මොකක්ද? වෛද්‍ය ශිෂ්‍යයනට ප්‍රායෝගික අධ්‍යාපනය ලබා දෙන ආරෝග්‍යශාලාවල සිටින විශේෂඥ වෛද්‍යවරුන් අපේ අණට යටත් නැති බව මට මේ ළඟදී දැන ගන්නට ලැබුණා. ඒ සමහර අයට දෙවන පන්තියට එහා සිංහල දැනුමක් නැතැයි යන්න සත්‍යයක් විය හැකිය. ඒ අයට සිංහල සහ දෙමළ භාෂාවලින් උගන්වන්නට තරම් ඒ භාෂා පිළිබඳ දැනුමක් ඒ අයට නැති බව ඒ අය අවංකවම කියනවා. ඒ වගේම ඒ අය අපේ අණට කීකරු වන්නේත් නැහැ. ඒ අය අපේ ගුරුවරු නොවෙති.

බර්නාඩ් සොයිසා මයා.
(திரு. பெர்னாட் சொய்சா)
(Mr. Bernard Soysa)

ස්වභාෂාවෙන් ඉගැන්වීම සඳහා ඉදිරිපත් වන්නට ලැස්ති පිරිසක් ඉන්නවා.

ගරු ඊරියගොල්ල
(கௌரவ ஈரியகொல்ல)
(The Hon. Iriyagolle)

සමහරු කැමතියි. සමහරු අකැමතියි. මේ කැමති අකමැති දෙගොල්ලන්ගෙන්ම ඉගෙන ගන්නට ඕනෑ.

දකුණු කොළඹ මන්ත්‍රීතුමා කීවාක් මෙන් බෙත් සීට්ටු බොහොමයක් තිබෙන්නේ ලතින් වැනි භාෂාවලිනුයි. ඒ ලතින් වචන ඒ විධියටම සිංහලෙන් කියා දුන්නත් කමක් නැහැ.

ආයුර්වේද වෛද්‍ය විද්‍යාව තවමත් උගන්වන්නේ සංස්කෘත භාෂාවෙනුයි. තවමත් අප පන්සිල් කියන්නේ පාලියෙනුයි. සිංහලෙන් පන්සිල් දෙන්නට බැරිද? තවමත් ඒක පාලියෙන්ම කර ගෙන එනවා. ඉතින් සිංහලෙන් ඔය වැඩ කරන්නට පුළුවන් නම් හොඳයි. බැරිම තැනක් ඇති වුණොත් ඒ තැන්වලට ඉංග්‍රිසි වචන යොදන්නට සිදු වෙනවා. තත්ත්වය මෙසේ වුවද 1968 සිට විශ්ව විද්‍යාලයේ උගන්වන සෑම දෙයක්ම ස්වභාෂාවෙන් ඉගැන්වීම අපේ ප්‍රතිපත්තිය බව අප විශ්ව විද්‍යාල ආචාර්ය මණ්ඩලයට ඉඳුරා ප්‍රකාශ කළා. හැබැයි, ඉදිරියට ඉංගිරිසි පොතපත පාවිච්චි කළාම ද්විභාෂා තත්ත්වයක් ඇති වන්නටත් පුළුවනි. එහෙත් එය තාවකාලිකයි. අවුරුදු කීපයෙකින් ඒ ප්‍රශ්නය විසඳෙනවා ඇති. අපේ මේ යෝජනා ක්‍රියාත්මක කරන්නේ කෙසේදැයි සොයා බලා කාගේත් සහයෝගයෙන් ඒවා ක්‍රියාත්මක කිරීමයි, අපට වුවමනා කරන්නේ. තනි සිංහලෙන්ම මේවා කරන්නට තවම පුළුවන්කමක් නැහැ. උම්මග්ග ජාතකය, කාව්‍යශේඛරය වැනි පොත්වලින් ඉංගිරිසි වෛද්‍ය විද්‍යාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආදියෙහි ඇති කාරණා සොයා ගන්නට වචන නැහැ. එසේ හෙයින් කිසිම සැකයක් ඇති කර ගන්නට එපා. 1968 දී විශ්ව විද්‍යාලයයේ අධ්‍යාපනය සවභාෂාවෙන් දීම අපේ ප්‍රතිපත්තිය බව 1965 දී විශ්ව විද්‍යාලයයේ උපකුලපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලය ඉදිරියෙහිදී අපේ ගරු අගමැතිතුමා ප්‍රකාශ කළා. එය ස්ථිරයි. අපේ ප්‍රතිපත්තිය ඒකයි. එසේ වුවද මා දැන් කීඅන්දමට ඉංගිරිසි පොත් පත් පාවිච්චි කරන්නට සිදු වෙනවා. සිංහල භාෂාවෙන් සහ දෙමළ භාෂාවෙන් මේවා කිරීම ඉතාමත්ම අවශ්‍ය බව අනෙක් ගරු මන්ත්‍රිවරුන් මෙන්ම මාත් පිළිගන්නවා. මාත් සිංහල භාෂාව වෙනුවෙන් සටන් කළ කෙනෙක්. එක් වතාවක් සිංහලෙන් කථා කරන්ට ගොස් කථානායකතුමා විසින් මාව නෙරපන්ට යෙදුණා. මා තමයි මෙහි සිංහලෙන් කථා කළ යුතුය කියන යෝජනාව පළමුවන වරට ඉදිරිපත් කොට මහ සටනක් කළේ. හැබැයි පළමු වන කථාව කළේ මා නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව කාටවත් සැකයක් ඇති කර ගන්ට වුවමනා නැහැ. කොළඹ විශ්ව විද්‍යාලයේ දැනට තිබෙන පීඨ අනුවයි වෙනස්කම් කරන්නෙ. කලා අංශය, පෙරදිග භාෂා අංශය, නීති අංශය, විද්‍යා (සාමාන්‍ය හා විශෙෂ) අංශය, වෛද්‍ය අංශය කියා අංශ කීපයක් තිබෙනවා. එම අංශ එසේම තිබියදී මෙසේ වෙන් කළ පමණින් අනික් පීඨ ඊට ඇතුළත් කරන්නේ නැත යන හැඟීමක් ඇති කර ගන්ට වුවමනා නැහැ. අවශ්‍යතාව අනුව දැනට තිබෙන අංශ ඒ විධියටම වෙන් කරනවා. එයින් පසු අපට ඇති අවශ්‍යතාවන්ට අනුව කෘෂිකර්ම ආදී වෙන වෙනත් විද්‍යාවන්ද ඉගැන්වීමට බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම කෘෂිකර්මය පිළිබඳව අපි විශෙෂ උනන්දුවක් දක්වනවා. කෘෂිකර්මය සඳහා විශ්ව විද්‍යලවලට ඇතුළත් වන අයට විශෙෂ සැලකීමක් දක්වන්ට අපි අදහස් කරනවා.

සාමාන්‍ය හා කාර්මික අධ්‍යාපන යෝජනා ස්ථිර වුවායින් පසු කෘෂිකර්මය සඳහා විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන අයට ශිෂ්‍යත්ව සඳහා ගෙවන මුදල් වැඩි කළ යුතුය කියා අපි කල්පනා කරනවා. විද්‍යොදය විද්‍යාලංකාර ආදී විශ්ව විද්‍යාලයන්හි මෙවැනි ශිෂ්‍යත්ව ලැබූ උදවියට ලැබෙන්නේ නිකම් තේවතුර බොන්ට යන වියදම වාගේ ගණනක්. ෆේරාදෙණියේ වාගේ දෙන්නේ නැහැ. එම නිසා පේරාදෙණියේ දෙන ගණනම අනිකුත් විශ්ව විද්‍යාල දෙකේ ශිෂ්‍යත්ව ලබාගන්න උදවියටත් ලබා දෙන්ට අපි තීන්දු කර තිබෙනවා. හැබැයි, අපේ රට දුප්පත් රටක් බව අපි සිතන්ට ඕනෑ. එංගලන්තයේවත්, ඇමෙරිකාවේවත්, රුසියාවේවත් නොකරන වැඩ අපට කරන්ට බැහැ. නමුත් ඊට වඩා වැඩක් අපි කර තිබෙනවා.

එදා ඔය කියන අශ්ව විශ්ව විද්‍යාලයවත් නොපිහිටෙව්වා නම් 3,000 ක් ශිෂ්‍යයන් මොනම විශ්ව විද්‍යාලයක්වත් නැතුව අතරමං වෙනවා. ඒ අයට ඉඩකඩ සලසා දුන්නේ අපියි. මීට කලින් ආණ්ඩු කළ විරුද්ධ පාර්ශ්වයේ උදවිය දුරදිග බලා ක්‍රියා කර තිබෙන බවක් පෙනෙන්නේ නැහැ. විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන අය යන්නේ කොහාටද කියාවත් මා එන විට ඒ අය කල්පනා කර තිබුණේ නැහැ. අන්තිමේදී ශිෂ්‍යයන් ඇවිත් කිව්වා කොහේ නමුත් අපට තැනක් සොයා දෙන්ටය කියා. ඇමතිතුමනි, කානුවල ඉඳලාවත් අපි දේශනවලට සවන් දෙන් නම්; අපට දේශන පමණක් ලබා ගැනීම පිණිස තැනක් සලස්වා දෙන්ට" කියා ඒ ශිෂ්‍යයන් මට කියා සිටියා. ඉන් පසුව තමයි, එතන සකස් කළේ.

මා සිතනවා දැන් කරුණු අවබොධ වෙන්නට ඇතෙයි කියා. මගේ කථාව මෙයින් අවසාන කරනවා.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්සිටුවන ලදි.**

அப்போது பி. ப. 8 மணியாகிவிடவே சபையின் நடவடிக்கைகள் இடைநிறுத்தப்பட்டன.

*It being 8 P.M., Business was interrupted.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල්තැබීම

## ஒத்திவைப்பு

## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු ඊරියගොල්ල].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக".—[கௌரவ ஈரியகொல்ல] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed.*

"That the House do now adjourn".—[*The Hon. Iriyagolle*].

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

මා ප්‍රශ්න දෙකක් ඇසීමට කල් දී තිබෙනවා. ඊයේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) කීවා දයා අල්විස් නමැති වෘත්තීය සංගමිකයකු මාරු කිරීම පිළිබඳව. මටත් අද ඒ වාගේම සිද්ධියක් ප්‍රථමකොට මතක් කරන්ට සිදු වී තිබෙනවා. ලංකා ඛනිජ තෙල් සේවක සංගමයේ කාරක සභාවේ සභිකයකු වන ඇල්ෆ්‍රඩ් පෙරේරා මහත් මයා පසුගිය අවුරුදු එකහමාර තුළ හතර වතාවක් මාරු කර තිබෙනවා. ඔහු ඒ කාලය තුළදී යාපනයට අනුරාධපුරයට සහ ගාල්ලට යවා තිබෙනවා. අන්තිමේ මීට මාස තුනකට පමණ පෙර යන්තම් කොළඹට ආවා. ඊළඟට යැව්වා චීන වරායට. මේ පිළිබඳව ඇමතිවරයාට කරුණු කීවාට පසු දැන් රත්නපුරයට යවා සිටිනවා. ඒ මහත්මයාට දරුවන් සය දෙනකු සිටිනවා; තිදෙනෙක් පාසැල් යනවා. මේ ආදී කරදර ඒ මහත්මයාට තිබෙනවා. විශේෂයෙන් වෘත්තිය සමිති නායකයන් මේ විධියට අවුරුදු එකහමාරක් ඇතුළතදී හතර පස් පොළකට මාරු කර යැවීම ඉතාම අසාධාරණයි. මා දැන් මෙහි සිටින ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මෙම කාරණය ඒ පිළිබඳ ගරු ඇමතිතුමාට දැනුම් දෙන ලෙස.

**ගරු ඊරියගොල්ල**
*(கௌரவ ஈரியகொல்ல)*
(The Hon. Iriyagolle)

නම මොකක්ද?

**ඉලංගරත්න මයා.**
*(திரு. இலங்கரத்ன)*
(Mr. Ilangaratne)

නම ඇල්ෆ්‍රඩ් පෙරේරා. ඔහු ලංකා ඛනිජ තෙල් සේවක සංගමයේ කාරක සභිකයෙක්.

තවත් කරුණක් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. අදාළ පාර්ලිමේන්තු ලේකම් තුමා නම් දැනට මේ ස්ථානයේ නැහැ. කොළොන්නාව ආසනය තුළ ගෙවල් කුලී පාලන කාරක සභා 3 ක් පත් කරන්නය කියා මා ඉල්ලා සිටියා. එහෙත් පත් කර තිබෙන්නේ එකයි. කොළොන්නාවට පත් කර තිබෙනවා. කොටිකාවත්තට හා මුල්ලේරියාවට පත් කර නැහැ. කරුණා කර ඒ දෙකත් පත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

**එස්. ඒ. පීරිස් මයා. (වාණිජ හා වෙළඳ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. எஸ். ஏ. பீரிஸ்—வர்த்தக, வியாபார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. S. A. Peeris—Parliamentary Secretary to the Minister of Commerce and Trade)

Mr. Alfred Perera is being transferred from the Operations Division to the Ratnapura Bulk Depot. He is not a trade union official. He is a committee member of the union.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 8.03 ට, අද දින සභා සම්මතිය අනුව, 1967 ජූලි 25 වන අඟහරුවාදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

அதன்படி பி. ப. 8.03 மணிக்கு, சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 1967 ஜூலை 25ஆம் தேதி செவ்வாய்க்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 8.03* P.M. *until 2* P.M. *on Tuesday, 25th July 1967, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කලින් එවිය යුතුය.

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months. Each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org